බැඳ ගනිමිනි. ඇය විසින් රචිත 'The Naughtiest Girl Keeps a Secrect' නම් කතාව 'දඟමල්ල රහසක් රකියි' යනුවෙන් මෙලෙස සිංහලයට පරිවර්තනය වේ.

තනි කතාවක් ලෙස නො ව වෙන් වෙන් ව කියවා රස විඳීමට හැකි මේ පොත් පෙළ කියවීමට මම ඔබට ආරාධනා කරමි.

යොවුන් ලේඛිකාවක් වන මාගේ පළමු වන පරිවර්තනය වන මෙය සාර්ථක කර ගැනීමට නන් අයුරින් සහාය වූ සියලු ම දෙනාට මම මාගේ හද පිරි ස්තුතිය පුද කරමි.

නවක ලේඛිකාවක වන මා මත සම්පූර්ණ විශ්වාසය තබමින් මේ පොත ප්‍රකාශනය කිරීමට භාර ගත් විජේසූරිය පාඨක පදනමේ අධිපති සරත් විජේසූරිය මහතාට මාගේ විශේෂ ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි.

අවසාන වශයෙන්, මේ පෙරවදන කියවමින් සිටින පාඨක ඔබ මාගේ ලේඛන හැකියාව ගැන දරන අදහස් උදහස් දැන ගැනීමට කැමැත්තෙමි. එතුළින් මගේ හැකියාවන් ඔප් නංවා ගෙන ඉදිරියේ දී වඩාත් හොඳ නිර්මාණ ඔබ වෙත ගෙන ඒමට මම බලාපොරොත්තු වෙමි.

අනුපමා ගයත්‍රි අමරකෝන්

9/B 3/94,
මත්තේගොඩ,
පොල්ගස්ඕවිට

## පටුන

| | | පිටුව |
|---|---|---|
| 1. | රීටා සහ විලියම් ගෙන් පණිවිඩයක් | 9 |
| 2. | එලිසබෙත්, පැට්‍රික් ගේ සිත රිද්දවයි | 17 |
| 3. | පැට්‍රික් පුංචි විහිළුවක් කරයි | 31 |
| 4. | ජෝන් එලිසබෙත්ට රහසක් කියයි | 47 |
| 5. | එලිසබෙත් තරහින් | 54 |
| 6. | ජුලියන් හෝඩුවාවක් සොයයි | 69 |
| 7. | එලිසබෙත් තීරණයක් ගනියි | 79 |
| 8. | රහසිගත ලියුමක් ලැබෙයි | 96 |
| 9. | රැස්වීම එලිසබෙත්ට දඬුවම් කිරීමට තීරණය කරයි | 105 |
| 10. | ඇරබෙලා ආයෙත් කරදර ඇති කරයි | 115 |
| 11. | නිවැරදි අවසානය | 131 |

www.sinhalaelibrary.com

# 1

## රීටා සහ විලියම් ගෙන් පණිවිඩයක්

"තාමත් හොඳට ම අව්වයි, නියමයි...!" තම මිතුරු ජුලියන් සහ පැට්‍රික් සමඟ පන්ති කාමරයෙන් පිටතට පැමිණෙමින් සිටි එලිසබෙත් කීවා ය.

පාසල් ඔරලෝසුවේ සවස හතර වැදුණි. වයිටලීෆ් පාසලේ එදිනට නියමිත පාඩම් වැඩකටයුතු එයින් අවසන් විය. පන්ති කාමරවලින් එක රොත්තට එළියට පැමිණි ගැහැනු සහ පිරිමි ළමයින් කොරිඩෝව දිගේ උස් හඬින් කෑකෝ ගසමින්, සිනාසෙමින් ඇවිද යන්නට වූහ. ඉක්මනින් සියල්ලන් ම පාසල් නිල ඇඳුම මාරු කර සවස තේ පානයට යනු ඇත. එයිනුත් පසු ව ග්‍රීෂ්ම සෘතුව සඳහා නියමිත ක්‍රීඩා කිරීමට යනු ඇත.

'වයිටලීෆ්වල හැමදාමත් කරන්න ඕන තරං දේවල් තියෙනවා.' එලිසබෙත් සිතුවා ය. ඇය දැන් පාසලට තදින් ම ආදරය කරයි. නිල නො වුවත් තව දුරටත් ඇයට ශිෂ්‍ය නායිකාවක් ලෙස ඉන්නට ඉඩ ලැබී තිබේ. මේ දිනවල එලිසබෙත්ට කරදර කිසිවක් ඇත්තේ ම නැත. ඇයට අමාරුවෙන් තරහ නො ගෙන ඉන්න වත්, වැඩකට නැති

www.sinhalaelibrary.com

මිතුරන්ට හිත කරදර කර ගන්න වත් වුවමනාවක් නො වී ය. ඒ එක්ක ම පැට්‍රික් හා ඇය ඉතා හොඳ යාළුවන් වෙමින් සිටියි. වාරය මුල දී ඔවුන් දෙදෙනා සිටියේ එකිනෙකාට වෛර කර ගනිමිනි.

"අවුරුද්දේ මේ කාලෙට මං හරි ම ආසයි!" එලිසබෙත් ජූලියන්ට කීවා ය. "අනේ මංදා කොහොම වෙනවා ද කියලා? ඒ වුණාට හැන්දෑව හරි ම දිගයි, එළියයි. මිනුම් දෙයක් කරන්න වුවමනාව ඇති වෙනවා. මේ තව ඩිංගකින් මං මගේ පාත්ති ටික බලන්න යන්න ඕනි, මගේ සලාද ගස්වලට වතුර ඕන වෙලා ඇති මේ වෙලාවට...."

"ඒ වුණාට ඊට කලින් ඔයා මං ටෙනිස් සෙල්ලම් කරනවා බලන්න එන්න ඕනි." පැට්‍රික් කතාව මැද්දට පනිමින් කීවේ ය.

එලිසබෙත් හිස වනා ඇය එන බවට පොරොන්දු වී, ඇගේ කතාවේ ඉතුරු කොටස කියන්නට වූවා ය.

"මං මෙහාට මුලින් ම කොච්චර වෛර කළා ද කියලා හිතන කොටත් පුදුමයි. මං ඒ දවස්වල මට පුළුවන් හැම දඟ වැඩක් ම කළා, මාව එහෙකොට ගෙදර යවයි කියලා හිතලා."

"ආ....! ඔය කියන්නෙ, ඔයා ඉස්කෝලේ දඟමල්ල වෙලා හිටපු කාලේ ගැන ද?" ජූලියන් ඇසුවේ ය. ඔහු ගේ දිලිසෙන කොළ පාට ඇස්වලින් විස්මයට පත් වූ බවක් දිස්විය. "අපරාදේ මටත් ඒ කාලේ මෙහෙ ඉන්නයි තිබුණේ, පව් අසරණ එලිසබෙත්, ඔයා නුහුත් මහන්සි වෙන්නැති හොඳ ළමයෙක් වෙන්න ඊට පස්සෙ."

"ඇත්තට ම මං හොඳ ළමයෙක් වුණා තමයි." එලිසබෙත් තදින් පැවසුවා ය.

"එයා මොනිටර් කෙනෙක් වෙන්නෙ නෑ නෙ එහෙම නැත්නම්." පැට්‍රික් ඔහු ගේ අදහස ඉදිරිපත් කළේ ය. "මෙහෙට මුල දී ම වෛර කරන එක එච්චර ම අමුතුත් නෑ. මං බලන්න, සති කීපයකට කලින් මට මේ ඉස්කෝලේ පේන්න බෑ!"



එය සැබෑවකි. ජූලියන් ගේ ඥාති සොහොයුරා මේ වාරයේ පාසලට අලුත් සිසුවෙකි. සොහොයුරන් දෙදෙනා බාහිර පෙනුමෙන් නිවුන්නු මෙන් වුවත් ගතිගුණවලින් දෙදෙනා අහසට පොළොව මෙන් ය. හැම දේකට ම අභිදක්ෂයෙක් වූ ජූලියන්, ඒ නිසා ම, ජීවිතයෙන් පිරුණු විහිළු තහළුවට බර, ආත්මවිශ්වාසයෙන් යුතු සිසුවෙකි. ඔහු කවදාක වත් එලිසබෙත් මිශ්‍ර නායිකාවක් වීම ගැන කරදර නො වුණේ ය. අනෙක් අතින් පැට්‍රික්, පාසලට පැමිණි මුල් දිනවල සිටියේ දුම්මල ගෙන ය. ඔහුට ආත්මවිශ්වාසයක් නො වී ය. ගැහැනු ළමයකු තමන්ට කළ නො කළ යුතු දේවල් කීම ඔහු තදින් ම නො රිස්සුවේ ය.

"ඒ වුණාට ඔයා දැන් මෙහාට ආසයිනේ. එහෙම නේද පැට්‍රික්?" එලිසබෙත් ඇසුවා ය.

"ඉස්කෝලේ ගෑනු ළමයි ඉන්න එකත් හිතුව තරම් නරක නෑ. එහෙම නේද?" ජූලියන් එලිසබෙත්ට පේන්න ම මුණ ඇද කරමින් කීවේ ය. "ඒත් එක්ක ම, අද හවස තියෙන ටෙනිස් මැච් එක දින්නොත්, ඔයාට ඉස්කෝලේ ටෙනිස් ටීම් එකට සෙල්ලම් කරන්නත් පුළුවන්. මේක නම් නියම පටන් ගැනීමක්."

"ඔව්, නරක නෑ." පැට්‍රික් ගේ මුහුණ ඇති වූ සතුට නිසා රතු විය. "ඔය දෙන්න ම අමතක නො කර එන්න, හරි ද? මට ඔයගොල්ලන් ගේ උදවු ඕනා."

"හරි! අපි ඇවිත් ඔයාට චියර් කරන්නම්." උස් කටහඬක් ඔවුන්ට පිටුපසින් කොරිඩෝවෙන් ඇසුණි. ඒ ඇරබෙලා බක්ලි ය. ඇය සහ ඇගේ යෙහෙළිය රෝස්මරි ඔවුන්ට පිටුපසින් කොරිඩෝව දිගේ එමින් සිටියහ. "අපි ඇවිත් අනිවාර්යයෙන් ම ඔයාට චියර් කරන්නම්. එහෙම නේද රෝස්මරි?"

"ඔව් ඇත්තට ම අපි එනවා!" තම මිතුරිය වන ඇරබෙලා කියන කියන හැම දේකට ම ඔව් කියන දුර්වල රෝස්මරි පිළිතුරු දුන්නා ය.

www.sinhalaelibrary.com

"අපි හවසට එන්නම් පැට්‍රික්," එලිසබෙත් සෙමින් කීවා ය. "ඔයාට ඒක කරන්න පුළුවන්, මට හොඳට ම විශ්වාසයි ඔයා රොජර් ව පරද්දනවා කියලා."

රොජර් බ්‍රවුන් යනු ඔවුනට වඩා වසක් වැඩිමහල්, මහත දෙහෙන සිසුවෙකි. තමුත් ඔහු ටෙනිස් ක්‍රීඩාවට කැපී පෙනෙන දක්ෂතා නම් නො පෙන්වී ය. කෙසේ වුවත් ඔහු ගේ තැන ගන්නට තරම් දක්ෂ සිසුවෙක් මේ වන තෙක් පාසලේ නො වූ නිසා පාසල් කණ්ඩායමේ ක්‍රීඩා කිරීමට ඔහුට හැකි වී තිබිණි.

පැට්‍රික් ක්‍රීඩා කරන විලාසයත්, ඉතා මහන්සි වී උනන්දුවෙන් පුහුණුවීම්වල යෙදෙන අයුරුත් මිස්ටර් වර්ලේ හෙවත් පාසලේ ක්‍රීඩා උපදේශකතුමා දැක තිබිණි. ඒ නිසා ම ඔහු මේ ටෙනිස් තරගය සූදානම් කළේ ය. අද සවස තේ පානයෙන් පසු ව, රොජර් සහ පැට්‍රික් එකිනෙකාට එරෙහි ව තරග කිරීමට නියමිත ය. අද පැට්‍රික් හොඳින් ක්‍රීඩා කර රොජර් ව පරාජයට පත් කළ හොත් පාසල් කණ්ඩායමේ රොජර්ට තිබූ තැන පැට්‍රික්ට ලැබෙන බව සියල්ලන් ම දැන සිටින කාරණයකි.

"අද සෙල්ලම් කරන්න ඔයා ගේ අර විශේෂ රැකට් එක ඕන වෙයි, පැට්‍රික්," ජූලියන් කීවේ ය. "අපේ එලිසබෙත් දගමල්ලට නම් ඒක තියෙන පලාතකට වත් එන්න දෙන්න එපා, දන්නවා නෙ ඉතින් එයා ගේ හැටි."

එය කියද්දී ජූලියන් ගේ මුහුණේ විහිළුවක ඉරියව්ව නො වූයෙන් එලිසබෙත් ගේ හිත පෑරුණි.

"ජූලියන් හොලන්ඩ්, ඔයා ඔය එපා කරපු කතාමයි කියන්නේ."

කලින් වතාවක එලිසබෙත් හදිසියෙන් පැට්‍රික් ගේ ටෙනිස් පිත්ත පඳුරකට විසි කර දමා යාමෙන් එය වැස්සට තෙතබරියන් විය. ඇය දැන් ඒ ගැන මතක් කිරීමට වත් කැමති නො වූවා ය.



නො සන්සුන් සත්ත්වය සමනය කිරීමට මැදිහත් වූයේ පැට්‍රික් ය. "හරි, හරි! බය වෙන්න එපා, මං ඒක හොඳට පරිස්සම් කර ගන්නම්කෝ." ඔහු සිනාසුණේ ය.

එවිට එලිසබෙත් ද කිසි දු අමනාපයකින් තොර ව සිනාසුණා ය. නැවතත් සියල්ල තිබූ ලෙසට ම සන්සුන් විය.

තේ පානයේ දී, එලිසබෙත් තමා ගැන ම විහිළුවක් කළා ය.

පැට්‍රික් ටෙනිස් ඇඳුම්වලට මාරු වී ඔහු ගේ ටෙනිස් පිත්ත ද රැගෙන තේ මේසයේ දී එලිසබෙත් හා එක් වූයේ ය.

"අද මං දිනනොත් ඒ ඉතින් මේ රැකට් එක නිසයි, මේක තමයි මගේ ලක් එක," ඔහු ජෝන්ට කීවේ ය. "වෙන කිසි ම රැකට් එකකින් මට හොඳට සෙල්ලම් කරන්න බෑ."

"එහෙනම් ඉතින් මං ඉන්න පැත්ත පලාතක වත් ඕක තියන්න එපා පැට්‍රික්," එලිසබෙත් කීවා ය. "ඕක පුටු කකුලකට තියලා ඉබිමෙන් දාන්න, දන්නවානෙ ඉතින් මගේ හැටි." සියල්ලෝ ම ඇගේ විහිළුවට සිනාසුණහ. තම මිතුරිය විහිළු ඉතා තදින් සිතට නො ගැනීම ගැන සතුටු වූ ජූලියන් එය අගය කරන්නට ඇගේ අත කෙනිත්තුවේ ය.

ඇරබෙලා ඇගේ පියකරු මුහුණ පැට්‍රික් දෙසට හරවා සිනාසී "වෙලාවේ හැටියට ඒක නම් එච්චර ඇගට ඇණෙන විහිළුවක් නම් නෙවෙයි. එහෙම නේද පැට්‍රික්?" යැයි පැවසුවා ය.

එලිසබෙත් කෝපයෙන් දත්මිටි කෑවා ය.

ඇරබෙලා ගැන ඇති වූ කෝපය නිසා ඇයට අපහාස කිරීමට එලිසබෙත් යමක් සිතද්දී ම, හුරු පුරුදු කටහඬකින් යමකු තමාට කතා කරනු ඇයට පිටුපසින් ඇසිණි.

"එලිසබෙත්...?"

"ආන්, ජොවැන්!" එලිසබෙත් පිටුපස හැරී බලමින් කීවා ය.

ඕනෑ ම මොහොතක තම හොඳ ම මිතුරිය වන ජොවැන් දැකීම එලිසබෙත්ට සතුටට කාරණයක් විය. ජොවැන් එලිසබෙත්ට වඩා වැඩිමහල් වීමත්, ඉගෙනීමට දක්ෂ වීමත් නිසා ඇයට ඉක්මනින් දෙවැනි පන්තියට යාමට

www.sinhalaelibrary.com

අවසරය ලැබුණි. තමාත් ඉතා හොඳින් පාඩම් වැඩවල නියැළී හොඳ ප්‍රතිඵල ලබා ගත හොත් ලබන සැප්තැම්බර් මාසයේ සිට ජොවැන් සමඟ එක ම පන්තියේ ඉගෙනීමට තමාට හැකි බව ඇය දැන සිටියා ය. තමා සමඟ දිගු කාලයක් පළමු පන්තියේ සිටි මිතුරිය නිසැර මුණ ගැසීමට නො හැකි වීම ගැන ඇය දුක් වූවා ය. ඒ නිසා ම එලිසබෙත් අදිටන් කර ගෙන සිටින්නේ හැකි තරම් ඉක්මනට ම දෙවැනි පන්තියට යාමට ය.

"මට ඔයාට දෙන්න පණිවිඩයක් තියෙනවා." ජොවැන් සෙමින් කීවා ය. ඇය හැම වෙලේ ම කතා කරන්නේ ඉතා ම සෙමිනි. "පණිවිඩේ විලියම්ගෙනුයි, වීටාගෙනුයි. හවස තේ වෙලාවෙන් පස්සේ ඇවිත් ඒගොල්ලන් ගේ පාඩම් කාමරේ දී ඒ දෙන්නා ව හමු වෙන්න කිවුවා."

එලිසබෙත් ගේ ඇස් විස්මය නිසා ලොකු විය. විලියම් සහ වීටා යනු වයිටලීෆ් පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායකයා සහ නායිකාවයි.

"ඔයත් එනවා ද ජොවැන්? අනෙක් මොනිටර්ස්ලාත් එනවා ද?" එලිසබෙත් ඇසුවා ය. ඊළඟ දින දෙක තුනකට වත් පාසල් රැස්වීමක් යෙදී නො තිබුණ නිසා ඇයට මෙය මහත් ප්‍රහේලිකාවක් විය.

සාකච්ඡා කිරීමට ඉතා වැදගත් කාරණාවක් තිබුණ හොත් පමණක්, සාමාන්‍යයෙන් සතියකට වරක් පැවැත්වෙන ශිෂ්‍ය රැස්වීමට අමතර ව ශිෂ්‍ය නායක නායිකාවන්ට පමණක් හදිසි රැස්වීමක් කැඳවනු ලබයි. වයිටලීෆ් පාසලේ සතිපතා පැවැත්වෙන රැස්වීමට සහභාගි වීම සැම ශිෂ්‍ය ශිෂ්‍යාවකට ම අනිවාර්ය වුණු දෙයකි. එය ළමා පාර්ලිමේන්තුවක් බඳු විය. වයිටලීෆ් පාසලේ සැම නීතිරීතියක් ම ශිෂ්‍ය-ශිෂ්‍යාවන් විසින් ම සාදන ලද ඒවා වූ අතර ඒ නීති නිවැරදි ව පිළිපදී ද නැද්ද යන්න ද ඔවුන් විසින් ම නිරීක්ෂණය කරනු ලබයි. නමුත් මේ අතරින් වැඩි වගකීමක් ශිෂ්‍ය නායක නායිකාවන්ට පැවරී තිබේ. පාසලේ



ප්‍රශ්නවලට ගුරුවරුන් ගේ මැදිහත් වීම සිදුවන්නේ කලාතුරකිනි. මෙතෙක් කල් මේ ක්‍රමය වයිටලීෆ් පාසලට ඉතා හොඳ ප්‍රතිඵල ලබා දී තිබෙන අතර ඉදිරියටත් එය එසේ ම වනු ඇත.

"නෑ, ඒගොල්ලන්ට ඕන ඔයා විතරයි," ජොවැන් කීවා ය.

"මොකක් ද කාරණේ කියන්න මං නම් දන්නෑ එලිසබෙත්."

එලිසබෙත් කඩිමුඩියේ තේ කෝප්පය අවසන් කිරීමට උත්සාහ කළා ය. ඒ අතරතුර ඇගේ සිතට පැමිණි එක ම කාරණය වූයේ විලියම්ට හා වීටාට තමාට පැවසීමට ඇත්තේ කුමක් ද යන්න ය.

"අයියෝ...! මොනිටර් මෙහෙම කෑම ගිලින්න එපා. ඔයා අනෙක් අයට ආදර්ශයක් වෙන්න ඕන නේද?" ජූලියන් විහිළු කළේ ය.

"අනේ ඔයා හිතනවා ද විලියමුයි, වීටයි ඔයා යන්න කලින් අතුරුදන් වෙයි කියලා, කවුරු හරි මන්තරයක් වත් මතුරලා. ඔය වෙන්න එපා ඒගොල්ලෝ ඔයා එනකම් එතැන ඉඳියි." ජූලියන් නො සැලකිලිමත් ව කීවේ ය.

"එලිසබෙත්, ඔයාට ඔය තම්බපු බිත්තරේ ඉක්මනට කන්න අමාරු ම නම්, මං ඔයාට උදව්වක් විදිහට ඒක කරන්නම්. හැබැයි ඉතින් ඔයා කැමති නම් විතරයි." ඇගේ යෙහෙළිය කැත්ලීන් කීවා ය. සියල්ලන් ම සිනාසුණ අතර කැත්ලීන් ද සිනාසුණා ය.

"ඔයා ඇත්තට ම කැමති ද?" විහිළුව ගැන හරිහැටි අවධානයකින් නො සිටි නිසා එය හරිහැටි නො තේරුණු එලිසබෙත් ස්තුතිපූර්වක බැල්මක් හෙළමින් පැවසුවා ය. "අද මට කෝස්සි තෝනා යොවක් බෙදලා වගෙයි, ඔයා මේක කනවානම් මට ඉක්මනට ගිහින් බලන්න හැකි ඇයි ඒගොල්ලෝ මට එන්න කිවුවේ කියලා. මේ දවස්වල මං මුකුත් දඟ වැඩක් කළේ නම් නෑ. එහෙම නේද කැත්ලීන්?"

www.sinhalaelibrary.com

පිඟාන මත ඉතිරි වී තිබෙන චොක්ලට් බිස්කට් කිහිපය සාක්කුව තුළට රුවා ගත් එලිසබෙත් මේසය සකස් කර පුටුව ඉක්මනින් පිටුපසට තල්ලු කර යන්නට නැගිට්ටා ය.

"ඔයා මොකක් හරි දඟ වැඩක් කළා නම් ඒක දැන ගන්න රැස්වීම එනකම් ඉන්න ඕනි නෑ එලිසබෙත්." ජූලියන් සිනාසෙමින් කීවේ ය. "මුළු ඉස්කෝලෙ ම ඔයාටත් කලින් ඒක දැන ගනීවි. මෙහේ හැටි ඔයා දන්නවානේ. පස්සෙ හම්බ වෙමු එහෙනම්."

"ඔයා ඉවරවෙච්ච ගමන් ම කෙළින් ම ටෙනිස් පිට්ටනියට එන්න." පැට්‍රික් එකතු කළේ ය. "මං ඉක්මනට ම සෙල්ලම් කරනවා."

ශාලාවෙන් පිටතට කඩිමුඩියේ දිව යන එලිසබෙත්ට ඒ කිසිවක් නෑසුණි. ශාලාවේ සිටි අනෙක් ළමයින් ගේ කෑකෝ ගැසීම්වලට පිරිමි ළමයින් දෙදෙනා ගේ කටහඬවල් යටපත් විය. ඒ මොහොතේ පවා එලිසබෙත් නම් සිතමින් සිටියේ එක ම කාරණාවකි.

ප්‍රධාන ශිෂ්‍ය නායකයා සහ නායිකාව තමාට තනි ව ම විත් ඔවුන් මුණ ගැසෙන ලෙස කීවේ කුමක් සඳහා ද?

# 2

# එලිසබෙත්, පැට්‍රික් ගේ හිත රිද්දවයි

"ඇතුළට එන්න." එලිසබෙත් පාඩම් කාමරයේ දොරට බියාදු ලෙස තට්ටු කරනු ඇසී විලියම් කීවේ ය.

කාමරය ජනේලය තුළින් ඇතුළට එන සෞම්‍ය හිරු එළියෙන් ආලෝකවත් ව ජීවයෙන් පිරී තිබුණි. විලියම් සහ රීටා ඔවුන් ගේ අත්පුටුවල වාඩි වී සිටියහ.

රීටා ඇයට ඉදිරියෙන් වූ අමුත්තන් සඳහා වූ අත්පුටුව පෙන්වූවා ය. "වාඩි වෙන්න, එලිසබෙත්." එලිසබෙත් සමඟ සිනාසෙමින් කරුණාවන්ත ලෙස රීටා කීවා ය.

විලියම් සිටියේ ද සිනාසෙමිනි.

මේ සියල්ල නිසා වේගයෙන් ගැහෙමින් තිබූ පුංචි ගැහැනු ළමයා ගේ හදවත නැවතත් සන්සුන් වන්නට විය. සුව පහසු අමුත්තන් ගේ ඇඳි පුටුවේ ඇය හරිබරි ගැසී වාඩි වූවා ය.

"අපිට ප්‍රශ්නයක් ඇති වෙලා තියෙනවා," විලියම් පැහැදිලි කළේ ය. "අපි මේක ගැන මිස් බෙල්ලා එක්කත් කතා කළා. හරියට ම තීරණේකට එන්න අපිට බැරි වුණා. අපි දැන් කැමතියි මේක ගැන ඔයා ගේ අදහසුයි තීරණයයි දැන ගන්න."

www.sinhalaelibrary.com

මිස් බෙලා! එලිසබෙත් ගේ හදවත අමුතු ආඩම්බරයකින් පිම්බුණි. මිස් බෙලා සහ මිස් බෙස්ට් යනු වයිට්ලීෆ් පාසලේ ප්‍රධාන ගුරුමහත්මීන් ය. ළමයින් ඔවුන් ව හැඳින්වූයේ 'බියුටි ඇන්ඩ් ද බීස්ට්' ලෙස ය. ඇත්තෙන් ම, ඒ නම එලිසබෙත් ගේ නිර්මාණශීලිත්වයේ ප්‍රතිඵලයකි.

පුංචි ගැහැනු ළමයා කල්පනා කරන්නට වූවා ය. මිස් බෙලා මේ ප්‍රශ්නෙ විසඳගන්න උදවු වෙලා තියෙනවා නම් මේක ගොඩක් බරපතළ ප්‍රශ්නයක් වෙන්න ඕනි, ඒ වගේ වෙලාවක පුංචි එලිසබෙත් ගේ අදහස් දැන ගන්න බලා ගෙන ඉන්නවා...!

ඇය කල්පනා කරමින් සිටින අතර මේ ප්‍රශ්නයට ඉක්මනින් විසඳුමක් ලබා ගත යුතු යැයි සිතූ විටා කතාව ආරම්භ කළා ය. "කාරණේ තමයි, අපිට ඇත්තට ම මොනිටර්ස්ලා දහතුන් දෙනෙක් තියා ගන්න අමාරුයි." ඇය කීවා ය. "වයිට්ලීෆ් ඉස්කෝලේ හැම දා ම සම්ප්‍රදාය වුණේ මොනිටර්ස්ලා දොළොස් දෙනෙක් ඉන්න එක. අලුත් වාරේ ඉඳලා අපේ ඔක්කොම මොනිටර්ස්ලා ගාණ එක්කෙනෙක් ගෙන් වැඩි වෙලා තියෙනවා. ඒ වුණාට වේදිකාවේ පුටු දොළහක් තියන්න හොඳට ම ඉඩ මදි, කෙලවරේ ම ඉන්න එක්කෙනා හැම දා ම ඉන්නෙ අඩමානෙට පුටුව තියා ගෙන. ඒක හරි ම අවදානම් වැඩක්. ඔයා ඒක දැකලා තියෙනවා මං හිතන්නෙ එලිසබෙත්."

එලිසබෙත් එය දැක තිබුණු නිසා හිස සොලවමින් විටා සමඟ එකඟ වූවා ය.

මේ ප්‍රශ්න සියල්ලක් ම පාහේ ඇති වූයේ පසුගිය වාරයේ ඇති වූ වැරදි වැටහීම නිසා ය. එයින් වූයේ ඇයට පාසල් ශිෂ්‍ය නායිකා තනතුර අහිමි වීම ය. ඇය ඉවත් කිරීමෙන් ඇති වූ අඩුව පිරවීමට දෙවන පන්තියේ සිසුවියක් වන සුසන් ළමයින් ගේ ඡන්දයෙන් තෝරා ගන්නා ලදී. නමුත් වාරය අවසානයේ දී, ඇති වූ වැරදි වැටහීම සියල්ල අනාවරණ වී ප්‍රශ්න සියල්ල ම විසඳී එලිසබෙත් ගේ නිදොස් බව



ඔප්පු විය. ඒ නිසා එලිසබෙත් ගැන වූ ළමයින් ගේ විශ්වාසය නැවත ඇති වුණ නිසාත්, පන්තියේ ළමයින් ගේ දැඩි ඉල්ලීම නිසාත් ඇයට නැවතත් නැති වූ තනතුර ලබා දීමට තීරණය කෙරුණි. නමුත් ඒ අමතර නායිකාවක් වශයෙනි.

"කාලෙකට සැරයක් වත් අපිට අමතර මොනිටර් කෙනෙක් ඉන්න ඕන." පසුගිය වාරයේ මිස් බෙලා එසේ පවසා තිබුණි. ඇය දැන සිටියා, නො සැලකිලිමත්කම නිසා සිදු වූ වැරදි හරිගස්සවා ගෙන නැවතත් කීකරු, බුද්ධිමත් හා සංවේදී ශිෂ්‍ය නායිකාවක් වීමට එලිසබෙත් තුළ තද ආශාවක් තිබුණු බව. මිස් බෙලා ඒ තීරණය ගත්තේ ඒ නිසා ම ය.

"අමතර මොනිටර් කෙනෙක් ඉන්න එක හොඳ අදහසක් විදිහට ඒ දවස්වල අපිට හිතුණා." විටා දිගට ම කතා කළා ය. "දැන් තියෙන ප්‍රශ්නෙ නිසා අපි මිස් බෙලා එක්ක මේ ගැන කතා කළා. අපි තීරණය කරා අමතර මොනිටර් තනතුර ස්ථිර එකක් විදිහට තියා ගන්න බැ කියලා." විලියම් එලිසබෙත් දෙස එක එල්ලේ බලා සිටියේ ය.

"අපි කල්පනා කරන්නෙ, මේ ප්‍රශ්නෙට විසඳුමක් හැටියට, සුසන්ට මොනිටර්කමෙන් අයින් වෙන්න කියනවා ද නැද්ද කියලා? ඔයා මේ ගැන මොනා ද හිතන්නෙ එලිසබෙත්?"

"එපා සුසන්ට ඒක සාධාරණ නෑ!" පැකිළීමකින් හෝ පටලැවීමකින් තොර ව එලිසබෙත් වේගයෙන් කතා කළා ය. "එයාට තව ම ටික දවසක් වත් මොනිටර් කෙනෙක් විදිහට වැඩ කරන්න හම්බ වුණේ නැහැනේ හරි විදිහට ඉස්කෝලේ නීතිවලට අනුව මුළු ඉස්කෝලෙ ම ළමයින් ගේ ඡන්දෙන්නෙ එයා ව තෝරා ගත්තේ..."

ඇගේ කටහඬ බිඳුණි. වෙන්න යන දේ ඇයට ඉවෙන් මෙන් වැටහිණි. උගුරේ යමක් හිර වී ඇති සේ ඇයට දැනෙන්නට විය. වෙන කිසි ම විසඳුමක් නො වී ය.

"මට අත්වෙන්න දෙන්න." දුර්වල ලෙස සිනාසී ඇය පැවසුවා ය. "මට ලැබිච්ච අවස්ථාව හොඳට ම ඇති. මට ඕන වුණේ හොඳ මොනිටර් කෙනෙක් වෙලා අනෙක් අයට ආදර්ශයක් වෙන්න..."

"ඔව්. ඔයා මොනිටර් කෙනෙක් විදිහට හොඳට වැඩ කරලා තියෙනවා." රීටා කීවා ය.

"හොඳ ළමයා." විලියම් ඉතා සෞම්‍ය ලෙස කීවේ ය. "ඔයාට හොඳට ම විශ්වාස ද මේ තීරණේ ගැන, එලිසබෙත්? අපට ඕන නම් සුසන් එක්ක මේ ගැන කතා කරන්න පුළුවන්. සුසන්ට මොනිටර් කෙනෙක් වෙන්න හම්බුණේ අපි ඔයා ගැන වැරදියට තීරණය කරලා ඔයා ව අයින් කරපු හින්දනේ."

"මට හොඳට ම විශ්වාසයි." ඉතා ආයාසයෙන් ඇති කර ගත් නිර්භීත සිනහවකින් ඇය පැවසුවා ය. ඇයට දැන් වුවමනා වූයේ මෙතැනින් පැන යාමට ය. හැකි තරම් ඉක්මනින් පැන යාමට ය.

"හරි ම හොඳයි, එලිසබෙත්. අපිට ඔයා ගැන ආඩම්බරයි." රීටා කීවා ය.

"මේ සතියේ රැස්වීමේ දී විලියම් මේක නිවේදනය කරයි, එහෙනම්."

එලිසබෙත් කාමරයෙන් පිට වූ අතර විලියම් ඇය යන තෙක් දොර වැසීමට නො දී අල්ලා ගෙන සිටියේ ය. ඇය පිට වෙද්දී විලියම් ඇගේ පිටට තට්ටු කළේ ය. "කවදා හරි දවසක ඔයා ආයෙත් මොනිටර් කෙනෙක් විදිහට තේරෙයි, එලිසබෙත්, මට හොඳට ම විශ්වාසයි ඒක."

"බොහොම ම ස්තූතියි, විලියම්." ඇය නිහතමානී ලෙස පිළිතුරු දුන්නා ය.

විලියම් හා රීටා ඉදිරියේ දී ඉතා සන්සුන් ව හා සංවේදී ව මේ අවස්ථාවට මුහුණ දීම ගැන ඇයට ඇය ගැන ම ආඩම්බරයක් ඇති විය. නමුත් පිටුපසින් කාමරයේ දොර වැසෙද්දී, ඇස්වලට ඉනුණු කඳුළුවලින් අන්ධයෙක් මෙන්



ඇයට දැනෙන්නට විය. ඇයට ඉකි ගසා හැඬීමට වුවමනා විය. ඇයට මේ සියල්ල අතහැර යාමට වුවමනා විය, කොහේ හෝ ගොස් සිතේ දුක නැති වන තෙක් තනි ම කෙනෙකුට නො පෙනෙන සේ හැඬීමට ඇයට වුවමනා විය. 'මට පස්සෙ මොනිටර් කෙනෙක් නෙමෙයි!'

මේ ඇති වූ කම්පනයෙන් ගැලවීමට නම් තනි ව ම කල්පනා කළ යුතු ය. යා යුත්තේ කොහාට ද? කවුරු වත් ම නැති පාළු නිස්කලංක තැනකට!

පාසලේ ගොවිපළ. තනි ව ම කල්පනා කිරීමට වුවමනා වූ හැම විටක ම තමා යන්නේ එතැනට බව එලිසබෙත්ට මතක් විණි.

ඇය වටපිට වත් නො බලා රූකඩයක් මෙන් පාසලේ ගොවිපළට ගොස් එහි කෙළවරේ ම වූ භාණ්ඩාගාරය තුළට රිංගා ගෙන එහි දොර වසා දැමුවා ය.

ඉන් පසු ව ඇය මේ වන තෙක් අමාරුවෙන් සිර කර ගෙන සිටි කඳුළුවලට වක්කඩ කැඩුවා සේ සම්මුල් දියේ ගලා යන්නට ඉඩ දුන්නා ය.

'ඒක හරි ම අසාධාරණයි!' ඇය ඉකි ගැසුවා ය. 'ඒක පොඩ්ඩක් වත් සාධාරණ නෑ!'

පැට්‍රික් ක්‍රීඩා කරන ටෙනිස් තරගය නැරඹීමට පැමිණෙන බවට දුන් පොරොන්දුව ඇයට සම්පූර්ණයෙන් ම අමතක වී තිබිණි. ඇගේ බලාපොරොත්තු සුන් වී තිබුණ නිසා ඇයට පැට්‍රික් ගේ බලාපොරොත්තු ගැන මතක් වූයේ ම නැත.

"හිතට දිරිය ගන්න එලිසබෙත් ඇලන්." ඇය ටික වෙලාවකට පසු තමාට ම කියා ගත්තා ය. "නිකං පොඩි බබෙක් වෙන්න එපා. ඔයා දන්නවා තියෙන එක ම සාධාරණ විසඳුම ඒක කියලා."

ඇය ලේන්සුව ගෙන පුළුවන් තරම් හොඳින් ඇස් පිසදා ගෙන තෙත් වූ ලේන්සුව සාක්කුව තුළට රුවා ගත්තා ය. ඉන් පසු ව ඇය භාණ්ඩාගාරයේ කවුළුව අසලට ගොස් ඉන් එබී ගොවිපළ තුළ සිටින්නේ කවුරුන් දැයි බැලුවා ය.

www.sinhalaelibrary.com

ඔහුන් කිහිප දෙනෙකුට වඩා එහි නො වී ය. ගොවිපළ බලා ගන්නා ජෝන් වෙරි නම් සිසුවා පවා එහි පෙනෙන මානයක නො වී ය. හොඳයි, ඇයට තව ම කිසි ම කෙනෙකුට මුහුණ දීමට වුවමනා නො වී ය. අඩු ම තරමින් ජෝන් වෙරිට වත්. ජෝන් වෙරි ඉතා කාරුණිකවන්ත ය. ඔහුට ළමයින් ව ඉතා හොඳින් තේරුම් ගැනීමට හැකි ය. එමෙන් ම ඔහු කිසි දවසක තරාතිරම බලා ළමයින්ට සලකන කෙනෙක් ද නො වී ය. තම ගොවිපළට ආදරය කළ ඔහු ගෙවතු වගාවට උපන් හපන්කම් ඇති සිසුවෙකි. ඔහු ගේ හොඳ ගතිගුණ නිසාදෝ තමා දන්නා හැම දෙයක් ම පාහේ අනෙක් අයට ඉතා හොඳින් කියා දීමට ඔහුට හැකියාව තිබිණි. ජෝන් වෙරිටත් ඔහුත් සමඟ වැඩ කරන අනෙක් ළමයිනුත් කොතරම් හොඳින් වගා කටයුතු කළේ ද යන්නට හොඳ ම සාක්ෂිය නම්, පාසලට මුළු අවුරුද්ද පුරා ම වුවමනා වූ අලුත් එළවළු සහ පලතුරු සියල්ල සැපයීමට ඔවුනු සමත් වීම ය.

ජෝන් කොතරම් හොඳ වුව ද, ඇයට දැන් වුවමනා වූයේ මේ සියල්ල අමතක කර දමා තනි ව ම සිත හදා ගැනීමට ය.

"එලිසබෙත්" ඇය තමාට ම කියා ගන්නා ය. "මේ සතියේ රැස්වීමෙන් පස්සෙ ඔයා මොනිටර් කෙනෙක් නෙමෙයි. ඒක හරි ම සාධාරණයි. ඒක ඔයා පිළිගන්න ඕනමයි!"

මෙහෙම දෙයක් වෙතැයි කලින් නො සිතීම ගැන එලිසබෙත්ට තමා ගැන ම කෝපයක් ඇති විය. වාරය ආරම්භයේ සිට ම සිසු රැස්වීම්වල දී අමතර ශිෂ්‍ය නායිකාව වෙනුවෙන් වේදිකාව මත වැඩිපුර පුටුවක් තැබීම ඔවුන් සියල්ලන් ම අපහසුතාවටත් කරදරයටත් පත් කළ කාරණාවක් විය.

'මට කලින් ම අයින් වෙන්නයි තිබුණේ! ඒත් කොහොම ද මොනිටර් කෙනෙක් වෙලා ඉඳලා අයින් වෙන්නෙ, ඒක



හරි ම විනෝදයක් නෙ. එලිසබෙත් සිතන්නට වූවා ය. පැස්බර කුරුල්ලෝ කරදරයක් ඇත එන කොට වැලි අස්සේ ඔළුව ඔබා ගන්නවා කරදරයක් නෑ කියලා හිතා ගෙන හිත හදා ගන්න. අන්තිමට දුර දිග බලන්නැතුව මෝඩ විදිහට හැසිරුණ නින්දා බේරිලා යන්න තිබ්බට කරදරේට ම අපරාදේ අහුවෙනවා. මාත් කරලා තියෙන්නෙ ඒ වගේ ම වැඩක්.'

"හැම හොඳ දෙයක් ම ඉවර වෙනවා එලිසබෙත්?" මිස් ස්කොට් ඇයට නිතර ම එසේ පවසා තිබිණි. "සමහර වෙලාවට ඒ දේවල් අපි හිතනවාටත් වඩා ගොඩක් ඉක්මනට ඉවර වෙනවා."

එලිසබෙත් කිසි දිනක මිස් ස්කොට් කියන වචනයකට වත් ඇහුම්කන් දුන්නේ නැත. ඇය කොතරම් නපුරු ගැහැණු ළමයෙක් ව සිටියා දැයි මතක් වීමෙන් ඇගේ මුහුණ හදිසියේ ම රතු විය. ඇය ඔවුන්ට කොයි තරම් නරක ලෙස කතා කර ඇත්ද. මිස් ස්කොට්ට පමණක් නො ව ඇයට පෙර ගෙදර දී ම ඇයට ඉගැන්වූ සියලු ම ගුරුතුමිය හට, පුදුමයක් නො වේ ඔවුන් එක් කෙනෙක් වත් එලිසබෙත්ට දිගු කාලයක් ඉගැන්වීමට කැමති වූයේ නැත. නමුත් එදා මිස් ස්කොට් පැවසූ සියලු ම දේවල් අද ඇත්ත වී ඇතැයි ඇයට දැන් වැටහිණි.

'ඒ වුණාට රීටා කිව්වා මං මොනිටර් කෙනෙක් විදිහට හොඳට වැඩ කළා කියලා. අනෙක විලියම් කිව්වා මට ආයෙත් අවස්ථාවක් ලැබෙයි කියලා.'

එලිසබෙත් ගේ දුක තුනී වෙමින් තිබිණි. හරිතාගාරය ඉතා උණුසුම් යැයි ඇයට හැඟුණ බැවින් ඇය හොඳ හරිතාගාරයේ දොර හොඳින් විවර කර ඒ අසලට වී ටික වේලාවක් එළිය බලමින් හිටගෙන සිටියා ය.

හිරු බැස යමින් තිබිණි. බ්ලැක් කරන්ට් පඳුරුවල දැවටෙන මඳ සුළඟ 'සර', 'සර' ශබ්දයක් ඇති කරමින් තිබියි. කොහේ හෝ සිට කවුඩු පක්ෂියෙකු ගී ගයනු

ඇගේ, එළුවන් පැත්තිවල අද්දර වැවී තිබෙන පොල්ලාවර් සෙව්වල මල් පිපී ඉතා මිහිරි සුවඳක් පතුරවයි. සමනලයන් මල් මත වසා සිට, 'ගුම්', 'ගුම්' නද දෙන මී මැස්සන් හා එකතුවූව මල් පැණි උරා බොමින් සිටියි.

වසා සිහින ලොවින් මිදුණු එලිසබෙත්ට ඇගේ චොක්ලට් බිස්කට් මතක් විය. ඒවා කදින් රත්වීම නිසා ඇලෙනසුලු වී තිබිණි. නමුත් ඇය සෙමින් සෙමින් එය කෑමට පටන් ගත්තා ය. අවසානයේ දී දිය වී ගිය චොක්ලට් ක්‍රීම්වලින් ඇගේ කට සම්පූර්ණයෙන් ම පිරී ගියේ ය.

'මොනිටර් කෙනෙක් වෙන එක ම හොඳයි නෙ ජීවිතේ කියන්නෙ.' ඇය තීරණය කළා ය. 'මට මං වෙනුවෙන් වැඩ කරන්න ගොඩක් වෙලාව තියෙයි. මං මහන්සි වෙලා උනන්දු වෙලා ගොඩක් දේවල්වලට දක්ෂ වෙනවා, මං හොඳට වැඩ කරන්න ඉගෙන ගෙන හොඳ වගාකාරියක් වෙලා හොඳ හොඳ දේවල් වවනවා.'

ජෝන් සහ කුඩා පිරිමි ළමයින් විසින් වවන ලද බෝංචි වගාවේ පේළි දිහා ඇය උනන්දුවෙන් බලා සිටින්නට වූවා ය. ඒවා ඉතා හොඳින් වැඩෙමින් තිබුණමුත් වල් ඉදිරීම ඉක්මනින් ම කළ යුතු බව ඇයට හැඟිණි.

මෙතෙක් කාලයක් පැළ වැවීම සඳහා එලිසබෙත් ගත් සෑම උත්සාහයක් ම කනගාටුදායක ලෙස අවසන් වී තිබිණි. ඒ ඇයට කෙතරම් උනන්දුවක් තිබුණ ද ඒවා හරිහැටි ඒක බලා ගැනීමට ඇයට අමතක වීම නිසා ය. නමුත් මෙවර සලාද පැළ වගාව නම් ඉතා හොඳින් වැවී තිබිණි. ඇය හරිතාගාරයේ දොර වසා සලාද පැළ වගාව බැලීමට ඒ දෙසට සෙමින් ඇවිද ගියා ය.

'ආ.... හා....; ඒවා හොඳට හැදිලා....!' දුර තියා ම වගාව දුටු ඇය පිම්මෙ ඒ දෙසට දුවන්නට වූවා ය.

සතියේ වියදමට ලැබී තිබුණ මුදල්වලින් කොටසක් ඇය ඇට ලබා ගැනීමට වියදම් කළේ ජෝන් පැවසූ ආකාරයට හොඳ ම තත්ත්වයේ ඇට පැළ කර ඉතා හොඳ



වගාවක් ලබා ගැනීමට ය. ඇය ඒ ඇට සකස් කරන ලද බිම් තීරුවල හොඳින් පැළ කර සතිපතා වල් පැලෑටි ගලවා දමා සාත්තු කරමින්, දුඹුරු සලාද කොළ පොළොවෙන් මතු වී වැඩෙන අයුරු සතුටින් බලා සිටියා ය. දැන් දැන් ඇයට හොඳ ප්‍රතිඵල ලැබෙමින් තිබෙයි.

සලාද පැළ ඉක්මනින් වැවී තිබිණි. සමහර ඒවා දැනටමත් ඇස්ක සලාද කොළවල පෙනුම ගෙන තිබේ. මේ වේගයෙන් ම වැඩුණ හොත් වාරය මැද වන විට ඒවා ගැලවීමට සුදුසු තත්ත්වයට පත් වනු ඇත. එසේ වුවහොත් ඇගේ සලාද කොළ පාසලේ ළමුන් ගේ ආහාරවල ද දක්නට ලැබෙනු ඇත. ඒ සිතුවිලි නිසා එලිසබෙත් ආඩම්බරයෙන් ඉපිලිණි.

'ඒ වුණාට ඒවට වතුර ඕනි, අසරණ පැළ. ගස් වගේ බිම ඔක්කොම වේළිච්ච පාටයි. මං ගිහින් වතුර අත කෑන් අරගෙන එන්න ඕනි.' එලිසබෙත් එසේ සිතමින් කෑන් තබා තිබූ කරාමය අසලට ඇවිද ගියා ය.

ගෙවතු බිමේ කරාමය අසල වතුර කෑන් දෙක පේළියට තබා තිබිණි. ඒවා පිරවීමට පෙර, එලිසබෙත් කරාමය ඇර ඇගේ අතට වතුර පුරවා ගෙන එයින් අතේ ගෑවී තිබුණ චොක්ලට් ක්‍රීම් සෝදා ගත්තා ය. මුහුණට වතුර ගසා ගත් ඇය මුහුණ ද පිරිසිදු කර ගත්තා ය. දැන් කිසි කෙනෙකුට ඇය කමින් සිටි බව දැන ගැනීමට නො හැකි වනු ඇත.

කෑන්වලට වතුර පුරවා ගත් ඇය සලාද පැළ වගාව අසලට ගියමුත් යමක් හදිසියේ මතක් වී නැවතුණා ය. කාලගුණය ඉතා උණුසුම් ය. ජෝන් වතාවක් කියා දුන් ආකාරයට වතුර දැමිය යුත්තේ පරිසරය උණුසුම් නොමැති වේලාවක දී ය. එනම් උදයේ හෝ සවස් කාලයේ දී ය.

ඒ නිසා එලිසබෙත් වතුර දැමීම නවතා ඒ වෙනුවට බෝංචි වගාවේ පේළි අතර තිබෙන වල් පැලෑටි උදුරා දැමීමට පටන් ගත්තා ය. එය සිරුරට වෙහෙසකර ව්‍යායාමයක් වුවත් ඇයට සුවදායී හැඟීමක් ඇති වෙමින්

www.sinhalaelibrary.com

සිටියා, වල් පැළෑටි උදුරා අවසන් වන විට ඇගේ සිත ද හොඳට ම සන්සුන් වී තිබිණි. පාසලේ අනෙක් ළමයින්ට මුහුණ දීමට දැන් තමාට හැකි යැයි ඇයට සිතුණි.

"ආයෙත් මොනිටර් කෙනෙක් නෙමෙයි කියන එකට දැන් මං ටික ටික පුරුදු වෙගෙනයි එන්නෙ." ඇය තමාට ම කියා ගත්තා ය. "මං දැන් ම මේක කාට වත් කියන්න හොඳ නෑ, රැස්වීමේ දී ම දැන ගන්නකම් ඉන්නවා. එතකොට මට තවත් කල් හම්බ වෙනවා නෙ හිත හදා ගෙන ඒකට මුණ දෙන්න. මං හිතනවා ජූලියන් නම් මට විහිළු කරයි කියලා, ඇරගෙලා මාව පල් නො කෙරුවොතින් හොඳයි."

පරිසරයේ උණුසුම් බව අඩු වී තිබුණ නිසා එලිසබෙත් ඇගේ වගාව අසලට ගොස් පැළ පේළි දෙකට ඉතා පරිස්සමින් වතුර වත් කළා ය. ඇය ඒ කටයුත්ත අවසන් කරත් ම වාගේ ජෝන් ටෙරී වගා බිමට ඇතුළු වූයේ ය.

ඔහු සමඟ තවත් ගැහැනු ළමයින් සහ පිරිමි ළමයින් වූහ. ඇයට ඔවුන් නො පෙනුණත් ඔවුන් ගේ කටහඬවල් යු ගස් බැම්මට එහායින් ඇසිණි.

"හින්... නියමයි, එලිසබෙත්, ඔයා හරි ගාණට වතුර දාලා." ජෝන් කීවේ ය. "ඔයාට ඒගොල්ලෝ බිල්ලලා මරන්න ඕන නැහැනේ, ඒවා හොඳට පැළ වෙලා, එහෙම නේද?"

"ඔයා එහෙම හිතනවා ද ජෝන්." එලිසබෙත් සතුටින් ඇසුවා ය.

"ඔව් ඇත්තට ම ඒවා මගේ පැළ තරම් ම හොඳට වැවිලා තියෙනවා. ඒ වුණාට එලිසබෙත් මට ඔයාට එකක් කියන්න ඕනි, ටික කාලෙකට ඔයා වතුර දාන අන්තිම වතාව මේක වෙන්න පුළුවන්." එසේ කියමින් ජෝන් කල්පනාකාරී ව අහස දෙස බැලුවේ ය. "එන්න දවස් ඉවරයි, දවස් දෙක තුනක් වතුර නැදුව වළියි."

ගොවිතැනේ ප්‍රවීණ ගෙවතු පාලකයෙක් මෙන් ජෝන් ද කාලගුණය ගැන ඉතා සැලකිල්ලෙන් සිටියි.



"ඔන්, ඇත්ත ද! හරි ම ශෝක්, එහෙනම් වැස්ස මගේ රස්සාව බාර ගනීවි. පයින් නැතුව ම!" එලිසබෙත් සතුටින් කෑ ගැසුවා ය.

"ඇත්තට ම වැස්ස එන විදිහකට ඔයා ගේ රස්සාව බාර ගනියි, ඒ වුණාට ඒක ඔයාට තව අලුත් රස්සාවකුත් දෙයි. දැන් බලන්න එලිසබෙත්..."

"ජෝන්." යමෙකු කෑ ගසනු ඇසිණි.

ජෝන් කතාව අවසන් කිරීමට මත්තෙන් පිරිමි ළමයකු මුල්ලුවකුත් අතැ'ති ව ඔවුන් දෙසට ඇවිද ගෙන එනු පෙනිණි.

"හරියට ම කොයි හරියේ ද ජෝන් පොළොව පෙරළන්න ඕනේ?" පිරිමි ළමයා ඇසුවේ ය.

"මං ඔයාට විනාඩියට පෙන්නන්නම්, මට එලිසබෙත්ට වැදගත් කාරණාවක් පැහැදිලි කරන්න ඕනි."

නමුත් එලිසබෙත් එතැනට පැමිණි ළමයා දෙස පුදුමයෙන් බලා සිටින්නට වූවා ය. ඔහු වැඩුණු සිරුරක් ඇති, මහත දෙනෙත පාසලේ සිටින වැඩිමහල් ම සිසුයෙක් ගෙන් කෙනෙකි. ඔහු නිතර ම වින් ගොවිපළේ වැඩවලට උදවු කළේ ය. ඔහු ගේ පාද විශාල වූ අතර අත් ද විශාල රතු පාට ඒවා විය. ඔහු ගේ මුහුණ ඉතා සියුමැලි විය. ඔහු ගේ මුහුණ පුවමනාවටත් වඩා සුදුමැලි වී ඇති බව එලිසබෙත් දුටුවා ය. ඔහු කාමින් හැඳ සිටින්නේ ටෙනිස් කොට කලිසමකි. ඒ රොජර් බුවුන්... පැට්‍රික් ගේ ටෙනිස් ප්‍රතිවාදියා.... මැච් එක ඉවර වෙලා ඇති!

පැට්‍රික් ගේ ටෙනිස් මැච් එක! ඇයට ඒ ගැන සම්පූර්ණයෙන් ම අමතක වී තිබිණි!

"ඒකට කමක් නෑ ජෝන්, මට දැන් දුවලා යන්න ඕනි!" එලිසබෙත් වේගයෙන් දුවන්නට පටන් ගත්තා ය.

"මට ඕන වෙන වෙලාවක කියන්න, මං දැන් මෙතැන ඉන්න ඕනෙ නෑ කියලා දැනුයි මට තේරුණේ" ඇය ආපසු හැරී කෑ ගැසුවා ය.

www.sinhalaelibrary.com

ඇය තමාට හැකි තරම් වේගයෙන් ටෙනිස් පිට්ටනියට දුවන්නට වූවා ය.

පළමු පන්තියේ ළමයින් ගෙන් වට කරන ලදුව පැට්‍රික් ටෙනිස් පිට්ටනිය අසල බංකුවක ජූලියන් සමඟ වාඩි වී සිටියේ ය. ඇය අමාරුවෙන් හුස්ම අල්ලමින් ඔවුන් වෙතට දිවුවා ය.

"ඔයා දින්නා ද පැට්‍රික්?" ඇය හති දමමින් නමුත් මහ හඬින් ඇසුවා ය.

"ඔව් දිනුවා තමයි!" ඇරබෙලා මැද්දට පැන සැර පරුෂ ලෙස කීවා ය.

"එලිසබෙත්!" ජූලියන් දෝෂාරෝපණයක ස්වභාවයෙන් කතා කළේ ය.

"ඔයාට මොකද වුණේ? ඇයි ඔයා ආවේ නැත්තේ මැච් එක බලන්න?"

එලිසබෙත් ගේ මුහුණ රතු විය.

"මට අමතක වුණා." ඇය ඉතා සෙමින් කීවා ය.

"පැට්‍රික් දින්නා!" ඇරබෙලා ජයග්‍රාහී ලෙස කීවා ය. "ඔයා දැන් ඉස්කෝලේ සෙකන්ඩ් ටීම් එකට සෙල්ලම් කරන්නයි යන්නේ! එයාට මේ හැම දෙයක් ම හම්බුනේ එයා ගේ හොඳ ම යාළුවෝ ඔක්කොම ඇවිත් එයාට චියර් කරපු නිසා. පුදුමයි ඔයාට අමතක වුණා එන්න, ඒත් කමක් නෑ එලිසබෙත් ඔයා ආවා කියලා ඉතින් වෙනසක් වෙන්නෙත් නැහැනේ."

එතරම් නපුරු ලෙස කතා කිරීමට කෙතරම් දුෂ්ට හදවතක් තිබිය යුතු දැයි එලිසබෙත් සිතුවා ය.

ඇය ඇරබෙලා ව පස්සට තල්ලු කර පැට්‍රික් වෙත ගොස් ඔහුට ඇගේ අත දිගු කළා ය. ඇයට වුවමනා වූයේ ඔහුට අතට අත දී සුබ පැතීමට ය.

"මගෙන් සුබ පැතුම්, පැට්‍රික්. ඔයා මහන්සි වෙලා පුරුදු වුණ නිසා ඔයා ටීම් එකට තේරුණා. ඒක ඔයාට අනිවාර්යයෙන් ම හම්බ වෙන්න තිබුණ දෙයක්. මං ඇත්තට



ම ඇවිත් මැච් එක බලන්නයි හිටියේ, මට සමාවෙන්න. ඇත්තට ම විලියමුයි රීටායි හම්බ වෙන්න ගියාට පස්සෙ මට ගොඩක් වැදගත්....."

ඇය එක පාරට ම නැවතුණා ය. ඇය කියන්නට ගියේ වැදගත් දෙයක් ගැන සිතන්නට සිදු වූ බව ය. 'ඒ වුණාට එහෙම කියන එක හරි නෑ. හරියට පැට්‍රික් ගේ ටෙනිස් මැච් එක එච්චර වැදගත් නෑ වගේ.' ඇය සිතුවා ය.

පැට්‍රික් ඇය දිගු කරන ලද අත නිකමට වත් ගණන් නොගෙන බංකුවෙන් නැගිට්ටේ ය.

"මටත් තියෙනවා ගොඩක් වැදගත් දේවල් කරන්න." ඔහු කීවේ ය. "මං දැන් ටීම් එකට සෙල්ලම් කරනවා නෙ, මගේ සර්විස් (පන්දු පිරිනැමීම) එක එච්චර ම හොඳ මදි, ඒ හින්දා ගිහින් බිත්තියට ගහලා ටිකක් පුරුදු වෙන්න ඕනී. අනෙක මට සෙනසුරාදට මැච් එකකුත් තියෙනවා නෙ."

එලිසබෙත් දෙස හැරයක් වත් නොබලා ම ඔහු දුරින් දුරින් අඩි තබමින් ඇවිද යන්නට වූයේ ය. පැට්‍රික් ගේ මුහුණේ කලකිරීම නිසා ඇති වූ බුම්මා ගත් පෙනුමක් විය. රොජර් ව පරාජයට පත් කර කණ්ඩායමේ ඔහුට තැනක් ලබා ගැනීමට හැකි වීම ගැන ඔහු උද්දාමයට පත් ව සිටියමුත්, ඇත්තට ම ඔහු එලිසබෙත්ට කුමක් වූයේ ද යැයි කල්පනා කළේ ය. ඔහු ඇය ගැන කරදර වූයේ ය. 'ඒ වුණාට එයාට නම් මාව නිකම් ම අමතක වෙලා, මොනා ද මෙච්චර වැදගත් වැඩ එයාට තියෙන.' පැට්‍රික් සිතුවේ ය.

පසු ව ඔහු කුඩා පීටර් ගෙන් දැන ගත් ආකාරයට තරඟය යන අතරවාරයේ දී ඇය එළවළු පාත්තිවල වල් පැළ උදුරමින් සිට ඇත. පීටර් ඇය එහි සිටිනු දැක තිබුණේ ය.

"එච්චර ද වල් පැළ ගලෝනවා...!" මේ ආරංචිය පැට්‍රික් ජූලියන්ට පැවසූ විට ඔහු ගේ පවා ඇහිබැම උඩ ගියේ ය.

"ඒ වුණාට එයාට හොඳ හදවතක් තියෙනවා, පැට්‍රික්," ඔහු නොකැමැත්තෙන් දෙවුර සොලවමින් කීවේ ය. "ඔයා ඉක්මනට ඒක දැන ගනීවි."

www.sinhalaelibrary.com

එලිසබෙත්ට, ජූලියන්ට පාපොච්චාරණය කිරීමට අදහසක් නො වී ය. ඊටත් වඩා අඩුවෙන් පැට්‍රික්ට කොහොමත් කියන්න ද ඇය හරිතාගාරය තුළට වී පොඩි ළමයකු මෙන් හඬමින් සිටි බවක්. අවසානයේ පැට්‍රික් ව හමු වී ඔහුට හොඳින් කතා කිරීමට ඇය තීරණය කළා ය. එවිට පෙර ඔහු ඇගේ අතපසු වීමට සමාව දී එය අමතක කරනු ඇතැයි ඇය සිතුවා ය.

ඇත්තෙන් ම, හවස කොහෝඩා පාසලේ දී පැට්‍රික් සිටියේ එලිසබෙත්ට සමාව දී ඇයට තවත් අවස්ථාවක් ලබා දීමට සුදුසු තත්ත්වයක ය. ඒ ඔහු ගේ පුහුණුවීම් හොඳින් සෙට් තිබුණ නිසාත් ඊළඟට යෙදී තිබුණ වුඩ්විලි සමග තරගය ඔහු ඉතා උනන්දුවෙන් බලාපොරොත්තු වූ නිසාත් ය.

"මැච් එක තියෙන්නෙ අපේ ඉස්කෝලෙමයි, ඒ හින්දා ඔයා ඇවිත් බලන්න ම ඕනි." ඔහු එලිසබෙත්ට කීවේ ය. "ඔයා මොනිටර් කෙනෙක් නිසා විශේෂයෙන් ම එන්න ඕන."

සතියේ රැස්වීමේ දී ඔවුන්ට දැන ගන්නට ලැබෙන ආරංචිය මතක් වීමෙන් ඇය වියළි ලෙස සිනාසුණා ය. එලිසබෙත් ඉතා පරිස්සමින් වචන ගළපා ගත්තා ය.

"මොනිටර් කෙනෙක් වුණත් නැතත්," ඇය කීවා ය. "මං එනවා මැච් එක බලන්න."

3

## පැට්‍රික් පුංචි විහිළුවක් කරයි

සතියේ රැස්වීමට වෙලාව ඇවිදින් ය. මුළු පාසල ම එයට සහභාගි විය යුතු ය. පාසලේ සිසුහු රැස්වීම් දිනය එන තෙක් ඉතා වුවමනාවෙන් බලා සිටිති.

ඒ එදින ඔවුන් ගේ මුදල් බෙදාහදා ගන්නා නිසා ම පමණක් නො ව, ඉන් පසු ව හැමදාමත් එක එක විදිහෙ පැමිණිලි ඇසීමටත්, ඒ වගේ ම සාකච්ඡා කිරීමට බොහෝ දේත් ඇති බැවිනි.

දින දෙකක් තිස්සේ ඇද හැළෙන මහ වැස්ස නිසා එළිමහන් විනෝදාංශ ක්‍රීඩා නතර කර තිබිණි. ඔවුන් ගේ ප්‍රියතම විනෝදාංශය වන අසුන් පැදීම පවා කළ නො හැකි ව තිබිණි. ඒ නිසා නැවත සියල්ල උද්යෝගිමත් කිරීමට තේ පානයෙන් පසු පාසල් රැස්වීම යෙදී තිබීම ඔවුන් සියල්ලන් ගේ ම සතුටට කාරණයක් විය. පැට්‍රික් ගේ සිතට සහනයක් ගෙන දෙමින් සවස් වන විට කාලගුණය හොඳ අතට හැරෙමින් තිබිණි. ඔහු නො ඉවසිල්ලෙන් බලා සිටියේ සෙනසුරාදාට යෙදී තිබෙන තරගයට පෙර තවත් හොඳින් පුහුණුවීම්වල යෙදීමට ය.

www.sinhalaelibrary.com

ප්‍රධාන ශාලාව මෙන් දෙගුණයක් විශාල වූ සරම ශාලාව තුළට රැස්වීමට සහභාගි වීම සඳහා පාසලේ සිසුහු රැස් වෙමින් සිටියහ. පාස්කු නිවාඩුවේ දී ශාලාවේ එක් කෙළවරක ළමයින් ගේ සංදර්ශන සහ නාට්‍යය සඳහා වේදිකාවක් ඉදි කෙරුණි. මෙය නිසා රැස්වීම් පැවැත්වීම වඩාත් පහසු වී තිබිණි. වේදිකාව මත ශාලාව දෙසට මුහුණලා දිග පුටු පේළි දෙකක් විය. ඒ පුටුවල පාසලේ සිසුන් විසින් තෝරා ගන්නා ලද ශිෂ්‍ය නායක නායිකාවෝ දොළොස් දෙනා ප්‍රධාන ශිෂ්‍ය නායකයාට හා නායිකාවට දෙපැත්තෙන් වාඩි වී සිටියහ.

විලියම් සහ රීටා හෙවත් පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායකයා හා නායිකාව වාඩි වී සිටියේ වේදිකාව මැද වූ කුඩා මේසයට පිටුපසිනි. විශාල පොතක් මේසය මත තිබෙන අතර එහි පාසල ආරම්භයේ සිට ම නොයෙක් තොරතුරු සටහන් කර තිබිණි. පොත ළඟින් ම කුඩා මිටියක් විය. උසාවියේ නඩුකාරතුමා ගේ මිටිය මෙන් ඔවුහු එය පාවිච්චි කළහ. ඇත්තට ම ඔවුන් නඩුකාරයන් ය, ඔවුන් දෙපස ජූරි සභාව විය. එලිසබෙත් හැම විට ම සිතුවේ එලෙස ය. මේ රැස්වීම ප්‍රශ්න සාකච්ඡා කර විසඳන අතර ම පාසලට අවශ්‍ය නීති ද සකස් කරයි. ඊටත් අමතර ව උසාවියක මෙන් නරක හැසිරීම් හා නරක වැඩ සියල්ල එය ඉදිරියට ගෙන ආ යුතු ය. ප්‍රශ්න සියල්ල ම ප්‍රසිද්ධියේ සාකච්ඡා කෙරුණු අතර අවශ්‍ය විට දඬුවම් ද පමුණුවයි. ගැහැනු සහ පිරිමි ළමයින් දෙපිරිස විසින් ම තම වැරදිවලට අභිමුඛ ව මුහුණ දිය යුතු ව තිබිණි.

මිස් බෙලා සහ මිස් බෙස්ට් හෙවත් පාසලේ ප්‍රධාන ගුරුතුමියන් අසුන් ගෙන සිටියේ ප්‍රධාන ගුරුවරයා වන මිස්ටර් ජෝන්ස් සමඟ ශාලාවේ කෙළවර ය. ඔවුන් රැස්වීමේ වැඩ කටයුතුවලට උදව් වූයේ ඉතා කලාතුරකිනි. ඒ ඔවුන් ගේ උපදෙස් බලාපොරොත්තු වූ විටක ය.



වයිට්ලීෆ් පාසලට මුලින් ම පැමිණි දිනවල මේ රැස්වීම එලිසබෙත්ට රිස්සන්නට බැරි විය. ඇය සිතුවේ මේ ලෝකයේ තිබෙන මෝඩ ම අදහස එය බව ය. නමුත් රැස්වීම ගැන ඇගේ තිබූ අදහස් හාත්පසින් ම දැන් වෙනස් වී තිබිණි.

ඒ වුණාට එයා අද කෝ?

"මේක හරි ම විහිළුවක් නේ," අනෙක් පළමු වසර සිසුන් සමඟ ශාලාවට ඇතුළු වෙද්දී ජූලියන් කීවේ ය. ඔහු වේදිකාව දෙස ඉතා සැලකිල්ලෙන් බලන්නට වූයේ ය. "ඇයි එලිසබෙත් අනෙක් මොනිටර්ස්ලාත් එක්ක ස්ටේජ් එක උඩ නැත්තෙ?"

"එයා පරක්කු වෙනවා ඇති," බෙලින්ඩා මිමිණුවා ය.

"ඒ වුණාට එයාට පුටුවකුත් එතැන නැහැනේ." හැම දෙයක් ම හොඳින් නිරීක්ෂණය කර ඉක්මනින් තේරුම් ගැනීමට හැකි ජූලියන් කීවේ ය. "හරි ම අමුතුයි."

එලිසබෙත් මේ වන විටත් කිසි කෙනෙකුට සිද්ධිය කියා නො තිබුණ අතර ඇය සිතුවේ, තව ම එය කීමට වෙලාසන වැඩි බව ය. රැස්වීමේ දී එය එළියට එන විට ඇගේ සිත සන්සුන් වී තිබෙනු ඇතැයි ඇය විශ්වාස කළා ය.

"මට හිතා ගන්න බෑ මොකා ද වෙන්නෙ කියලා." ඒ ගැන කල්පනා කරමින් සිටි ජූලියන් කීවේ ය.

ඔහුට වැඩි වෙලා බලා සිටීමට වුවමනා වූයේ නැත.

ශාලාවේ සියලු ම බංකු ළමයින් ගෙන් පිරුණු අතර ඉඩ නොමැතිකම නිසා පුංචි ළමයි බංකුවලට ඉදිරියෙන් වූ හිස් ඉඩෙහි කකුල් නවා බිම වාඩි වූහ. ඔවුන් පළමු පන්තියට වඩා පහළ බාලාංශ පන්තිවල සිසුන් ය.

ළමයින් ගේ රහස් දෙඩවීම හා කෑ ගැසීම්වල හඬවල් එන්න එන්න ම උත්සන්න වන්නට විය.

විලියම් නැඟිට මිටියෙන් මේසයට තට්ටු කළේ ය.

"නිශ්ශබ්ද වෙන්න, කරුණාකරලා."

ක්ෂණයකින් මුළු ශාලාව ම මීයට පිම්බාක් මෙන් නිශ්ශබ්ද විය.

www.sinhalaelibrary.com

"රැස්වීම පටන් ගන්න කලින් මට කියන්න දෙයක් තියෙනවා." ඔහු පළමු වන පේළියේ අැත ම කෙළවරට වී වාඩි වී සිටින කෙනෙකු දෙස බලා සිනාසුණේ ය.

"කරුණාකරලා නැගිටින්න එලිසබෙත්, නැගිටලා ස්ටේජ් එක උඩට එන්න."

අැය නැගිට්ටා ය. මුළු ශක්තිය ම එකතු කර ගත්තත් එලිසබෙත්ට තම ගේ කකුල් ගැහීම නවත්වා ගැනීමට නො හැකි විය. බඩ ඇතුළෙ කුමක් හෝ නලියන බවක් අැයට දැනෙන්නට විය. මුළු පාසල ම බලා සිටින්නේ අැය දෙස ය. අැය සිතා සිටියේ විලියම් හා රීටා ඉතා ඉක්මනින් මෙය නිවේදනය කර අවසන් කරනු ඇතැයි කියා ය. නමුත් මෙය නම් නපුරු සිහිනයකි.

අැය ගාම්භීර ව සිටීමට උත්සාහ දරමින් සෙමින් වේදිකාව දෙසට ගොස් එයට නැංගා ය. ජූලියන් සහ අනෙක් සියල්ලෝ ම පුදුමයෙන් බලා සිටින්නට වූහ. ඒ ඔවුන් ගේ ම එලිසබෙත්, වීර, නරක ගැනු ළමයා . මොනා ද මේ වෙන්නෙ?

"පසුගිය වාරෙත් වැඩි කාලයක් එලිසබෙත් මොනිටර් කෙනෙක් වෙලා හිටියා," විලියම් පාසලට කීවේ ය. "මේ වාරෙත් විශේෂ අවසරයක් ඇතුව අපි එලිසබෙත්ට කිවුවා තව ටික කාලෙකට අමතර මොනිටර් කෙනෙක් විදිහට වැඩ කරන්න කියලා. අපි හැමෝටම එයා ගැන ආඩම්බරයි, එහෙම නේද? එලිසබෙත් ගොඩක් හොඳට එයාගෙ යුතුකම් කොටස ඉටු කළා. ඒ වුණාට එයාට දැන් අස්වෙන්න කාලේ ඇවිත්. මං හිතනවා අපි වගේ ම සියලෝල්ලොත් එකඟ වෙනවා ඇති එලිසබෙත් දක්ෂ මොනිටර් කෙනෙක් විදිහට වැඩ කළා කියන එකට. මං හිත අපිට එයා ව කොයි තරම් වටිනවා ද කියලා පෙන්නන්න."

ඔහු යන්තමින් හිස සොලෙව්වේ ය. එවිට රීටා අැගේ අසුනින් නැගිට්ටා ය. වේදිකාව මත සිටි අනෙක් සියලු ම ශිෂ්‍ය නායක නායිකාවෝ අැය ව අනුමෝදනය කරමින් තම



අසුනවලින් නැගිට්ටහ. විලියම් අැයට අතට අත දී ආචාර කළේ ය. අනෙක් සියලු ම ශිෂ්‍ය නායක නායිකාවෝ ද අැයට අතට අත දී ආචාර කළහ.

මුළු පාසල ම එකට එකතු විය. අැය හිස කෙලින් තබා ගෙන වේදිකාවෙන් පහළට බැස්සා ය. අැය වේදිකාවෙන් බැස අැගේ යහළුවන් සමඟ එක් වීමට පළමු පන්තියේ ළමයින් ගේ බංකු පේළි දෙසට යද්දී, ශාලාවේ සියලු ම පැතිවලින් ළමයින් ගේ ප්‍රීති ඝෝෂා ඇසෙන්නට විය. දින දෙකක් තිස්සේ වර්ෂාව නිසා පාසල් ගොඩනැඟිලි තුළ ම සිර වී සිටි ළමයිනට කෑ ගැසීමට හොඳ අවස්ථාවක් ලැබී තිබිණි!

එලිසබෙත් ගේ සිතට සහනයක් දැනුණි. ඒ එය අැය සිතූ තරම් දරුණු අත්දැකීමක් නො වුණ නිසා ය. ඇත්තට ම වුයේ අැය සිතූ දෙය නො ව නො සිතූ දෙයකි. දක්ෂ ලෙස විලියම් හා රීටා ඒ අවස්ථාව හැසිරවූ ආකාරය ඔහත් වීමෙන් අැය උදෙසන්නයට පත් වූවා ය.

"හොර ගෙඩියා, අපිට කිවුවෙත් නෑ." අැය ජූලියන් අසල වාඩි වෙද්දී ඔහු කීවේ ය. බෙලින්ඩා, කැත්ලීන් හා පැට්‍රික් පවා ඇගේ පිටට තට්ටු කළහ.

එලිසබෙත් දක්ෂ ශිෂ්‍ය නායිකාවක් බවට කාරණා පැට්‍රික් මොන තරම් දැන ගෙන සිටියත් මේ ආරංචිය ගැන සතුටු වීමට කාරණයක් විය. එනම් ගැහැනු ළමයින් විසින් පිරිමි ළමයින් ව පාලනය කිරීම ඔහුට පේන්නට බැරි වීම ය. මෙක නම් වැඩිය හොඳ වෙයි, ඔහුට සිතුණි.

අැරබෙලා ද ඉතා විනීත ව අනෙක් ළමයින් සමඟ එක් ව අත්පුඩි ගැසුවා ය. ඒ ඇත්තෙන් ම වෙනත් හේතුවකට ය.

ජූලියන් එලිසබෙත් ගේ අත මිරිකුවේ ය. "එයා හරි ම නිර්භීතයි!" ඔහු කෙඳිරී ය. කොළ පාට ඇස් දිලිසිණි. පළමු පන්තියේ ළමයින් ගෙන් ජූලියන් පමණක් කලින් දවසක විලියම් හා රීටා ව තනි ව ම හමු වීමට එන ලෙස එලිසබෙත් ව කැඳවීමට හේතුව දැන ගැනීමට කුතුහලයෙන් පසු විය.

ගිරවියක මෙන් කතා කරන එලිසබෙත් ඒ සිදු වීම ගැන කිසි ම දෙයක් කතා නො කිරීම ඔහු ව පුදුමයට පත් කළේ ය. නමුත් දැන් ඔහුට සියල්ල වැටහිණි.

එලිසබෙත් සැනසුම් සුසුමක් හෙළුවා ය. විලියම් ශාලාව නිශ්ශබ්ද කිරීමට මිටියෙන් මේසයට තට්ටු කළේ ය. රැස්වීම දිගට ම කර ගෙන යාමට වෙලාව පැමිණ ඇත. දෙයියනේ.... ඇති යාන්තම් ඔක්කොම ඉවරයි!

තෝමස් ලොකු තාසි පෙට්ටිය අල්ලා ගෙන ශාලාව වටේ ගියේ ය. පසුගිය සතිය තුළ මුදල් ලැබුණු ළමයින් සියලු ම දෙනා ඒ මුදල් පෙට්ටියට දැමිය යුතු වූ අතර ඊට පසු ව පාසලේ සෑම සාමාජිකයකුට ම පවුම් දෙක බැගින් බෙදා දෙනු ලබයි. ඒ ඔවුන් ගේ සතියේ වියදම සඳහා මුදල් ය.

වයිටලීෆ් පාසලේ ඔවුන් සමහර ළමයින්ට අනෙක් අයට වඩා වියදම් කිරීමට වැඩිපුර මුදල් තිබීම විශ්වාස නො කළහ. ඒවා සාධාරණ ව බෙදා ගැනීමට ඇති එක ම ක්‍රමය මෙය යැයි ඔවුහු විශ්වාස කළහ. කවුරුන් හෝ කෙනෙකුට අමතර මුදල් අවශ්‍ය වන්නේ නම් එය වෙන ම ඉල්ලිය යුතු ය. කාරණාවේ සාධාරණකම අනුව මුදල් දීම හෝ නො දීම රැස්වීම තීරණය කරයි.

"අනේ, මං මගේ මුද්දර අමතක වෙලා වැස්සේ දාලා ගිය නිසා ඒවා පාවිච්චි කරන්න බැරි තරම් නාස්ති වෙලා." පීටර් නැගිටිමින් කීවේ ය. "මට මේ සතියේ ලියුම් වගයක් තියෙනවා ලියන්න. කරුණාකරලා මට වැඩිපුර සල්ලි ටිකක් දෙන්න පුළුවන් ද මුද්දර ගන්න?"

"නැහැ." මුද්දර සියල්ල ම නාස්ති වී එකට ඇලී ගියේ ඔහු ගේ ම නො සැලකිලිමත්කම නිසා ය. රැස්වීම තීරණය කරන ලදි.

"මේ සතියේ එයාට රසකැවිලි ටිකක් අඩුවෙන් කන්න වෙයි." රීටා කාරුණික ව කීවා ය.



මේරිට ගමේ වූ මල් කඩයකින් ඇගේ නැන්දාට මල් මිටියක් යැවීමට වුවමනා වී තිබිණි, ඒ ඇය තදබල ලෙස රෝගාතුර ව සිටින නිසා ය.

"ඒ ඉල්ලීමට අවසර ලැබෙනවා." ප්‍රධාන ශිෂ්‍ය නායකයා කීවේ ය. "තෝමස්, මේරිට පෙට්ටියෙන් වැඩිපුර පවුම් දහයක් දෙන්න."

ඉන් පසු ව ඇසීමට පැමිණිලි තුනක් විය. ඉන් දෙකක් නියම පැමිණිලි වූ අතර තුන්වැන්න නම් ඉතා මෝඩ එකකි.

"ඇරබෙලා ගීත පන්තියේ දී මං දිහා බලා ගෙන එක එක විකාර මූණුවල් හදනවා." ඩැනියෙල් කාටර් කීවේ ය. "එයාට ඕන මාව හිනා ගස්සවන්න, බැරි වෙලා වත් මං හිනා වුණොත් හරි ම කරදරේක වැටෙනවා."

"ඒක පැමිණිල්ලක් නෙමෙයි." විලියම් දැඩි ව කීවේ ය. "බොරුවට කතා හදලා කියන්න එපා. එහා ම වාඩි වෙන්න ඩැනියෙල්."

පළමු පන්තියේ ළමයින් සිනා නො වී සිටීමට උත්සාහ දැරීම නිසා ඔවුන් අතරින් කෙඳිරි ගෑමකට සමාන උස් හඬක් නැගුණි.

"ඒ වෙලාවට අනෙක් පැත්ත බලා ගෙන ඉන්න බලන්න ඩැනියෙල්." බෙලින්ඩා සිනා වෙන ගමන් ම කෙඳිරී ය.

"ඇරබෙලා විකාර මූණුවල් හදනවා නෙමෙයි!" ජූලියන් දෙවුර සෙලෙව්වේ ය. "එයා ගේ පෙනුම කොහොමත් එහෙම තමා!"

ජයග්‍රාහී හැඟීමකින් පසු වුණු ඇරබෙලා මෙය ඇසීමෙන් තද රෝස පාටට හැරුණි. ඇය තමා ගේ පෙනුම ගැන නිතර ම ආඩම්බර වූ එකියකි.

විලියම් නැවතත් මිටිය තට්ටු කළේ ය.

"අපි රැස්වීම අදට ඉවර කරන්න කලින්, සුබ පැතීමක් තියෙනවා කරන්න. රොජර්, නැගිටින්න කරුණාකරලා."

www.sinhalaelibrary.com

මහත දෙහෙත සිසුවා අපහසුවට පත් වූ ලෙස සෙමින් හැකිළිණේ ය. ප්‍රසිද්ධියේ සිට ගෙන සිටීම ඔහු ප්‍රිය කරන බවක් පෙනෙන්නට නො වී ය. ඔහු ගේ සෞම්‍ය මුහුණේ හැම විට ම කලකිරුණු බවක් පෙනෙන්නට තිබිණි.

"අපි හැමෝම දන්න විදිහට," විලියම් කීවේ ය. "රොජර් වයිටලීෆ් ඉස්කෝලෙ ඉහළ ම පන්තියේ ඉගෙන ගන්න කෙනෙක්. ළඟ දී එයාට හෝලිෆීල්ඩ් ඉස්කෝලෙට ශිෂ්‍යත්වයක් ලැබිලා තියෙනවා. ඒක අධ්‍යාපනික ශිෂ්‍යත්වයක්. ඉතා හොඳයි රොජර්. හැමෝම අත්පොළසන් නාදයක් දෙන්න රොජර්ට."

හැමෝම අත්පොළසන දෙද්දී රොජර් මුවුන් එය අගය කරන්නාක් මෙන් ලැජ්ජාවෙන් හිස වනා ඉක්මනින් හිඳ ගත්තේ ය.

"හෝලිෆීල්ඩ් ස්පෝර්ට්ස්වලට හරි ප්‍රසිද්ධයි නේද?" දෙවන පන්තියේ සිසුවෙක් තම මිතුරාට මිමිණුවේ ය. "එයාට එහෙ වැඩ කර ගෙන යන්න පුළුවන් වෙයි ද?"

පළමු වන පන්තියේ ළමයෙකුට රොජර් කණ්ඩායමේ තැන නැති කර ගත් බව දැන් පාසලේ සියල්ලන් ම දන්නා ආරංචියකි.

"ඒගොල්ලන්ට තවත් ඒවට දක්ෂ අයත් ඉන්නවා." යාළුවා ආපසු කෙඳිරී ය.

"සංගීතෙට දක්ෂ අය, ඒ වගේ ම ඉගෙන ගන්න විතරක් දක්ෂ අනාගත පොලවන්ට බැරි මොළකාරයෝ එහෙමත් එහෙ ඉන්නවා, හරියට රොජර් වගේ. එයාට එහෙ ප්‍රශ්නයක් වෙන එකක් නෑ!"

පළමු වසර සිසුන් ශාලාවෙන් පිටතට යද්දී, ඔවුන් ගේ වැඩි කතාබහට ලක් වූයේ එලිසබෙත් හා සම්බන්ධ ආරංචියයි.

"දැන් ඔයා ආයෙමත් කලින් හිටිය අපේ එලිසබෙත්." බෙලින්ඩා සාරුණික ව කීවා ය. "ඔයාට දැන් අස්සයෝ පදින්නයි, අනෙක් වැඩවලටයි ගොඩක් වෙලාව තියෙනවා."



"මොනිටර් කෙනෙක් නොවෙයි විදිහට ඉන්න එක විහිළුවක් වගේ තේරෙයි ද ඔයාට." කැත්ලීන් ඇසුවා ය.

"ටික දවසකට එහෙම වෙයි, මං හිතන්නේ." එලිසබෙත් සන්සුන් ව පිළිතුරු දුන්නා ය.

පිරිමි ළමයින් ඇයට තරමක් විහිළු කළහ. විශේෂයෙන් ජුලියන්.

"දැන් ඔයාට කෙළින් ම කලින් හිටිය දඟ මල්ල වෙන්න පුළුවන්!" ඔහු සිනාසුණේ ය.

"කවදා වත් නෑ!" එලිසබෙත් ඇනුම් පදයක ස්වරූපයෙන් තදින් කීවා ය. විහිළුවලට ඇය එඩිතර ව මුහුණ දුන්නා ය.

ඒත් සමඟ ම පැට්‍රික් මහා අප්‍රසන්න කතාවක් කීවේ ය.

"ඇත්තට ම එලිසබෙත්, දැන් ඔයා ඇවිත් මගේ ටෙනිස් මැච් එක බලන්න වුවමනාවක් නෑ." ඔහු කීවේ ය. "ඔයා මොනිටර් කෙනෙක් නොවෙයි නම් එතැනට මට ඔයා ගෙන් වැඩක් නෑ."

පැට්‍රික් විහිළුවක් කිරීමට උත්සාහ කළා පමණක් වුවත්, ඒ කතාව එලිසබෙත්ට දිරවා ගැනීමට අපහසු තරමේ එකක් විය.

පැට්‍රික් ගේ වචනවලින් ඇගේ පුංචි හිත තදින් ම පෑරුණු අතර, ටික වෙලාවකට ඇරබෙලා සහ අනෙක් ළමයින් එලිසබෙත් ගේ මුහුණින් දුටුවේ පුදුමයට පත් වූ බවකි.

නමුත් එය ඇත්තට ම විහිළුවක් බව එලිසබෙත්ට හැඟෙද්දී ම ශාලාවේ ප්‍රධාන දොරටුව ඇරුණු අතර සියල්ලෝ ම ඔල්වරසන් දෙමින් එකිනෙකා තල්ලු කර ගනිමින් එළියට දිව යන්නට වූහ. අන්තිමට වැස්ස ද නතර වී තිබුණ අතර සවස් කාලය සතුටින් ගත කිරීමට හැකි වීම ගැන ඔවුහු සතුටු වූහ.

"හුරේ...!" පැට්‍රික් කෑ ගැසුවේ ය. "මං ගිහින් මගේ රැකට් එක අරන් ඇවිත් ටෙනිස් පුරුදු වෙන්න ඕනි."

www.sinhalaelibrary.com

"මං යනවා ඉස්තාලේ දිහාවට, ගිහින් අස්සයෝ බලනවා." රොබට් කෑ ගැසුවේ ය.

සියල්ලෝ ම තමන් කැමති කැමති පැතිවලට විසිර යන්නට වූහ.

'මගේ සලාද පැළ.' එලිසබෙත් සිතුවා ය. 'මට ගිහින් ඒවා බලන්න පුළුවන්, මට හොඳට ම විශ්වාසයි ඒවා වැස්සට තෙමිලා ගිහින් නැතුව ඇති කියලා. දැන් ඒවා පුංචි බබාලා නෙමෙයි නෙ. තවත් ලොකු වෙලා ද දන්නෑ?'

වාසනාවට එලිසබෙත් ගොස් ඇගේ කළු පාට රබර් බූට් පැළඳ ගෙන ආවා ය. පාසලේ ගෙවිපළ පුරා ම තැනින් තැන මඩ කඩිති ඇති වී තිබිණි. විශාල එළවළු වත්ත සම්පූර්ණයෙන් ම මඩ වී තිබුණ අතර ඇවිදීමේ දී 'ජොර', 'ජොර' ශබ්දයක් බූට් සපත්තුවලින් ඇති විණි.

ඇය බ්ලැක් කරන්ට් පඳුරු අතරින් අඩි තබමින් ගියා ය. ඒවායේ කොළ මත දුර්වල හිරු එළිය වැටීමෙන් දීප්තියක් ඇති කෙරුණි. ඉන් පසු ව ඇය ගූ ගස් පේළිය අතරින් ඇගේ වගාව දෙසට...

විස්මයට පත් එලිසබෙත් ගේ මුව විවර වූ අතර ඉහළට ගත් හුස්ම පහතට හෙළීමට පෙර ඇය සිටි තැන ම ගල් ගැසුණා ය.

"අයියෝ... නෑ!"

ඇගේ ඇස් අදහීමට නො හැකි ව එලිසබෙත් හිටගෙන සලාද පැළ පේළි දිහා බලා සිටින්නට වූවා ය. දින කිහිපයකට ඉහත දී ඒවා ඉතා ලස්සනට තර ව වැවී තිබිණි. නමුත් දැන් ඒවා හඳුනා ගැනීමටත් නො හැකි තත්ත්වයට පත් වී ඇත.

"ඒවා ඔක්කොම කාලා විනාශ කරලා දාලා, ඒවා හරි ම කැතයි..."

"ඊ.... යා...." ඇය අසල ම වූ පැළය ඇල්ලීමට පහත් වෙද්දී, මහත, තර, කැත හංබෙල්ලකු එයින් ලිස්සා බිමට පෙරළී විණි. පැළ පේළිය දිගේ බලා ගෙන යද්දී ඇය තවත් හංබෙල්ලකු දුටුවා ය. ඉන් පසු ව තවත් එකෙක්... තවත් එකෙක්! උන් ඇගේ සලාද පැළ ඉතා හොඳින් භුක්ති විඳින දවස් ගාණකට උන්ට හොඳ කෑමක් ලැබී ඇති බව තර වූ සිරුරුවලින් හොඳින් ම පෙනෙන්ට විය.



"එලිසබෙත්?"

විශාල සුදු පෝරුවක් අතැ'ති ව ජෝන් පෙරී මතු විය.

"අයියෝ ජෝන්! බලන්න! බලන්න! ජරා හංබෙල්ලෝ. මහත, තඩි, කළු හංබෙල්ලෝ. උන් මගේ පැළ ඔක්කොම කාලා. උන් ඒවා විනාශ ම කරලා දාලා!"

ජෝන් ඇය ළඟට පැමිණ ඇය ගේ උරහිස වටා අතක් යවා ඇය ව සැනසුවේ ය.

"මං දන්නවා." ඔහු දුකින් කීවේ ය. ඔහු ඇගේ කලකිරුණු මුහුණ දෙස කාරුණික ව බැලුවේ ය. "අසරණ එලිසබෙත්! වැස්සක් එනවා කියලා දැන ගත්ත නිසා කලින් දවසෙ මං මේක තමයි ඔයාට කියන්න හැදුවේ. කොහේ ද ඔයා අහගන්න හිටියේ නැහැනේ, රොජර් ව දක්ක ගමන් ඔළුව ගිනි අරගෙන වගේ දුවන්න ගත්තා නෙ...."

"ඒ කියන්නෙ ජෝන් ඔයා දැන ගෙන හිටියා ද මෙහෙම දෙයක් වෙයි කියලා?"

"පරිසරය ගොඩක් තෙත් සහිත වුණා ම ගොඩක් වෙලාවට හංබෙල්ලෝ වසංගතයක් වගේ හැදෙනවා. ඒක නවත්තන්න කරන්න දේවල් තියෙනවා."

"ඒ වුණාට, ඒ මොනා ද ජෝන්? මට නම් තේරෙන්නෙ නෑ." එලිසබෙත් මුරණ්ඩු ලෙස කීවා ය. 'අනේ ඇයි මං ඒ වෙලේ ඒක අහගන්න හිටියෙ නැත්තේ, පැට්‍රික් ගේ මෝඩ ටෙනිස් මැච් එක ගැන දැන ගන්න තෙ පිස්සුවෙන් දිවුවේ. අයියෝ! ඇයි මං ජෝන් ගෙන් අහගන්න නැවතුණේ නැත්තේ!' ඇය සිතුවා ය. "ඔයාට මොනා ද කරන්න පුළුවන් ජෝන්?"

"එන්න මාත් එක්ක, මං පෙන්නන්නම්."

www.sinhalaelibrary.com

තවමත් ජෝගුව අතේ තබා ගෙන ම, ඔහු ඇය ව ගෙවත්තේ උණුසුම් ආවරණය වූ කොටසකට එක් කර ගෙන ආවේ ය. සිතිය හැකි උපරිම හොඳ පෙනුමෙන් යුක්ත වූ සලාද පැළ පේළි දෙකක් එහි දක්නට විය. පේළි දෙක සලාද පැළ වර්ග දෙකකින් සමන්විත විය. එක් පේළියක වටකුරු ඒවා ද අනෙකේ අණ්ඩාකාර ඒවා ද විය.

"හංබෙල්ලෝ මේවාට ඇවිල්ලා ම නැති තරම්!" එලිසබෙත් පුදුමයෙන් කීවා ය.

"මේවා මගේ," ජෝන් හෙමින් කීවේ ය. "මේවා හරි ම වැදගත්, ඒ නිසා මං මේවා හොඳට බලා ගන්නවා. වත්තෙ මේ පැත්තෙත් හංබෙල්ලෝ ඉන්නවා. ඒ වුණාට ගොඩක් ම නෑ. මේ පේළිය දිගේ එන්නකෝ මං පෙන්නන්නම්."

පළමු වන වතාවට, ජෝන් සමඟ පේළි දෙක අතරින් ඇවිද යද්දී, අමුතු විදිහේ භාජන පැළ පේළි අසල තැන්පත් කර ඇති බව එලිසබෙත් දුටුවා ය. ඔක්කොම ගාණ හයයි. ඒවා ගැඹුරු කුඩා භාජන ය, පරණ වී අබලන් වී ගොස් ඉවත දමන ලද සුප් භාජන ය. එලිසබෙත් දණහිස මත අත් තබා නැවී එකක් තුළට එබී බැලුවා ය.

"ඒක මැරිච්ච හංබෙල්ලන් ගෙන් පිරිලා!" ඇය හිරිකිතයෙන් කීවා ය.

"ඔව් ඔක්කොම," ජෝන් පිළිතුරු දුන්නේ ය. "උන් ඔක්කොම කිරිවල ගිලිලා! දැන් බලන්න මං කරන දේ. ඊට පස්සේ මං කියලා දෙන්නම්."

ජෝන් ඔහු ගේ අතේ වූ ජෝගුව බිමින් තැබුවේ ය. ඊට පසු, ඔහු ඉක්මනින් වරකට දෙක බැගින් භාජන හය ම එකතු කර ගෙන, ඒ භාජන තුළ කිරි, තෙවටු මැරුණු හංබෙල්ලන් අසල වූ කුණු ගොඩකට විසි කර, හිස් භාජන පෙර තිබූ තැන්වල ම තැබී ය.

"සමහර මිනිස්සු ඔය පලිබෝධ නාශක ගුළි දානවා හංබෙල්ලන් ව මරන්න." ඔහු ඇයට කීවේ ය. "ඒ වුණාට ඒක හරි ම දුෂ්ටයි, ඒවා තවත් සත්තුන්ට විෂ වෙන්න පුළුවන්. මේ විදිහ වැඩිය හොඳයි."



ඔහු එලිසබෙත්ට ජෝගුව අරන් දෙන ලෙස කීවේ ය.

"මේකෙ කිරි ද තියෙන්නේ?" භාජනයේ සුවඳ බලමින් ඇය ඇසුවා ය.

"ඒක ටිකක් පල් ගඳයි."

"ඔව් එහෙම තමයි." ජෝන් සිනාසෙන ගමන් කීවේ ය. "සෝකි නැන්දා ගාව ඇති තරම් පරණ කිරි තියෙනවා, ඇඹුල් වෙලා. ටිකක් පරණ වුණාට මගේ වැඩේට කමක් නෑ. ඉතින් මං කොහොම හරි යාප්පුවෙන් ඉල්ලා ගන්නවා."

ඔහු වගාව වටේ යමින් කැටි ගැසුණු කිරි හිස් භාජනවලට වත් කළේ ය.

"හංබෙල්ලෝ මේවාට සලාද කොළවලටත් වඩා කැමතියි. ඉතින් සලාද කොළ කනවා වෙනුවට උන් මේ භාජනවලට නැගලා මත් වෙලා ඉදිමෙනකම් කිරි බොනවා. ඊට පස්සේ එළියට එන්න ගැට්ටට නගින්න බැරුව ගිලිලා මැරෙනවා. වේදනාවක් දැනෙන්නෙ ම නෑ වගේ."

එලිසබෙත් හිස සැලුවා ය. ඇය හැම වෙලේ ම අලුත් දේවල් ඉගෙන ගනිමින් සිටියා ය.

ඇය කුණු ගොඩ අසලට ගොස් එහි වූ හංබෙල්ලන් ගොඩ දෙස උනන්දුවෙන් බලා සිටියා ය. 'වගාව විනාශ කරන්න ආපු හිස්දු මියගොල්ලන්ට සලාද කොළ නිසා ආයේ මොන කොළ වත් හම්බ වෙන්නෙ නෑ.' ඇය සිතුවා ය.

"ඒක නිසා වැඩ වැඩි වෙනවා," ඉන් පසු ජෝන් ඉතා මහන්සියෙන් හුස්ම ගත්තේ ය. ජෝන් දෙස මිතුදමින් බැලූ එලිසබෙත්ට පෙනුණේ ඔහු ඉතා මහන්සියෙන් ඉන්නා බවක් ය. "ලබන සතියෙන් හයියෙන් වහින්න ඉඩ තියෙනවා, වැඩ වැඩි වෙයි, ටිකක් අමාරු වෙයි. ඒක තමයි මං එදා කියන්න ගියේ එලිසබෙත්, වතුර දාන එක නවත්තපු ගමන් කරන්න තවත් රාජකාරියක් හම්බ වෙනවා කියලා."

ඔවුන් දෙදෙනා ම එලිසබෙත් ගේ වගාවේ ඉසිරී වී තිබෙන පුන්චිතුන් දෙස කනගාටුවෙන් බලා සිටින්නට වූහ.

තමා ගැනත් කැම්බෙල්ලන් ගැනත් තරහින් එලිසබෙත් තොල සපා ගත්තා ය. එදා ජෝන් කියන්න හදපු දේ අහගන්න හිටියා නම් ඇගේ වගාව තාමත් හොඳින් තිබෙන්නට තිබුණි. තරහ ම කාරණය නම් ඇය ඇගේ වගාව ගැන යහළුවන් සමඟ පුරසාරම් දොඩවා තිබීම ය. පන්තියේ ළමයි දැන් වගාව දැක්කොත් කොහොමට හිනා වෙනු ඇත්ද?

"මේ පාර රැස්වීමේ දී ඔයා වැඩිපුර සල්ලි ඉල්ලන්න ඕනි," ජෝන් කාරුණිකවෙන් කීවේ ය. "ඔයා වගාවකට ඇට ගන්න. මං හිතන්නේ දෙවෙනි වගාවකට නම් එච්චර පරක්කු නෑ. අගෝස්තු වෙන කොට ඒක ලස්සන වෙලා තියෙයි."

එලිසබෙත් බුරුත්තු ලෙස හිස වැනුවා ය. ඊළඟ රැස්වීමට තව සතියක් ම තියෙනවා, අගෝස්තු ව නිතම ළඟින එන්නේම වගේ ඇත. එතකොට ග්‍රීෂ්ම නිවාඩුවත් හමාර වෙලා තියෙයි. එතකොට කාට වත් ඒවා බලන්න හම්බ වෙන එකක් නෑ. ඇයට තමා ගේ සලාද තුළ වගාව වැඩෙන අයුරු බැලීමට නො හැකි ඇය ජෝන් ගේ ඒවා වත් අගය කළ යුතු යැයි එලිසබෙත් සිතුවා ය.

"මට අදහසක් ආවා, ජෝන්!" ඇය එකපාරට ම කෑ ගැහුවා ය. "මට දෙන්න ඔයා ගේ වගාව බලා ගන්න. ඒ වෙනුවට ඔයාටත් යොදන් වැඩ තියෙනවා නෙ කරන්න, අනෙක ඔයාට හරි ම මහන්සි පාටයි. දැන් ඔයා මට කියලත් දීලා නෙ තියෙන්නෙ කැම්බෙල්ලන් ගෙන් වගාව බේර ගන්න හැටි...."

"බෑ! කොහෙත් ම බෑ!" ජෝන් තියුණු ලෙස කීවේ ය.

පුංචි ගැහැණු ළමයාට කතා කර ගත නො හැකි විය. ඇයට කම්මුල් පහරක් වැදුණාක් මෙන් දැනුණි.



"ඔයා ආපසු යනවා ද එලිසබෙත්?" ඇය ආපසු යන්නට හැරෙනු දුටු ජෝන් වඩා මෘදු ලෙස ඇසුවේ ය. "ඔයාට පුළුවන් ද මේ ජෝඩුව මං වෙනුවෙන් හෝසි ආන්ටිට ගිහින් දෙන්න, කරුණාකරලා."

"බෑ! ඔයා ම ගෙනියන්න!" ඇය තරහෙන් බෙරිහන් දුන්නා ය. "ඇයි, ඔයාට බය හිතෙන්නේ නැද්ද මං ඒක බිම අතඇරලා කඩලා දායි කියලා."

එසේ කී එලිසබෙත් තරහෙන් පිපිහිරමින් එතැනින් දුවන්නට වූවා ය.

ජෝන් මගේ ම යාළුවා ජෝන්, මට ම කිවුවා තමන්ට නෑ කියලා. එක මොහොතකට වත් එයා ගේ වගාව බලා ගනියි කියලා විශ්වාස නෑ....! ඇති වූ කෝපය නිසා එලිසබෙත්ට තදින් ම හැඬීමට වුවමනා විය.

මෙය සිදු වී පැයකටත් පසු ව එලිසබෙත් පසු වූයේ ඒ ගැන කනස්සල්ලෙනි.

"හලෝ, එලිසබෙත්! කොහෙ ද ඔයා අතුරුදන් වුණේ?" ඇය විවේකාගාරයට ඇතුළු වෙද්දී යහළුවන් ඇසූහ.

ඔවුන් සියල්ලන් ම තැහැට් ගසමින් සතුටින් සිටිනු දැකීම ඇය ව පීඩාවට පත් කළේ ය. ඔවුන් සිටියේ සෙල්ලම් කාඩ්වලින් ගොඩනැඟිලි හදමින් ය.

"ඔය වැඩවලට හොඳ ම කාඩ් කුට්ටම් ගන්න බෑ කියලා දන්නවා නේද ඔයගොල්ලො?" එලිසබෙත් කීවා ය. "පරණ ඒවා විතරයි ගන්න පුළුවන්."

"ඒ වුණාට මේවායින් කරන කොට විනෝදෙ වැඩියි!" ජුලියන් සිනාසුණේ ය.

කාමරයේ අනෙක් කෙළවරේ සිටිය ද ඇරබෙලා මේ කතාව අසා ගෙන සිටියා ය.

"ඔයා දැන් මොනිටර් කෙනෙක් නොමෙයි නේ!" ඇය කීවා ය. "ඒක ඔයාට අමතක වෙලා වගෙයි එලිසබෙත් ඇලන්?"

www.sinhalaelibrary.com

එලිසබෙත් යන්නට ආපසු හැරුණා ය. වෙන දා මෙන් ඇරබෙලාට ඇනුම් පද කීමට වත් යහළුවන් සමග සතුටු වීමට වත් ඇයට වුවමනා නො වී ය.

"මට මහන්සියි," ඇය ඇත්ත ම කීවා ය. "මං අද ටිකක් කලින් නිදා ගන්නවා!"

"හානේ ඇත්ත ද!" ඇය ගිය පසු ඇරබෙලා කට ඇද කරමින් කීවා ය.

"ඔයාගොල්ලෝ දැක්කා ද එලිසබෙත් ගේ මූණෙ හැටි? හරියට දහදාහට අරන් කියට දීලා වගේ. මං හිතන්නේ ඔයා අද හවස කරපු විහිළුව එයාට හොඳට වැදිලා, පැට්‍රික්. ඔයා කිවුවේ එයා දැන් එච්චර වැදගත් නැති නිසා මැච් එක බලන්න එන්න ඕනි නෑ කියලා!"

"සමහර විට එයා ඔය ඇලිමැළි වෙලා වගේ ඉන්නේ මොනිටර් කෙනෙක් නොමෙයි නිසා වෙන්නැති!" පුදුමයකට මෙන් ඇරබෙලා ගේ දෝංකාරය වන රෝස්මරි අලුත් අදහසක් පළ කළා ය.

"ඔයාගොල්ලෝ ඇත්තට ම එහෙම හිතනවා ද?" පැට්‍රික් වැරදිකාරයකු ලෙස ඇසුවේ ය.

ජූලියන් පුටුවෙන් නැගිට අතපය දිග හැර ඈනුමක් ඇරියේ ය.

"මෝඩ වෙන්න එපා," ඔහු කීවේ ය. ඔහු ගේ ඇස්වල සමච්චල් පෙනුමක් විය. "එලිසබෙත් ගේ හිත හරි හයියයි, ඒ වෙන මොකකට හරි වෙන්නැති. වෙන මොනවා හරි හිතට කරදර දෙනවා ඇති."

ජූලියන් තනි ව ම සිනාසුණේ ය. අපේ එලිසබෙත් හැමදාමත් එහෙම තෙ,

# 4

## ජෝන් එලිසබෙත්ට රහසක් කියයි

ජූලියන් හරියට ම හරි! ඇත්තෙන් ම එලිසබෙත් එදින රාත්‍රියේ නින්දට ගියේ හංවෙල්ලන් ගැන අමනාපයෙනි, නමුත් ඊටත් වඩා ඇය ව කෝපයට පත් කළේ ජෝන් ඇය ව අපහාසයට ලක් කිරීම ය.

පසු දා උදෑසන ආපන ශාලාවේ දී ඇය හිතාමතා ම ඔහු ව මඟ හැරියා ය.

"සුබ උදෑසනක්, එලිසබෙත්," ඔවුන් උදේ ආහාර ගැනීමට පෙරපෙද්දී ජෝන් සිනාමුසු මුහුණින් කීවේ ය. "හොඳට ඉර පායපු ලස්සණ දවසක්."

ජෝන් ගැන ඇති වූ කෝපයෙන් තොල් වෙවුලද්දී ඇය හිතාමතා ම ඔහුට පිටුපස හරවා මේසය දෙසට වේගයෙන් ඇවිද ගියා ය. ඇගේ මේසයේ වූ සියලු ම දෙනා කතා කරමින් සිටියේ සෙනසුරාදාට යෙදී තිබෙන ටෙනිස් තරගය ගැන ය.

"වැස්ස නැවතුණ එක හොඳයි නේද?" රෝස පාට කම්මුල් ඇති කැත්ලීන් කීවා ය. "ඔයා එහෙම හිතන් නැද්ද එලිසබෙත්?"

www.sinhalaelibrary.com

එලිසබෙත් කිසිවක් කීවේ නැත. ඇයට ජෝන් ගේ හැසිරීම මතක් වීමෙන් ආයෙත් තරහා යාගෙන එන්නට විය. 'ජෝන් කතා කරපු හැටි. හරියට මුකුත් වුණේ නෑ වගේ කතාව,' ඇය තනි ව ම සිතුවා ය.

එලිසබෙත් ඊයේටත් වඩා නිශ්ශබ්ද බව හැමෝටම පෙනෙන්නට විය.

"මං ඊයේ විහිළුවක් කළේ, එලිසබෙත්." උදේ ආහාරය අවසන් වෙද්දී පැට්‍රික් කීවේ ය. "ඔයා අද හවස ඇවිත් ටෙනිස් මැච් එක බලනවා නේද?"

ඇය හිස සැලූ නමුත් පැට්‍රික් කී කිසි දෙයක් ඇයට හරිහැටි ඇසුණේ නැත. ඇය සිතමින් සිටියේ වෙනත් දෙයක් ගැන ය.

"ඇත්තෙන් ම පැට්‍රික්."

ඇය ශාලාවෙන් පිටතට පැමිණෙද්දී බලාපොරොත්තු නො වූ දෙයක් සිදු විණි.

ජෝන් ටෙරී, ඇය එන තෙක් ශාලාවෙන් පිටත බලා සිටිනු එලිසබෙත් දුටුවා ය.

"මට ඔයත් එක්ක ටිකක් කතා කරන්න ඕන එලිසබෙත්."

ඔහු ඇය ව කොරිඩෝව දිගේ අතින් ඇද ගෙන ගොස් අසල වූ හිස් පන්ති කාමරයකට තල්ලු කළේ ය.

"ඉක්මනින් කරන්න, ඇතුළට යන්න. කාට වත් ඇහෙන්න හොඳ නෑ."

පුදුමයට පත් වී සිටි එලිසබෙත්ට ඔහුට විරුද්ධ වීමට පවා අමතක විය. ජෝන් ගැන ඇගේ තිබුණ කෝපය සෙමෙන් දිය වෙමින් තිබුණි. මොකක් ද මේ වෙන්නෙ? ඔහුට ඇයට කීමට ඇති මෙතරම් වැදගත් කාරණාව කුමක් ද?

"දැන් බලන්න, එලිසබෙත්," ආරක්ෂාකාරී ලෙස දොර වැසූ ජෝන් කීවේ ය. "ඊයේ හවස මං ඔයා ගේ හිත රිද්දන්න හිතුවේ නෑ. ඔයා හිතන්න ඇති මං මහ නපුරු



දුෂ්ට කෙනෙක් කියලා. මං දන්නවා ඔයා මගේ පාක්ෂිකව බලා ගන්න ඉල්ලුවේ කරුණාවන්තකමට කියලා. ඒ වුණාට මට ඔයා ගේ කට වහන්නයි ඕන වුණේ. මං හිතුවා ඔයා මොනවා හරි කියන්න ඕන්නැති දෙයක් කියයි කියලා."

"කියන්න ඕන නැති දෙයක්?" ගැටලු සහගත ලෙස එලිසබෙත් එය ම කීවා ය. ජෝන් ගැන ඇගේ තිබූ කෝපය මේ වන විට සම්පූර්ණයෙන් ම වගේ නැති වී ගොස් තිබිණි.

"බලන්න එලිසබෙත් ඔයාට රහසක් රකින්න පුළුවන් ද? හරි ම වැදගත් රහසක්. අනු ම තැරමින් මට හරි ම වැදගත් එකක්. මේ ඉස්කෝලෙ කිසි ම කෙනෙක් මේ ගැන දන්නෙ නෑ."

එලිසබෙත්ට කුතුහලයක් මෙන් ම ආඩම්බරයක් ද දැනෙන්නට විය.

"මොකද බැරි මට රහසක් රකින්න!" ඇය ආඩම්බරයෙන් උත්තර දුන්නා ය.

"හරි එහෙනම් දිවුරලා පොරොන්දු වෙන්න!"

එලිසබෙත් පපුව මත කුරුසිය ඇඳ පොරොන්දු වුවා ය.

"හරි. එහෙනම් මේක තමයි රහස...."

ඔහු කටහඬ බාල කර සියල්ල පැහැදිලි කළේ ය. ජෝන් තරඟයක් සඳහා අයදුම්පතක් පුරවා තිබිණි. ගමේ පැවැත්වෙන සංදර්ශනයේ දී ඔහු ගේ සලාද පැළ වර්ග දෙක විශේෂ කුසලානයක් දිනා ගනු ඇතැයි ඔහු විශ්වාස කරයි. සංදර්ශනය තව සති දෙකකින් ආරම්භ වීමට නියමිත ය. එනම්, පාසල් වාරය මැද නිවාඩුවට ඔන්න මෙන්න තිබිය දී ය. අත්වැඩ, වඩුවැඩවලට එහි දී පදක්කම් ලබා දෙන අතර ම වයස අවුරුදු දහසයෙන් පහළ කෙනෙකු විසින් වවන ලද හොඳ ම වගාවට එහි දී රිදී කුසලානයක් පිරිනැමීමට නියමිත ව ඇත. ඒ වගාව පලතුරු, මල් පැළ හෝ එළවළු වගාවක් විය හැකි ය.

ජෝන් දක්ෂ පිරිමි ළමයෙකි. ඔහු මේ දේවල් කරන්නේ ඔහු ගේ ම ප්‍රසිද්ධියට නො වේ.

"මොකක් හරි වාසනාවකින් මගේ සලාද පැළ මේ කප් එක දින්නොත් ඒක මුළු ඉස්කෝලෙට ම ආඩම්බරයක් වේවි. මේ ගමේ අය හිතන්නේ අපි බිබිලා වගේ හැමදෙනාවා කියලා. මේක අපි දින්නොත් ඒක එහෙම නෙමෙයි කියලා එගොල්ලන්ට තේරෙයි. අපිටත් පුළුවන් ඇගේ කුණු සා ගෙන සත් හාරලා හොඳ හොඳ දේවල් වවන්න කියලා එගොල්ලෝ දැන ගනීවි."

"ඒක ගමේ පත්තරේටත් වැටෙයි," එලිසබෙත් ප්‍රීතියෙන් කෑ ගැසුවා ය.

"හැමෝම දැන ගනීවි මේ ඉස්කෝලේ කොච්චර හොඳ ද කියලා. අනෙක අපිට අපි වෙනුවෙන් ම කොච්චර දේවල් කරන්න දීලා තියෙනවා ද කියලා..."

ඇය එකවර ම නැවතුණා ය.

"ඉතින් ඇයි ජෝන් මේක රහසක් විදිහට තියා ගන්නෙ මං නම් කැමතියි මේක හැමෝටම කියලා සතුටු වෙන්න...."

"කියන්නෙපා එහෙම නෑ." ඔහු ඇය වෙත දරුණු බැල්මක් හෙළුවේ ය.

ඔහුට මේ තරගය කෙතරම් වැදගත් ද යන්න එකෙණෙහි ම ඇයට වැටහිණි. තරගය පරාජය වුවහොත් ඔහුට එය දරා ගැනීමට අපහසු වනු ඇත. ඔහු පරාජය වූ බව අනෙක් සියල්ලන්මත් දැන ගත හොත් ඔහුට එය දරා ගැනීම තවත් අපහසු වනු ඇත.

"මොකක් හරි ලක් එකකින් මං මේක දින්නොත්, මට හැමෝම ව පුදුම කරන්නයි ඕනේ. පොරොන්දු වෙන්න ඔයා මගේ රහස ආරක්ෂා කරනවා කියලා."

"මං පොරොන්දු වෙනවා," ඇය හදවතින් ම කීවා ය. "මං දිවුරලා පොරොන්දු වෙනවා..."

"මං ඔයාට මේක කිවුවේ, මොකද.... ඊයේ රෑ.... ඔයා තේරුම් ගන්න ඕනී."

"මට හරි සතුටුයි ජෝන්, ඔයා මේක කිවුව එක ගැන," එලිසබෙත් කීවා ය. පෙර දින ඇගේ හැසිරීම ගැන එලිසබෙත් ඇත්තට ම කනගාටු වුවා ය.



"මට සමාවෙන්න, ඊයෙ රෑ මගේ කුහුල් කෝණේටයි, නපුරු විදිහට හැසිරුණ එකටයි. ඔයා මට සමාව දෙනවා නේද ජෝන්? මට දැන් හොඳටොම තේරෙනවා. ඇත්තට ම ඔයාට මාව විශ්වාස කරන්න බෑ නෙ එයාව බලා ගන්න කියලා. ඒක එච්චර ම වැදගත් එකේ..."

ජෝන් ඇය දෙස විස්මයෙන් බැලුවේ ය. ඔහු ඇගේ කතාවට බාධා කළේ ය.

"අයියෝ එලිසබෙත්, ඔයාට තාම තේරෙන්නෙ නෑ නෙ. මං හිතන්නේ මං ඔයාට හරියට පැහැදිලි කරන්න නැතුව ඇති. මං ඔයා ව විශ්වාස කරනවා පැළ බලා ගන්න. ඔයා මට ඉන්න දක්ෂ ම උදව්කාරියක් නෙ. ඔයාට සමහර වෙලාවට දේවල් අමතක වෙනවා තමයි, ඒ වුණාට ඔයා ගොඩක් ඉක්මනට ඉගෙන ගන්නවා. නෑ, ඒක නෙමෙයි කාරණේ."

ඇගේ මුළු සිරුර ම පුරා උණුසුම් ප්‍රීතියක් පැතිර යන්නට පටන් ගත්තා සේ එලිසබෙත්ට හැඟුණි.

"ඒ තමයි තරඟෙ කොන්දේසි." ඔහු කීවේ ය. "මං අයදුම්පතක් පුරවලා තියෙන්නේ, ඒකෙ මං සහතික වුණා මොකක් හරි මම වවන දේ මගේ ම දෙයක් කියලා. පරිසරයෙන් ලැබෙන උදවු හැර කිසි ම කෙනෙක් උදවු නො කරපු දෙයක් කියලා." ජෝන් කීවේ ය. "ඔයාට තේරෙනවද එලිසබෙත්? කාට වත් බෑ මට මේකට උදවු කරන්න. මං වෙනුවෙන් ඒවාට වතුර වත් දාන්න එපා!"

ඔවුන් හිස් පන්ති කාමරයෙන් පිටතට විත්, තමන් යා යුතු පැතිවලට යද්දී එලිසබෙත් මහ හඬින් සිනාසුණේ ඇති වූ ප්‍රීතිය නිසා ම ය. ඇය ජෝන් ව සම්පූර්ණයෙන් ම වැරදියට තේරුම් ගෙන තිබිණි. ඇය හැසිරී ඇත්තේ මෝඩ, හිතුවක්කාර ගැහැනු ළමයෙකු ලෙසිනි. ජෝන් ඔහු ගේ රහස ඇයට කීම ගැන එලිසබෙත් සතුටු වූ අතර ම එය හොඳින් ආරක්ෂා කිරීමට ද සිතා ගත්තා ය.

එදින ම උදෑසන ජූලියන් ඇයට අසුන් පිට යාමට කතා කළේ ය. එලිසබෙත් ඉතා ප්‍රීතියෙන් ගීතයක් ගයමින් සිටිනු දුටු ජූලියන්ට ඇගේ මේ වෙනස ගැන පුදුම සිතුණි. ඔවුන් අසුන් පිට නැගී සෙමින් පැද්දෙමින් ඉදිරියට යද්දී ජූලියන් ඇගේ මේ වෙනස ගැන අසා දැන ගැනීමට තීරණය කළේ ය.

"එලිසබෙත්, ඔයා දැන් ටිකකට කලින් හිටියේ දහට අරන් සීයට දීලා වගේ." ඔහු පුදුමයෙන් නමුත් සෙමින් කීවේ ය. "මොකක් හරි ප්‍රශ්නයක් ද?"

"නෑ ඒක මේ වැරදි වැටහීමක්." එලිසබෙත් ගයමින් සිටි ගීතයේ තාලයට උත්තර දුන්නා ය.

"හරි" ජූලියන් සිනාසුණේ ය. "මට හිතා ගන්නයි තිබුණේ."

දිවා ආහාරයේ දී, එලිසබෙත් ගේ මේසයේ සිටි සියල්ලන් ම කතා කළේ ටූර්විලී සමඟ යෙදී තිබෙන තරගය ගැන ය. ආරාධිත පාසල සවස දෙකට පැමිණීමට නියමිත ව තිබිණි. පළමු පන්තියේ ළමයින් සියල්ලන් ම පැට්‍රික් පාසල් කණ්ඩායමට ක්‍රීඩා කිරීම ගැන ආඩම්බර වූහ.

"මං අද මගේ උපරිමෙන් ම කරන්න ඕනි." පැට්‍රික් ඉතා උනන්දුවෙන් කීව ද ඔහු කලබල වී ඇති බවක් පෙනෙන්නට විය. "මං කලින් මැච් එක හොඳට සෙල්ලම් කරා නම්යි, ඒ වුණාට මේකෙ දී මං හොඳට කරේ නැත්නම් රොජර්ට ආයෙත් ටීම් එකේ තැන හම්බ වෙනවා."

"අපි හැමෝම ඇවිත් ඔයා ව උනන්දු කරනවා, පැට්‍රික්." එලිසබෙත් කීවා ය.

දිවා ආහාරයෙන් පසු ටෙනිස් ඇඳුම්වලට මාරු වීමට පැට්‍රික් කලින් ම පිටත් වූයේ ය. පැට්‍රික් ගේ අලුත් ටෙනිස් කමිසයේ දැන් අලුත් ලාංඡනයක් මසා ඇත. එය නිල් පාට අතර එමගින් ඔහු දෙවන පෙළ කණ්ඩායමට අයිති ක්‍රීඩකයකු බැව් සලකුණු කෙරුණි. ඔහු ඔහු ගේ වටිනා ටෙනිස් පිත්ත දැන් සුරක්ෂිත ව තබා තිබිණි. ටෙනිස්



ඇඳුම්වලට මාරු වීමට පෙර තවත් ටිකක් පුහුණු වීමට පැට්‍රික්ට වුවමනා විය.

අනෙක් ළමයින් තවමත් කතා කරමින් හැම මේසයක් ම වටා වී සිටියහ. ඒ අතරතුර කුඩා බස් රථයක් පාසල් ගේට්ටුවෙන් ඇතුළට එන අයුරු ඔවුහු ජනේලය තුළින් බලා සිටින්නට වූහ.

"මන්න ඒගොල්ලෝ එනවා!" එලිසබෙත් සියල්ලන්ට ම ඇසෙන ලෙස කීවා ය. "මේ මැච් එක නම් හරි ම ජොලි එකක් වෙයි."

"මොකද ඔයා එක පාරට ම ඔච්චර සන්තෝසෙන් ඉන්නේ?" එලිසබෙත් ගේ වෙනස දුටු ඇරබෙලා නපුරු ලෙස කීවා ය.

"අනේ! මං එහෙම ද?" එලිසබෙත් සමච්චලයට මෙන් ඇසුවා ය. "ඇත්තට ම කියනවා නම් ඇරබෙලා බක්ලි, මං එහෙම වුණත්, ඒක ඔයාට අදාළ නෑ. ඔයා ඔයා ගේ වැඩක් බලා ගන්න." ඇය දුෂ්ට ලෙස කීවා ය.

'මොනිටර් කෙනෙක් නෙමේ වුණා ම හොඳට ඉන්න ඕනෙ නැතේ, සමහර වෙලාවට ඒකෙ වාසිත් තියෙනවා.' එලිසබෙත් සිතුවා ය.

"ඕක නවත්ත ගන්න ඔය දෙන්නා," කැත්ලීන් කීවා ය. "අපි ඉක්මනට ගිහින් පිට්ටනිය ළඟ ම තැනක් අල්ලගමු. එතකොට අපිට මැච් එක හොඳට බලා ගත හැකි."

ආපන ශාලාවෙන් පිටතට පැමිණෙද්දී, පැට්‍රික් ඔවුන් දෙසට හති දා ගෙන දුව ගෙන එන අයුරු ඔවුහු දුටුවහ.

ඔහු තවමත් ටෙනිස් ඇඳුම්වලට මාරු වී නො සිටි අතර ඔහු ගේ කොණ්ඩය සම්පූර්ණයෙන් ම අවුල් වී මුහුණ සුදුමැලි වී ඔහු කෙරෙන් උමතු ආකාරයක් දිස්විය.

"මගේ ටෙනිස් රැකට් එක....!" ඔහු ඉතා ශෝකයෙන් කීවේ ය.

"මං ඒක හැම තැන ම හෙව්වා. ඒක නැති වෙලා. කවුරු හරි ඒක අරගෙන."

www.sinhalaelibrary.com

# 5

## එලිසබෙත් තරඟින්

පැට්‍රික් එලිසබෙත් ගේ මුහුණට ම කීවේ ය. ඔහු සිටියේ හොඳට ම කලබල වී ය.

"එලිසබෙත් මේක මොකක් හරි විහිළුවක් ද?" ඔහු ඇසුවේ ය. "ඔයා මගේ රැකට් එක හංග ගෙන ද ඉන්නේ? ඔයා එහෙම කරා නම් කරුණාකරලා මට ඒක දෙන්න." ඔහු අයැද්දේ ය. "මැච් එක පටන් ගන්න තව විනාඩි පහළොවක් වත් නෑ."

ඇය ඔහු දෙස පුදුමයෙන් බලා සිටින්නට වූවා ය. "මං දන්නෑ පැට්‍රික් ඔයා මොනවා දොඩවනවාද කියලා." ඇය දරුණු ලෙස කීවා ය.

"ඇත්තට ම එයා දන්නෙ නෑ!" ජූලියන් තම සොහොයුරාට බැණ වැදුණේ ය.

"ඔයා හිතනවා ද එයා ඒක හංගයි කියලා. ඔයාට පිස්සු ද?"

"ඇයි මතක නැද්ද එයා එක පාරක් මගේ රැකට් එක පඳුරකට විසි කළේ!"



"ඒක මීට වඩා වෙනස්. ඔයාට තේරෙන්නේ නැද්ද?" ජූලියන් වේගයෙන් කතා කරන්නට වූයේ ය. "මේ බලන්න, ඔය මෝඩ කතා කියන එක නවත්තා ගන්නවා ද පැට්‍රික්? හොඳට හිතන්න. ඔයා ඒක කොහේ හරි දාන්න ඇති?" ඔහු කීවේ ය. "තත්ත්වේ තවත් නරකට හැරුණොත් මං ඔයාට මගේ රැකට් එක දෙන්නම්...."

"මට ඔයා ගේ කෙහෙල්මල ඕනෙ නෑ!" ඔහු කඩා පැන්නේ ය. "මගේ එකෙන් විතරයි මට හොඳට සෙල්ලම් කරන්න පුළුවන්, ඔයා ඒක හොඳට ම දන්නවානේ. මං ඒක කොහේ වත් දැම්මෙ නෑ. ක්‍රීඩා මඩු තියෙන කබඩ් එකේ උඩ ම තට්ටුවේ ඒක තියෙන්න ඕන. හැමෝම දන්නවා මං ඒක එතැන තියනවා කියලා. මං ඔයාට කියන්නේ ඒක එතැන නෑ කියලා!"

මෙය කිසි ම කෙනෙකු සිදු වෙතැයි බලාපොරොත්තු නො වූ දෙයකි. පළමු වසර ළමයින් කනගාටුවෙන් හා පුදුමයෙන් පැට්‍රික් වටා රොක්වන්නට වූහ. ඔවුන්ට වුවමනා වූයේ පැට්‍රික් හොඳින් සෙල්ලම් කරනු බැලීමට ය. ඒ වෙලාව එන තෙක් ඔවුන් බලා සිටියේ ඉතා වුවමනාවෙන් ය.

මේ අතරතුරේ දී කළු කෙස් සහ කොළ ඇස් ඇති සොහොයුරන් දෙදෙනා පොරයකට සූදානම් වෙමින් එකිනෙකාට රවා ගන්නට වූහ. මෙය ඉව වැටුණු කැත්ලීන් ඔවුන් දෙදෙනා ව දෙපසට තල්ලු කළා ය.

"හොඳ සිහින්, රණ්ඩු කරන එක නවත්තා ගන්නවා ද? රණ්ඩු කරලා මේ ප්‍රශ්නෙ විසඳන්න පුළුවන් නම් හරි ම ෂෝක්නේ. අපි හැමෝම හිතලා මොනවා හරි කරමු."

"ඔව් අපි ඔක්කොම එකතු වෙලා පැට්‍රික්ට එයා ගේ රැකට් එක හොයලා දෙමු." කැත්ලීන් ව අනුමත කරමින් බෙලින්ඩා කෑ ගැසුවා ය.

සොහොයුරා ගේ නපුරු හැසිරීම නිසා ජූලියන් ගේ හිතේ ඇති වූ කෝපය කෙමෙන් අඩු වන්නට වූ අතර ම, ඔහු ගේ බලාපොරොත්තු සුන් වූ මුහුණ දැකීමෙන් කනගාටුවට

පත් ජූලියන් ඉවසිලිවන්ත ව අවස්ථාව පාලනය කිරීමට ඉටා ගත්තේ ය.

"පැට්‍රික්, යන්න ගිහින් ඉක්මනට ඇඳුම් දා ගන්න." ඔහු ව සෙමින් තල්ලු කරන ගමන් ඔහු කීවේ ය. "ඔයාට දැන් වෙලා නෑ. අපි කට්ටිය රකට් එක හොයන්නම්. බය වෙන්න එපා. ඒක වැඩි ඈතක වෙන්න බෑ. මට විශ්වාසයි අපිට ඒක හම්බ වෙයි කියලා."

පැට්‍රික් කිසිවක් කතා නො කර ම එකඟ වෙමින් අසරණ ලෙස ඉක්මනින් අඩි තබමින් ඇවිද යන්නට විය.

ජූලියන් සියල්ලන් ව ම පිත්ත සෙවීමට සූදානම් කළේ ය.

"මාර්ටින්, පැට්‍රික් ඇඳුම් මාරු කරන කාමරේ ඉන්න අතරේ ඔයා ගිහින් එයා ගේ නිදා ගන්න කාමරේ බලන්න. මොන විදිහට නෑ කිවුවත් එයා සමහර වෙලාවට රකට් එක ඇඳ යටට දානවා. කැත්ලීන් ඔයාට මගෙත් එක්ක එන්න පුළුවන් ද? අපි ක්‍රීඩා බඩු තියෙන කබඩ් එක හොඳට සෝදිසි කරලා බලමු. සමහර විට රකට් එක ඈත කෙළවරට ම විසි කරලා ඇති. එලිසබෙත්, ඔයාට පුළුවන් ද පැට්‍රික් පුරුදු වෙන බිත්තිය දිහා ගිහින් පොඩ්ඩක් බලන්න? එයා එතැන පුරුදු වෙච්ච හැටි ගැණින් ඉන්නවා නෙ. එතැන අලා ඇවිත් ද දන්නෑ."

ඉක්මනින් ජූලියන් යහළුවන් සියල්ලන් ම හැකි වූ වේගින් පිත්ත සෙවීමට පාසල වටා විසිර යැව්වේ ය. සමහර දෙවන පන්තිවල සිසුන් ද හැකි වූ පිත්ත සෙවීමට කැමැත්තෙන් ම ඉදිරිපත් වූහ.

පැට්‍රික්ට සමාව දිය යුතු යැයි එලිසබෙත්ට නො සිතුණි. ඒ පැට්‍රික් ඇයට අපහාස කළ ආකාරය ගැන ඇය තුළ කෝපයක් හා කරදරකාරී හැඟීමක් ඇති වූ නිසා ය.

"එයා කොහොමත් ද හිතන්නේ මං ඒ වගේ විහිළුවක් කරයි කියලා. ඇරත් මෙච්චර වැදගත් මැච් එකකට ඔන්න මෙන්න කියලා තියෙද්දී. අනෙක එයා හිතුවත් එච්චර



ළමයින් ගොඩක් මැද්දෙදි එයා එහෙම කිවුව එකට නම් සමාව දෙන්න ම බෑ. අනෙත් අය මං ගැන මොනවා හිතුවා ද දන්නෑ? මං මගේ කරහකාරයෙකුට වත් ජීවිතේට එහෙම කරලා නෑ. එහෙව් එකේ මං පැට්‍රික්ට එහෙම දුෂ්ට විහිළුවක් කරයි කියලා එයා මොන එහෙකට හිතුවා ද. මහ මෝඩයෙක්" හිතේ දුක නිසා ඇය තනි ව ම කතා කළා ය.

පැට්‍රික් වැටී ඇති අවාසනාවන්ත තත්ත්වය නිසා ඇය ඒ සියල්ල අමතක කර දමා ඉක්මනින් ශාලාවෙන් පිටතට පැමිණ පැට්‍රික් ගේ ප්‍රියතම ස්ථානය වන පාසලේ දකුණු පැත්තෙහි ඇති බිත්තිය දෙසට ඉක්මනින් දුවන්නට වූවා ය. පැට්‍රික් මේ බිත්තිය අසලට ඒමට ඉතා ප්‍රිය කරයි. ස්ට්‍රෝබෙරි පඳුරු අසල සිට බෝලය දිගින් දිගට ම බිත්තියට ගසමින් ඔහු ඉතා මහන්සියෙන් හා උනන්දුවෙන් පුරුදු වන්නේ මෙතැන ය. ජූලියන් ගේ කතාවේ ඇත්තක් ඇත. අන්තිමට ආපු වෙලාවේ සමහර විට රකට් එක මෙතැන අලා යන්නැති.

එලිසබෙත් පිත්ත සොයමින් බිත්තිය අසල සෑම තැනක ම ඇවිද්දා ය. ඇයට හැකි සෑම අතුමුල්ලක ම එය සෙව්වා ය. නමුත් එහි පිත්තක් තබා අඩු ම තරමේ එහි සලකුණක් වත් නො වී ය.

අන්තිමේ දී ඇය අසල වූ ස්ට්‍රෝබෙරි පඳුරුවලට ද එබිකම් කර බැලුවා ය. පැට්‍රික් බෝල්ල හොයන්න පඳුරු එහා මෙහා කරන්න රකට් එක ගත්තා වෙන්න බැරි ද? හෝලි පඳුරුවල හරියට උල් කටු තියෙනවා. ඒ නිසා රකට් එකකින් අතු එහා මෙහා කරන එක අතින් කරනවට වඩා ලේසියි. එලිසබෙත් කල්පනා කරන්නට වූවා ය.

ඒ අතර ළමයින් එකිනෙකා සමඟ අධෛර්යයෙන් කතා කරමින් ශාලාවෙන් පිටතට එන ශබ්දය එලිසබෙත්ට ඇසිණි.

"වැඩක් නෑ! මේ බිල්ඩිමේ නම් ඒක නෑ!"

"එයා ඒක කොහේ හරි එළියේ අලා ඇති. අපි ගිහින් එළියේ හොයලා බලමු!"

පැට්‍රික් බෝලය හොයන්න ඒක ගත්ත නම්, එලිසබෙත් නැවතත් කල්පනා කරන්නට වූවා ය. මොකක් හරි එයාට බාධා කරන්න ඇති. සමහර විට ඉස්කෝලේ බෙල් එක. ඉතින් එයා හදිස්සියට රැකට් එක බිම දාලා දුවන්නැති. ඊට පස්සෙ කොහෙ ද දැම්මෙ කියලා අමතක වෙන්නැති. ඒ වගේ දෙයක් වෙන්න පුංචි හරි ඉඩක් තියෙනවා.

ඇය ඉතා උනන්දුවෙන් පඳුරු පීරමින් සොයන්නට වූ නමුත් පිත්ත පෙනෙන්නට වත් නො වී ය.

මේ සෙවීම ඵලක් නො වන බව තේරුම් ගත් එලිසබෙත් තර්බෙරි පඳුරු අතරින් හෝලි ගසේ කටුවලට සිරුණු ඇඹිල්ල උරමින් පිටතට පැමිණ ටෙනිස් පිට්ටනිය දෙස බැලුවා ය.

චූට්ටිලි කණ්ඩායම පිට්ටනියට පැමිණ සිටිති. ඔවුන් ටෙනිස් පිතිත් රැගෙන පිට්ටනියට එක් වෙමින් සිටින අයුරු එලිසබෙත් දුටුවා ය.

විනාඩි පහළොව අවසන් වී තිබිණි!

ඇය පැට්‍රික් ව දුටුවා ය. ඔහු සුදු ටෙනිස් ඇඳුම් හැඳ පිට්ටනියට ඇතුළු වන දොරටුව අසල සිටගෙන පිට්ටනිය දෙස ඔහේ බලා සිටියි. පැට්‍රික් ඉතා කනගාටුවෙන් අධෛර්යයට පත් වී ඇති බව පෙනෙන්නට විය. පැට්‍රික් ව එසේ දැකීමෙන් එලිසබෙත් ගේ සිතේ ඔහු ගැන අනුකම්පාවක් ඇති වන්නට විය. ඒ සමඟ ම ජූලියන් ඈත ජනේලයකින් එබී කෑ ගහනු ඇයට ඇසිණි.

"වැඩක් වෙන්නෑ, පැට්‍රික්. අපිට ඒක හොයා ගන්න බෑ. මං ඔයාට මගෙ රැකට් එක ගෙනත් දෙන්නම්. මං දැන් ම ම එනවා. ඔහොම ම ඉන්න හරි ද?"

එලිසබෙත් එතැනින් ඉවත් ව සෙමින් නමුත් කල්පනාකාරී ව පාසල් ගොඩනැගිල්ල වටා ඇවිද යන්නට වූවා ය. තරගය නැරඹීම වෙනුවට ඇගේ ඇස් පාසලේ සෑම අනුමුල්ලක් ම සෝදිසි කරන්නට විය. මේ සිද්ධිය සැක සහිත වෙමින් තිබිණි.



'මට පැට්‍රික් එක්ක තරහ ගියා එහෙම කතා කරද්දී,' ඇය සිතුවා ය. 'ඒ වුණාට ඒක විදිහකට එයා හරි, කවුරු හරි එයාට හරි ම නරක විහිළුවක් කරලා. කවුරු හරි එයා ගේ රැකට් එක අරගෙන කොහේ හරි හංගලා හොයා ගන්න බැරි වෙන්න ම. ඒක තමයි වෙන්න පුළුවන් එක ම දේ. එහෙම නැත්නම් මේ වෙන කොට අපි කාට හරි ඒක හම්බ වෙන්න එපැයැ. අයියෝ පව් පැට්‍රික්!'

'මට එයා වෙනුවෙන් ඒක හොයලා දෙන්න පුළුවන් නම්,' එලිසබෙත් සිතන්නට වූවා ය. 'ඉක්මනට ම හොයලා දෙන්න පුළුවන් නම්.'

ඇගේ ඇස් කුස්සිය පිටුපස වූ විශාල මිදුල ඉතා සියුම් ව සෝදිසි කරන්නට විය. මේ පැත්තේ එය තිබිය නො හැකි වුවත්, එලිසබෙත් කිසි ම අවස්ථාවක් පැහැර නො හැර අනුමුලුවලට එබෙමින් වගේ ම සෝදිසි කරන්නට වූවා ය. ඇය කොහෙත් එය සෙව්වා ද කියතොත් කුණු බක්කිවලට පවා එබෙමින් සෝදිසි කළා ය. ඒ අතර ම ඇය නැවතත් කල්පනා කරන්නට වූවා ය. කවුරු හරි කෙනෙක් රැකට් එකක් හංගනවා නම් කොහේ හංගයි ද? කුණු බක්කියක නම් කොහෙත් ම වෙන්න බෑ. ඒක මහ මෝඩ අදහසක්. වෙන කොහේ ද?

ඇය මිදුල දිගේ ඇවිද ගොස් වාහන නවතා ඇති පැත්තට ආවා ය. චූට්ටිලිවලින් පැමිණි තුවා බස් රථය අසල නවතා තිබෙනු ඇය වටපිට බලද්දී දුටුවා ය.

ඊට පිටුපසින් වූයේ ගරාජයන් ය. බොහෝ ඒවා විවෘත කර තිබිණි.

"ඒක නම් හොඳ තැනක් ටෙනිස් රැකට් එකක් හංගන්න." එලිසබෙත් තීරණය කළා ය. "මිස් කෙනෙක් ගේ ගරාජ් එකක් ඇතුළේ කවුරු වත් හීනෙකින් වත් හිතන්නෑ මෙහෙ හොයන්න තියා පළාතකට වත් එන්න. මොකද මේ පැත්තට එන්න ළමයින්ට තහනම්නේ."

www.sinhalaelibrary.com

තමා ගොස් ඒවා තුළ බැලිය යුතු ද, නැද්ද යන්න එලිසබෙත්ට තීරණය කිරීමට අපහසු විය. අවස්ථාවේ හැටියට නම් ඇය කෙසේ හෝ රැකට් එක සොයා ගත යුතු ය.

ඇය වටපිට බැලුවා ය. කිසිවකු පෙනෙන තෙක් මානයක නො වී ය. ඇය ඇඟිලි තුඩින් හොරෙකු මෙන් ඇවිදිමින් අසල වූ වාහනය පසු කරන්නට වූවා ය. එය මිස් බෙස්ට් ගේ පරණ කාලේ කිල් පාට සැලූන් වාහනයයි. එහි දිලිසෙන ලෙස තීන්ත ආලේප කර තිබුණ ද පුරුදු පරිදි අපවිත්‍ර ව තිබිණි.

"විහිළුවක් නෙ, මිස් හරියට ඩිකිය වහලා නෑනේ!" එලිසබෙත් තමාට ම කියා ගත්තා ය. එය අගල් කිහිපයක් ම ඇරී තිබිණි. පාසලේ ප්‍රධාන ගුරුතුමිය මෙතරම් නො සැලකිලිමත් වීම ඇයට සිතා ගැනීමට අපහසු තරම් විය. "අනෙක් දවසේ මිස්ට ලයිට්ලුත් දාලා යයි යන්න. මං මේක මිස් වෙනුවෙන් වහලා දාන්න ඕනි."

දඟ ගැහැනු ළමයා ඩිකියේ හැඬිලයෙන් අල්ලා එය වැසීමට උත්සාහ කළා ය. නමුත් එය නො වැසුණි. එය වැසීමට නො හැකි වන ලෙස මොකක් හෝ ඇතුළෙන් සිර වී ඇති බවක් ඇගේ අතට දැනිණි. බාධා කරන්නේ කුමක් දැයි බලා එය ඉවත් කිරීමේ අදහසින් ඇය ඩිකිය හොඳින් ඇරියා ය.

එය ටෙනිස් රැකට්ටුවකි.

ඇය එය එළියට ඇද එය දෙස පුදුමයෙන් බැලුවා ය.

"මේක පැට්‍රික් ගේ!" විස්මය නිසා ඇගේ මුව විවර විණි.

"පුදුමෙනුත් පුදුමයි... මේක කොහොමද මෙතෙන්ට ආවෙ!"

"කවුරු හරි රැකට් එක මිස්ට් ගේ වාහනේ ඩිකියෙ හංගන්න හදලා තියෙනවා."

"කොහොම වුණත් ඒ කවුරු හරි අසාර්ථකයි...!" ඇය ප්‍රීතියෙන් කෑ ගැසුවා ය.



'බැංග්!' එලිසබෙත් උස් ශබ්දයක් නැගෙන ලෙස ඩිකියේ දොර තදින් වැසුවා ය. ඒ ශබ්දය ජෝසි හෝවා ව මුළුතැන්ගෙයින් පිටතට එළිගෙන ආවේ ය. 'එලිසබෙත් මොනා ද මෙතෙන කරන්නෙ!' ඇය කල්පනා කළා ය. 'එයා ආයෙමත් අර නිවටු දඟමල්ල වෙලා නෑ කියලා මං හිතනවා.'

එලිසබෙත් එක පිම්මට එතැනින් දුවන්නට වූවා ය. පැට්‍රික් ගේ රැකට් එක අතේ ඇති ව, ඇය ටෙනිස් පිට්ටනිය තෙක් ම දිවුවා ය. ප්‍රීතියත් කලබලයත් ඇගේ හද ගැස්ම වැඩි කර තිබිණි.

පැට්‍රික් ඔහු ගේ සගයා පිට්ටනියේ ඈත කෙළවරට වී පුරුදු වෙමින් සිටින අයුරු ඇය දුටුවා ය. තරගය ආරම්භ වීමට ඇත්තේ තවත් මිනිත්තු දෙකක් පමණි. ජූලියන් ගෙන් ඉල්ලා ගත් රැකට්ටුවෙන් පුරුදු වෙමින් සිටින පැට්‍රික් ගේ මුහුණ පසුර කලකිරුණු කෙනෙකු ගේ මෙන් විය.

එලිසබෙත් තමා ගේ රැකට් එක කොහේ හෝ සඟවා ඇති බව දැන් ඔහුට සක්සුදක් සේ පැහැදිලි ය. ඒ සමග ම පැට්‍රික්ට ඇගේ කටහඬ ඇසිණි.

"පැට්‍රික්!" ඇය කෑ ගැහුවා ය. ඇය උඩ පනිමින් ප්‍රීතියෙන් "මට ඒක හම්බ වුණා."යයි රැකට් එක වනන්නට වූවා ය.

මෙය දුටු පැට්‍රික් පිම්මේ ඇය ව හමු වීමට ගේට්ටුව අසලට දුව ගෙන ආවේ ය. සියල්ලන් ම ඔවුන් දෙදෙනා දෙස බලා සිටින්නට වූහ.

"ඔන්! පැට්‍රික්, එච්චර පොඩ්ඩ වෙලාවකින් මට ඒක හම්බ වුණ එක හරි ම ලසි නේද?" ඇය සිනාවකින් කතා කිරීමට පටන් ගත්තා ය.

"හන්, හන්, හා...! හරි ම විහිළුයි. හරි ම අහම්බයක්නේ!" ඔහු තරහින් දෙවුර ගැස්සුවේ ය.

ඔහු ජූලියන් ගේ රැකට් එක වේගයෙන් ඇගේ කකුල් දෙක ළඟට විසි කර, ඔහු ගේ රැකට් එක ඇගේ අතින් උදුරා ගත්තේ ය. ඔහු ගේ මුහුණ කෝපය නිසා තද පාටට හැරී තිබිණි.

ගෙවුණු විනාඩි කිහිපය ඔහු ගේ ජීවිතයේ නරක ම විනාඩි කිහිපය විය. එය ඔහුට දරා ගැනීමට නො හැකි තරම් විය.

"ඒක ලොකු පුදුමයක් නොවේ, එලිසබෙත් ඇලන්." ඔහු ඇයට කදුරු ලෙස මුණින්නේ ය. "මං හිතන්නේ ඔයා මාර ම දුෂ්ටයි. මගේ ජීවිතේට ම වෙලා තියෙන දුෂ්ට ම විහිළුව මේක තමයි."

එලිසබෙත් පුදුමයෙන් ආපස්සට පැන්නා ය. ඇයට කතා කර ගැනීමට කොහෙත් ම නො හැකි විය. 'පැට්‍රික්ට පිස්සු හැදී ගෙන එනවා වත් ද?' ඇයට සිතිණි.

එවෙලේ ම කොළ පාට උස විනිසුරුවන් ගේ අසුනේ සිටි මිස්ටර් වර්ලෝ අවධානය ලබා ගැනීමට හයියෙන් අත්පුඩියක් ගැසුවේ ය.

"වෙලාව ඉවරයි!" ඔහු කතා කළේ ය. "වුඩ්විලි ටොස් එක දිනුම්. ඒගොල්ලෝ සර්විස් එක ගන්නා. කරුණාකරලා පිට්ටනියට එන්න පැට්‍රික්, මැච් එක පටන් ගන්න දෙන්න."

පැට්‍රික් පිත්ත රැගෙන එලිසබෙත්ට රවා පිට්ටනියට දිවුවේ ය. එලිසබෙත් සෙමින් බිමට නැවී පිත්ත අහුලා ගෙන, කනගාටුවෙන් යාළුවන් හා එක් වීමට ඇවිද ගියා ය.

බෙලින්ඩා හා කැත්ලීන් ඇය වෙනුවෙන් පිට්ටනිය ඉතා හොඳින් පෙනෙන තැනක අසුනක් වෙන් කර තිබිණි. ඔවුහු ඇගේ පිටට තට්ටු කළහ. ජූලියන් ද එසේ කළේ ය. ජූලියන් ඔහු ගේ පිත්ත ආපසු ඉල්ලා ගත්තේ ය. "මං හිතන්නෑ එයාට මං මේක ආපසු හදිසියක දී වත් දෙයි කියලා."

"කොහෙන් ද ඔයාට ඒක හම්බ වුණේ?" කැත්ලීන් කෙඳිරී ය.

"මිස් බෙස්ට් ගේ වාහනේ ඩිකියේ තිබිලා." එලිසබෙත් එපා වූ ස්වරයෙන් කීවා ය.

බෙලින්ඩා හිකි හිකි ගෑවා ය.

"මොකක්! බෙස්ට් ගේ වාහනේ ඩිකියේ තිබිලා. මට නම් විශ්වාස නෑ!"



ඔවුන්ට ඉදිරියෙන් වාඩි වී සිටි ඇරබෙලා ඇගේ පියකරු මුහුණ පිටුපසට හරවා ඇය දෙස ඔලොක්කුවට බැලුවා ය.

"බොගල් ඇද බාන්න එපා, එලිසබෙත් ඇලන්."

"ඒ වුණාට ඒක තිබුණේ එතැන ම තමයි." එලිසබෙත් කෝපයෙන් කීවා ය.

"එතැන තිබුණා, තිබුණා, තිබුණාමයි. මං ඇතුළේ බැලුවා එතැන තිබුණා!"

"ඒ කියන්නේ ඔයා බෙස්ට් ගේ වාහනේ ළඟින් නිකම් හිටිලා ඇවිද ගෙන ගියා, යන ගමන් ඔයාට නිකම් ම හිතුණා ඩිකිය ඇරලා ඇතුළේ බලන්න?" රෝස්මරි විශ්වාස කිරීමට අපහසු ලෙස කීවා ය. ඇය වාඩි වී සිටියේ ඇරබෙලා ළඟ ය. "ඔයා දැන ගෙන ඉන්නැති ඒක එතැන තියෙනවා කියලා. එහෙම නැතුව කොහොම ද එහෙම වෙන්නෙ!"

"ආන්...! සමහර විට ඔයා දකින්න ඇති ඔයා ම ඒක එතැන හංගනවා!" ඇරබෙලා අවඥාවෙන් කීවා ය. "ඒ වගේ විහිළුවක් කරන එක හරි ම කුහකකමක්. ඊටත් වඩා නරක හරියට මුකුත් නො කළා වගේ ඉන්න එක. ඔයාට බය හිතෙනවා ද දැන්? දැන් වත් ඔයාට කරපු දුෂ්ට වැඩේ බරපතළකම තේරෙනවා ද? ඔයා නිසා මුළු ඉස්කෝලෙන් බාගයක් ම පැය කාලක් නිස්සෙ රැකට් එකක් හොය හොයා රස්තියාදු වුණා. ඔයාට නම් මොකද? අද පැට්‍රික් හොඳට සෙල්ලම් කළේ නැත්නම් ඒක ඔයා ගේ වැරැද්ද එලිසබෙත් ඇලන්."

"ඔයා කොහොම ද එහෙම කියන්නෙ!" ඇය හුස්ම හිර වී ගෙන එන නිසා වේගයෙන් කතා කරන්නට වූවා ය.

"කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න, ළමයි!" මිස් රේන්ජර් කීවා ය. ඇය ඔවුන් ගේ පන්තිභාර ගුරුතුමියයි. ඇය තරගය නැරඹීමට පැමිණියේ ඒ වෙලාවේ ම ය. "මැච් එක යන අතරේ ඔයගොල්ලෝ කතා කරන්න එපා. ඒක හරි ම අවිනීතයි. හරි දැන් හැමෝම මැච් එකට අවධානය දෙන්න."

ඇරබෙලා ජයග්‍රාහී ලෙස ඇගේ මනා ව පීරන ලද අවුල් නො වූ හිස, එලිසබෙත් වෙතින් ඉවත් කර තරඟය දෙසට සම්පූර්ණ අවධානය යොමු කළා ය. පැට්‍රික් ලකුණක් ගත් සෑම විට ම ඇය හැමෝටම පෙනෙන සේ තදින් අත්පුඩි ගැසුවා ය.

තරඟයට ක්‍රීඩා කරනු වෙනුවට පැට්‍රික් වෙනදාටත් වඩා හොඳින් ක්‍රීඩා කළේ ය. නැති වූ පිත්ත ආපසු ලැබීම ඔහු ගේ ආත්මවිශ්වාසය වැඩි කර තිබිණි. නමුත් ඔහු වෙනදාටත් වඩා හොඳින් ක්‍රීඩා කිරීමට තවත් එක් කාරණයක් විය. එනම්, එලිසබෙත් ඇලන් විසින් කරන ලද දුෂ්ට විහිළුව නිසා ඔහු කෝපාවිෂ්ට වී සිටීම ය. ඒ කෝපය තද පහරවල්වලට හරවමින් ඔහු දක්ෂ ලෙස ක්‍රීඩා කළේ ය. පැට්‍රික්ව ද්‍රවමිතා වූයේ එලිසබෙත් ඇලන්ට තමා කවුරුන් දැයි පෙන්වීමට ය. දැන් ඇය දැන ගනීවි පැට්‍රික් කියන්නෙ කොයි තරම් දක්ෂයෙක් ද කියලත්, එයා ගේ මෝඩ විහිළුවලට අල්ලගන්න හරියන කෙනෙක් නෙමෙයි කියලත්.

වාඩි වී අවසිහියෙන් මෙන් සිදු වූ සියල්ල නැවත කල්පනා කරමින්, දුකින් සිටි එලිසබෙත්ට මේ වෙනස නො පෙනිණි. දැන් දුක් විඳීමේ වාරය ඇය ගේ ය. ඇය කිසිවෙක් හා කතා නො කර තනිව වාඩි වී සිටියා ය. නමුත් ඇතුළතින් පැට්‍රික් කෙරෙහි වූ වෛරය පැසවමින් තිබිණි. ඇරබෙලා ගැන කිව හොත්, ඇගේ ඇනුම් පද නිසා එලිසබෙත්ට ඇය ව පිළිකුල් වී තිබිණි.

ඉක්මණින් තරඟය අවසන් විය. වයිට්ලීෆ් දෙවන කණ්ඩායම තරඟ වට දෙකකින් ඉතා හොඳින් ජය ගත්තේ ය. පැට්‍රික් පිට්ටනිය මැද සිනහ වෙමින් ප්‍රීතියෙන් දඟලු අතර ඔහු ගේ පාසලේ ළමයින් බිස්කට්වලින් සංග්‍රහ කරන්නට වූවා ය. වයිට්ලීෆ් පාසලේ තරඟ යෙදී ඇති දිනවලට සංග්‍රහ කිරීම බාර නායකයෙක් හෝ නායිකාවක් තෝරා ගනු ලබයි. ඔවුන් සංග්‍රහ කිරීමට අවශ්‍ය බිස්කට්, රස කැවිලි හෝ කේක් තරඟයට පෙර දින පිළියෙල කර තමා පසු දින තරඟය



අවසානයේ දී සංග්‍රහ කළ යුතු ය. එලින් ගේ රසකැවිලි භාජනයෙන් වැඩි කොටසක් කෑවේ පැට්‍රික් ය.

සියල්ල ම එසා වූ ලෙස බංකුවක පස්සට වී වාඩි වී සිටින කොහොතු ඔහු හදිසියේ ම දුටුවේ ය. පළමු වතාවට, එලිසබෙත් ගැන තමා වැරදියට සිතා ඇතැයි ඔහුට ඒත්තු යන්නට විය. ඇය ඇත්තට ම තමා වෙනුවෙන් ම කොණ්ඩ වී එය සොයා දුන්නේ නම් සිදු වූ සියල්ල හරි ම භයානක ය. අනෙක් අය ගෙන් මේ ගැන ඇසීමට ඔහු තීරණය කළේ ය.

හදිසියේ ම නැවතත් උස් ප්‍රීති ඝෝෂාවක් පැතිර යන්නට විය. වයිට්ලීෆ් පළමු කණ්ඩායම ද ඔවුන් ගේ තරඟ දිනා තිබිණි. එලින් නැවතත් කවිමුඩියේ රසකැවිලි සංග්‍රහ කිරීමට භාජනය ද රැගෙන දුවන්නට වූවා ය. තරඟ දෙක ම අවසන් ය. වයිට්ලීෆ්වලට තරඟාවලියේ ජය හිමි විය.

පැට්‍රික් ගේ පිත්ත පිළිබඳ ආරංචිය ලැව් ගින්නක් මෙන් පාසල පුරා පැතිර යන්නට විය. "එලිසබෙත් කතා හදලා කියනවා."යැයි ඇරබෙලා හැකි සියල්ලන්ට ම කීවා ය. ඇරබෙලා ළමයින් අතර පැතිර වූ කතාව නම්, "එලිසබෙත් බොරුවට පෙන්නනවා එයා ඒක මිස් බෙස්ට් ගේ වාහනේ ටිකියේ තිබිලා හොයා ගත්තා කියලා! රැකට් එකක් හොයන්න කවුද එච්චර දුර යන්නේ. අනෙක අපිට ඒ පැත්තට යන්නත් තහනම්නේ. එහෙම එකේ එයා ඇර වෙන කවුරුත් රැකට් එකක් හංගන්න එහෙ යයි ද? මිනක ද මයගොල්ලන්ට එලිසබෙත් මුම්මා ගෙන කතා නො කර හිටියා, පැට්‍රික් එයා මොනිටර් කෙනෙක් නෙමෙයි නිසා වැඩකට නෑ කියලා විහිළු කළාට. එයාට ඒකෙ පළිය ගන්න ඕන කියලා හිතෙන්නැති. එයා හිතපු නැති විදිහට පින්නෙනාම වුණ හින්දා දැන් කපටිකමට ඇඟ බේරා ගන්න හදනවා..."

ළමයින් ගේ කතාවල් බැලුම් හා සිනාවල් එලිසබෙත් ගේ කෝපය මුර මුරා නැංවීමට සමත් විය.

www.sinhalaelibrary.com

"දුක් වෙන්න එපා එලිසබෙත්, අපිට ඔයා ව විශ්වාසයි." කැත්ලීන් සෞම්‍ය ලෙස කීවා ය.

නමුත් එලිසබෙත් එකවර ම වාඩි වී සිටි තැනින් නැගිට්ටා ය. ඇයට එතැනට වී වාඩි වී ඇරබෙලා දුෂ්ට ලෙස අනෙක් ළමයින් ව අවුස්සන අයුරු බලා සිටීමට වුවමනා නො වී ය. ඇරබෙලා දැන් පැට්‍රික් සමඟ ද කතා කරයි. පැට්‍රික්ට පිත්ත සොයා දීමට ඇය කෙතරම් උත්සාහ ගත්තේ දැයි ඇය සිතුවා ය. අනුන්ට උදවු කිරීමට ගොස් තමා තමා ව ම විද්ද ගන්නා, මේක නම් හරි ම අවනම්බුවකි.

එලිසබෙත් කිසිවෙකු හා කතා නො කර ම පාසල දෙසට ඇවිද යන්නට වුවා ය. ඇය ව ලුහුබැඳ ආ ජූලියන් ප්‍රධාන ගේට්ටුව අසල දී ඇයට ඉස්සර විය. ජූලියන් ඇගේ බාහුවෙන් අල්ලා ගත්තේ ය.

"එලිසබෙත්!" ඔහු කීවේ ය. "කේන්ති ගන්න එපා. ඔයාට වුණත් තේරෙනවා නෙ බෙස්ට් ගේ වාහනේ ඩිකියේ තිබුණා කියන කතාව ටිකක් අමුතු. විශ්වාස කරන්න අමාරු කතාවක් කියලා. ඔයයි මායි හොඳ යාළුවෝ නො වුණා නම් මං වුණත් ඒක විශ්වාස කරන්නෙ නෑ."

"බොහොම ස්තූතියි." එලිසබෙත් ඔහු ව ගණන් නො ගෙන කීවා ය.

"ඔයා දන්නවානේ ඇරබෙලා ගේ හැටි. එයා කොහොමත් එහෙමයිනේ. මං දන්නෑ ඇයි එයා කතා හදලා කියලා අනෙක් අය ව අවුස්සන්නේ කියලා?" ජූලියන් බරපතළ ලෙස කීවේ ය.

"මං හිතන්නෑ කවුරු වත් එයා කියන මෝඩ කතා ගණන් ගනී කියලා." ජූලියන් නැවතත් කීවේ ය.

"සමහරු එහෙම කරනවා," එලිසබෙත් කීවා ය.

"ඔව්, මෝඩ අය."

"පැට්‍රික් හිතනවා මං රැකට් එක හැංගුවා කියලා, ඔය කතා ඇහුවා ම එයාට ඒක තවත් විශ්වාස වෙයි." ඇය කීවා ය.



"එහෙනම් එයත් මෝඩයෙක්, මාර එක්කෙනෙකු නෙ මටත් 'කසින්' කියන්න වෙලා තියෙන්නෙ. මට හරි ම හවහිංගිරාවක් එයා ගේ මේ මෝඩ වැඩ. මට දැන් ආයෙමත් හිතෙනවා එයා වයිටලීෆ් ඉස්කෝලෙට ආවේ නැත්නම් හොඳයි කියලා. එයා එන්න කලින් මං මිට වඩා සතුටෙන් හිටියා."

"මං එයාට වෛර කරනවා, කවම කවදා වත් එයාට නම් මගෙන් සමාවක් නෑ!" එලිසබෙත් තරහෙන් කෑ ගැසුවා ය.

ජූලියන් එලිසබෙත් ගේ අත අතහැර, ඔහු ගේ අත සාක්කුව තුළට රුවා ගනිමින් තමාට ම රවා ගත්තේ ය. බිම තිබූ කුඩා ගල් කැටයක් කල්පනාකාරී ව කකුලේ මහපටැඟිල්ලෙන් පෙරළූ ඔහු ඇගේ ඇස් දෙස බැලුවේ ය.

"කාරණේ තමයි එලිසබෙත්, ඔයා පැට්‍රික් ගේ රැකට් එක මිස් බෙස්ට් ගේ වාහනේ ඩිකියේ හැංගුවේ නෑ. ඒ වුණාට වෙන කවුරු හරි ඒක කළා. එහෙනම් කවුද ඒ, ඇයි එහෙම කළේ? මං හිතන්නේ අපි ඔයිත් කෙලින් ම ඒ පැත්ත ටිකක් සෝදිසි කළොත් හොඳයි. අපට මොකක් හරි හෝඩුවාවක් හම්බ වෙයි."

"අනේ, මං මොකට ද කරදර වෙන්නේ! කරදර වෙලා අහගන්න ඒවා මදිවට ද?" එලිසබෙත් මුමුණා ගන්වන ම කීවා ය.

"කාට හරි පැට්‍රික් ව ජේන්න බැරි නම් ඒක එයා ගේ වැරැද්ද, මට කමක් නෑ!"

"ඔව්, ඒක ඔයා ව කරදරේ දාන්නැති තාක්." ජූලියන් සන්සුන් ව කීවේ ය.

"මට ඇති කරදරයක් නෑ!" එලිසබෙත් කෑ ගැසුවා ය. "මට මං වැරදි නෑ කියලා ඇරබෙලා, පැට්‍රික් වගේ අයට පෙන්නන්න ඕනි නෑ. මගේ ඇත්ත යාළුවෝ දන්නවා මං ඒ වගේ දුෂ්ට විහිළු කරන්නේ නැති විත්තිය. මට ඒ ඇති."

ඒ වෙලේ ම කොරිඩෝව දිගේ තවත් පළමු වසර සිසුන් පිරිසක් ඇවිද එන්නට විය. ඒ අතර ඇරබෙලා ද විය.

ඇය සියල්ලෙන් ම හොඳට ම හෙම්බත් වී සිටියා ය. ඇයට ඇගේ පන්තියේ යෙහෙළියන් වත් දැකීමට වුවමනා නො වී ය.

'ඒගොල්ලන්ට ඕනි තරම් වෙලා ඕනි විදිහට ඒක ගැන කතා කරපුදෙන්. මං ගොවිපළට ගිහින් වැඩ කරලා සැහැල්ලුවෙන් ඉන්නවා. මං ජෝන් ටෙරී ව හම්බ වෙලා එයාට කියලා මොකක් හරි වැඩක් ඉල්ලන් කරන්න ඕනි.' ඇය ගොවිපළට ඇවිද යන ගමන් සිතුවා ය.

නමුත් ඇය එහි යන විට ජෝන් ටෙරී පෙනෙන්නට වත් නො වී ය.

6

# ජූලියන් හෝඩුවාවක් සොයයි

මෙය එලිසබෙත්ට ප්‍රහේලිකාවකි. සෙනසුරාදා සවස් වරුවේ ජෝන් ටෙරී ව ගොවිපළේ දක්නට නො ලැබීම නම් පුදුමයකි. ඇය හැකි සෑම තැනක ම ඔහු ව සෙව්වා ය. හරිතාගාරය තුළ, ආම්පන්න දමන මඩුව තුළ. අවසානයේ ඇය කොම්පෝස්ට් පොහොර ගොඩ වටේත් බැලුවා ය.

සෑම තැනක ම ඔහු ව සෙවූ ඇය අන්තිමට ඔහු ගේ අනර්ඝ සලාද පැළ වගාව දෙස බැලුවා ය. ඒවා තවත් හොඳින් වැඩී නිරෝගී ව ඉන්නා බවක් පෙනෙන්නට විය. ඇය වගා පේළි දෙක අතරින් ඇවිදිමින් කිරි දැමූ භාජනවලට එබී බැලුවා ය. හංබෙල්ලන් කිහිප දෙනෙක් ඒවායේ සිර වී සිටිනමුත් තවත් බොහෝ දෙනෙකුට එහි ඉඩකඩ ඉතිරි වී තිබිණි. මේ වන විට පොළොව වියළී ගොස් ඇති නිසා කෙටවූ කළු සතුන් පොළොව තුළට ගොස් ඇත. නැවත ඔවුන් මතුපිටට ඒමට නම් හොඳ වැස්සකින් පොළොව තෙත් විය යුතු ය. එක් වගා පේළියක කෙළවරක වල් පැළෑටියක් සලාද පැළයකට කිට්ටුවෙන් වැඩී තිබෙනු දුටු එලිසබෙත් එය උදුරා දැමීමට පහතට නැමෙද්දී, හදිසියේ ම ඇයට යමක් මතක් විය.

www.sinhalaelibrary.com

ඇයට එය සම්පූර්ණයෙන් ම අමතක වී තිබිණි. ඇය ඉක්මනින් කෙළින් වූවා ය. සති දෙකකින් පැවැත්වෙන තරඟයට පෙර ඇය කිසි ම අයුරකින් ජෝන් ටෙරී ගේ පැළවලට උදවු නො කළ යුතු ය. අවු ම තරමින් වල් පැළෑටියක් ගැලවීමක් හෝ නො කළ යුතු ය. එය තරඟ කොන්දේසිවලට පටහැණි ය. ජෝන් ටෙරී ගේ රහස දන්නා පාසලේ සිටින එක ම කෙනා තමා වීම ගැන එලිසබෙත් ආඩම්බර විය.

"පීටර්! සොෆියා! ඔයගොල්ලෝ ජෝන් ව දැක්ක ද?" බඳුම් හැන්දක් සහ මුල්ලුවක් ගෙන ගොවිපළට ඇතුළු වන බාලාංශ සිසුන් දෙදෙනා දැක එලිසබෙත් ඇසුවා ය.

"නෑ." පීටර් පිළිතුරු දුන්නේ ය. "අද වැඩ බලන්නෙ තෝමස්."

"අපි දෙන්නා සක්කාලි ගස් වගේට අලුතෙන් වේළිච්ච පිදුරු අතුරන්න උදවු කරන්න යන්නේ." සොෆියා පැහැදිලි කළා ය. "පරණ පිදුරු ඔක්කොම වැස්සට තෙමිලා තිබිත්, ඒ වුණාට මුලින් ම අපි බෝංචි පැළ වගේ වැවිලා තියෙන වල් පැළ උදුරනවා."

එවිට ම විල් බැරෝවක පිදුරු පටවා ගෙන ඉහළ පන්තියක සිසුවෙක් එනු පෙනිණි.

"වැස්සා ම තියෙන කරදරේ ඕක තමයි." තෝමස් සිනාසුණේ ය. "එතකොට වවන පැළවලටත් වැඩිය ඉක්මනට වැඩෙනට හැකි වල්පැළ වැවෙනවා. ඔයා මොනා ද හිතන්නෙ එලිසබෙත්?"

"ඔව් මං හිතනවා!" ඒ මදිවට හංබෙල්ලෝ ගොළුබෙල්ලෝ වගේ එවුනුත් වැඩි වෙනවා. එලිසබෙත් කියුවා ය. "ඒ වුණාට තෝමස්, ජෝන්ට අද මොකද වුණේ? මං එයා ව හැම තැන ම හොයා හොයා හිටියේ."

"ඇයි ඔයා දන්නෙ නැද්ද?"

පිරිමි ළමයා විල් බැරෝව තබා ඇය වෙතට ඇවිද ආවා ය.



"එයා ව වෙන ම කාමරයක වෙන් කරලා [illegible] ගෙන ඉන්නේ. එයාට සරම්ප ද, පැපොල ද මොනා ද [illegible] හැදිලා. මට හරියට ම මතක නෑ. ඒ කොහොම වුණත් ඒක බෝවෙන ලෙඩක්! එයා ගේ කාමරේ ළඟට වත් කාට වත් යන්න දෙන්නේ නෑ. බෝවෙන හින්දා මුළු ඉස්කෝලෙට ම හැදෙයි. එහෙම වුණොත්!"

"අයියෝ, අසරණ ජෝන්!" එලිසබෙත් සුසුමක් හෙළුවා ය.

"බය වෙන්න දෙයක් නෑ. ලෙඩේ එච්චර බරපතළ නෑ. සතියකින් දවස් දහයකින් විතර එයාට හොඳට ම හොඳ වෙයි. ඊට පස්සෙ මේට්‍රන් එයාට එළියට යන්න දෙයි."

එලිසබෙත් ඒ ආරංචිය පිළිගත්තේ ඉතා අපහසුවෙනි. කලින් දවසේ ජෝන් ඉතා දුර්වල පෙනුමකින් සිටි අයුරු ඇයට මතක් විය. ඒ අසනීප වීමට ආ නිසා වන්නට ඇතැයි ඇයට දැන් සිතිණි.

"එයා සනීප වෙලා එනකම් මං තමයි මෙතැන වැඩ බලන්නේ." තෝමස් ආඩම්බරයෙන් කීවේ ය. "කොහොම වුණත් ජෝන් මේට්‍රන්ට පණිවිඩයක් දීලා මට දෙන්න කියලා. එයා කියනවා එයා ගේ පාත්ති පැත්තට කාට වත් යන්න දෙන්න එපා කියලා. අනෙක කිසි ම දෙයක් අල්ලන්න වත් එපාලු. කොටින් ම කිවුවොත් ඒක හැමෝටම තහනම් ප්‍රදේශයක්."

ඇය හිස වැනුවා. එසේ කීමට හේතුව ඇය දැන සිටියා ය.

ඇය නැවතත් ජෝන් ගේ සලාද පැළ ගැන සිතන්නට වූවා ය. ඇය කාංසියෙන් අහස දෙස බැලුවා ය. සතියක් හරි දවස් දහයක් හරි! ඒක හරි ම දිග කාලයක් නෙ. බැරි වෙලා වත් හයියෙන් වැස්සොත් හංබෙල්ලෝ ආයෙත් මතු වෙයි. එහෙම වුණොත් කිරි උගුල් අලා වගාව හොඳට බලා ගන්න ඕනි! එහෙම නැත්නම් දිගට ම රස්නෙ තිබ්බොත් ගස් මැලවිලා ඉරිලා යයි. එහෙම නො වෙන්න නම් හොඳ

www.sinhalaelibrary.com

ගාණට වතුර දාන්න ඕනි! වගාව බලා ගන්න කෙනෙක් නැතුව දවස් දහයක් ගියොතින් වගාවක් ඉතුරු වෙන එකක් නෑ. මොනා කරන්න ද මන්දා, මට නම් ඒක හිතා ගන්නත් අමාරුයි.

"ඔයා අපේ උදවු වෙන්න ද එලිසබෙත්?" කල්පනා කරමින් සිටි එලිසබෙත් ගෙන් තෝමස් එවිට ඇසුවේ ය. "ඔයා කැමති ද සොෆියයි පිටරුයි එක්ක වල් උදුරන්න?"

"ආ....න්, එලිසබෙත් ඇවිත් අපිට උදවු කරන්නකෝ, අනේ එන්නකෝ," සොෆියා ප්‍රීතියෙන් දුව'විත් එලිසබෙත් ගේ අතින් අල්ලා ගනිමින් කීවා ය. "බලන්නකෝ සොච්චර වල් ගස් හැදිලා ද කියලා!"

එලිසබෙත් සිනාසුණා ය. "මං කැමතියි සොෆියා!"

පැයක් පමණ ගොවිපළේ වැඩ කිරීමෙන්, පසු එලිසබෙත් ගේ ඇඟට හොඳ සනීපයක් දැනිණි. පොළොවත් සමඟ වැඩ කිරීමෙන් අමුතු ආකාරයක විවේකයක් ලැබෙන්නේ ය. සෞම්‍ය හිරු එළියේ, සොබාදහමේ මිහිරි නාදයන් හා සුවඳ අවට පැතිරෙද්දී, කොබෙයියන් කූඩුවල සිට හඬ තලද්දී, මී මැස්සන් වෝල්ෆ්ලවර් මල් මත 'ගුම්', 'ගුම්' නද දෙද්දී කාන්සියෙන් සිටීම නම් කොහෙත් ම කළ නො හැකි දෙයකි.

පසු ද උදය ආහාරයේ දී, පිටත ඉතා සෞම්‍ය කාලගුණයක් තිබෙනු දැකීමෙන් එලිසබෙත් සතුටු වූවා ය.

මේ විදිහට ඊළඟ දවස් දහය ම තියේවි ද? යාන්තම් ම ඉර එළිය එන්න ඉඩලා තිබිලා වැස්සත් වැටුණොත් ජෝන් ගේ වගාව හොඳට පරිස්සම් වේවි. ඔහු කාමරයේ සිර වී සිටින්නාක් සොබාදහම එයා වෙනුවෙන් වගාව බලා ගනීවි.

එදින සවස එලිසබෙත් නැවතත් ජූලියන් සමඟ අසුන් පැදීමට ගියා ය.

"මං ඊයේ ගිහින් හෝඩුවාවක් බැලුවා, එලිසබෙත්!" ඔහු එතරම් උනන්දුවකින් තොර ව කීවේ ය. "ඔයා ගියාට පස්සෙ මං බෙස්ට් ගේ කාර් එක වගේ හොඳට බැලුවා."



ඔවුන් දෙදෙනා සෙමින් පැද්දෙමින් අසුන් පිට යමින් සිටියහ.

"ආ....න්, ඔයාට මොනාවා හරි හෝඩුවාවක් හම්බ වුණා ද?" එලිසබෙත් තරමක උනන්දුවකින් ඇසුවා ය.

"පරණ ක්‍රිස්ප් පැකට් එකක් විතරයි හම්බ වුණේ. ඒක වාහනේ යට තුලනට ඒහාට මෙහාට විසි වෙවී තිබුණා." ඔහු කලිසම් සාක්කුවෙන් ගෙන පොඩි වුණු පරණ ක්‍රිස්ප් පැකට් එකක් එලිසබෙත්ට දුන්නේ ය. එහි තරු හා ඉරි ඇඳ තිබුණ අතර අන්කල් සෑම් ගේ පින්තූරයක් ද විය. "මේක ඇමෙරිකන් ජාතියක්, Southern favourits කවදා වත් අහලා නෑ ඒ නම. ඔයා අහලා තියෙනවා ද?"

එලිසබෙත් ක්‍රිස්ප් පැකට්ටුව දෙස බලා 'නැත' ලෙස හිස වැනුවා ය.

"මේක සමහර විට කුණු බක්කියෙන් විසි වෙච්ච එකක් වෙන්නැති මේකේ කිසි තේරුමක් නෑ." ඇය කීවා ය.

"ඇත්ත." ජූලියන් එකඟ විය.

"ඒ වුණත් මං හිතුවේ, රොජර් මුලින් මේකට වැරදිකාරයා වෙන්න බැරි ද? පැට්‍රික් ව වට්ටන්න එයා මේක කරා වෙන්න බැරි ද? එතකොට එයාට ආයෙත් සෙකන්ඩ් ටීම් එකේ තැන ගන්න පුළුවන්නේ."

එලිසබෙත් මූණ ඇද කර ගත්තා ය. ඇය මිතන දෙගෙන රොජර් මුලින් ගැන සිතන්නට විය. ඔහු හොරෙන් හොරෙන් හොස් වටපිට බලා පින්න සැලැවීම ඇයට සිතා ගැනීමට නො හැකි තරම් විය.

"වෙන්න බෑ?" ඇය පිළිතුරු දුන්නා ය.

ඔවුන් දෙදෙනා සතුටුවෙන් එකි'නෙකා දෙස බැලූහ.

"මොකක් හරි විදිහකින්." එලිසබෙත් සිනාසුණා ය. "එහෙම වුණත් මං නම් ගණන් ගන්නෙ නෑ."

කාරණය නම් එලිසබෙත් සහ පැට්‍රික් තව දුරටත් එකි'නෙකා සමඟ කතා නො කිරීම ය. ඔවුන් දෙදෙනා එකි'නෙකා ව ගණන් නො ගැනීමට තීරණය කර අවසන් ය.

www.sinhalaelibrary.com

දිවා ආහාරයේ දී, පැට්‍රික් තමා ගැන පුරසාරම් දොඩවන්නට විය. මේ සති අන්තයේ දින් ටෙනිස් තරගයක් පාසලේ ම යෙදී තිබුණ අතර වයිට්ලීෆ් පාසල ශාන්ත ෆෙයිත්ස් (St Faiths) පාසල සමඟ තරග වැදීමට නියමිත ය. පැට්‍රික් නැවතත් දෙවන පෙළ කණ්ඩායමට තෝරා ගෙන තිබිණි. ඒ ඔහු වුඩ්විලි සමඟ තිබූ තරගයේ දී හොඳින් ක්‍රීඩා කර ජය ගත් බැවිනි. දැන් දැන් කණ්ඩායමේ ඔහුට ඇති ස්ථානය සුරක්ෂිත වෙමින් තිබිණි.

"මිස්ටර් වර්ලෝ මට කිවුවා ඊළඟට සංග්‍රහ බාර මොනිටර් වෙන්න කියලා." පැට්‍රික් මාටින්ට කීවේ ය. "ඒ ඇයි දන්නවා ද? මං එදා මැච් එක හොඳට සෙල්ලම් කරපු එකට තෑග්ගක් හැටියට. ඒක මට කරපු ගෞරවයක් නොවෙයි ද?"

"ඔයා නම් කියාවි." මාටින් කීවේ ය.

"ඒක වීකත් අමාරු මැච් එකක්." පැට්‍රික් නැවත කතා කරන්නට විය. "ඒ වුණාට හුඟක් ම අමාරු වෙන්නෙ ටර්ම් එක මැද තියෙන මැච් එක."

"ඔයා මේ කියන්නෙ හිස්ලීන් ග්‍රීන් එක්ක තියෙන මැච් එක ගැන ද?" රෝස්මේරිත් යමක් තමන් දන්නා බව පෙන්නුවා ය.

ග්‍රීෂ්ම සෘතුවට යෙදී ඇති ටෙනිස් තරඟවලින් ඉතා ම තියුණු තරඟ වනුයේ වයිට්ලීෆ් පාසල සහ හිස්ලීන් ග්‍රීන් අතර යෙදී තිබෙන තරඟයි, හේතුව නම් කණ්ඩායම් දෙක ම කරට කර සිටීම ය.

"ඔව්." පැට්‍රික් හිස වැනුවේ ය. "ගොඩාක් අම්මලා තාත්තලාත් එනවා ඒක බලන්න. ඒ මැච් එකට මගේ නම තියා ගන්න නම් මං ෆෙයිත්ස් එක්ක හොඳට සෙල්ලම් කරන්න ඕනි."

"මට විශ්වාසයි ඔයා හොඳට සෙල්ලම් කරයි කියලා පැට්‍රික්." ඇරබෙලා ඉතා විනීත ව කීවා ය. "මොකද දැන් ඔයා රැකට් එක හොඳට පරිස්සම් කරගෙනත් නෙ ඉන්නෙ."



මේසයේ සිටි අනෙක් කිසිවෙක් ඒ කතාවට හවුල් වූයේ නැත.

එළිපිට නො වුවත් පන්තිය පිල් දෙකකට බෙදී ඇති බව දැන් හොඳටෙම පැහැදිලි ය. කුඩා වූ එක් පිලකට අයිති වූයේ පැට්‍රික්, ඇරබෙලා, රෝස්මරී හා මාටින් ය. මේ හතර දෙනාත් තවත් ඒ පැත්තට මේ පැත්තට පැද්දෙන කිහිප දෙනෙකුත් තදින් ම විශ්වාස කරන්නේ එලිසබෙත් පැට්‍රික්ට ඉතා දුෂ්ට විහිළුවක් කර දැන් එය පිළිගැනීමට අකමැත්තෙන් සිටින බව ය. ඔවුන් කියන්නේ කාලයක් ඇය පාසලේ දඟමල්ල ලෙස ප්‍රසිද්ධ වූයේ නිකමට නො වන බව ය.

අනෙක් ලොකු පිලට අයිති වූයේ ජූලියන්, බෙලින්ඩා, හැරල්ඩ් හා තවත් බොහෝ අයයි. ඔවුන් තදින් ම එලිසබෙත් ගේ පැත්ත ගත්හ. ඔවුන් ගේ විශ්වාසය වූයේ එලිසබෙත් විහිළුවට පැට්‍රික්ට එසේ කළා නම්, කලින් පාසලේ සිටි හොඳ ශිෂ්‍ය නායිකාවක් ලෙස (ඉතා හොඳ) ඇය අනිවාර්යයෙන් ම තමන් ගේ වැරැද්ද පිළිගන්නා බව ය.

"ඇත්ත ම කියනවා නම් ජූලියන්." ඔවුන් පෝනියන් හරවා ගෙන නැවත පාසල දෙසට එද්දී එලිසබෙත් කීවා ය. "මං නම් ගණන් ගන්නෙ නෑ. ඒ කියන්නේ ආයෙමත් ටීම් එකට එන්න බලා ගෙන ඒක රොජර් ම කරා වුණත් මං නම් ගණන් ගන්නේ නෑ. අනෙක පැට්‍රික්ට වඩා ටීම් එකේ තැනට ගැළපෙන්නේ රොජර් මං නම් හිතන්නෙ. මොකද අඩු ම තරමේ එයා පැට්‍රික්ට වැඩිය විනීතයි. එයා අනෙක් අයට ආදර්ශයක්, පැට්‍රික් වගේ වාචාලයෙක් නෑ රොජර්."

"ඔව්." ජූලියන් ගේ කොළ පාට ඇස් දිලිසිණි. සිත පෑරී ඇති නිසා නම් යෙහෙළිය සිත සනසා ගැනීමට තේරුමකට නැති කතා කියන්නේ යැයි ඔහුට සිතිණි. ඒ නිසා ජූලියන් ඇයට විරුද්ධ වන්නට නො ගියේ ය. "ඇත්තට ම ඒ වගේ දුෂ්ට විහිළුවක් කරන්න එයා විනීත වැඩියි, කොහොම වුණත්, එලිසබෙත්." ඔහු නිදහස් ව කීවේ ය. "ඔයා ගණන් ගන්නෙ නැත්නම් මං මොකට ද ගණන් ගන්නෙ?"

www.sinhalaelibrary.com

සංවාදය එතැනින් අවසන් විය. ඔවුන් දෙදෙනා වැඩි කතාබහක් නොමැති ව ම සෙමින් පෝනියන් දෙදෙනා ඉස්තාලය දෙසට පදවා එයට ඇතුළු කළහ. එයින් පසු එලිසබෙත් ගේ තීරණය වූයේ ගොවිපළ දෙසට යාම ය. ඇය ජෝන් ගේ ව්‍යාපෘතිය ගැන ඇහැ ගහ ගෙන සිටීමට කලින් ම තීරණය කර තිබිණි.

"මං ඔබින් බලන්න ඕනි පැළ ටික හොඳට තියෙනවද කියලා!" ඇය කීවා ය. "මට කිසි ම උදව්වක් ඒවට කරන්න බැරි වුණත්, ඒවා බලන්නැතුව ඉන්න එක නම් කරන්න බෑ."

සලාද පැළ වෙනදාටත් වඩා හොඳින් තිබිණි. හංබෙල්ලන් මතු වී නැත. භාජනවල ඉතිරි වී ඇති හංබෙල්ලන් ද සීරිවල ගිලී ඉදිමී සිටියි.

"මං හිතනවා ඒගොල්ලන්ට ආයෙමත් පණ එන එකක් නෑ කියලා." එලිසබෙත් තමා ගේ ම සිතුවිලි ගැන කලබලයට පත් වූවා ය.

"දැන් මුන් සිහි නැති වෙලා නම් ඉන්නෙ ආපහු පණ ආවොත් හරි ම කරදරයක් තමයි වෙන්නෙ." ඇය වැටෙන් ඇවිද ගොස්, ජෝන් මැරුණු සතුන් විසි කරන කුණු ගොඩ අසලට ඇවිද ආවා ය. එතැන මැරුණු හංබෙල්ලන් කන්දක් පමණ විය. ඇය අතු රිකිල්ලකින්, උන් එකා බැගින් පරිස්සමින් ඒ පැත්ත මේ පැත්ත පෙරළා බැලුවා ය. මුලින් ම ඇය නාසය හකුළා ගත් නමුත් ටිකකින් ඇය එයට හුරු වන්නට විය. පව් අහිංසක මහත පැටවු.

"ඔව්, උන් ඔක්කොම හොඳට ම මැරිලා." ඇය සිතන්නට වූවා ය. "උන් ආයෙත් පණ එන්නැති වෙන්න ම මැරිලා.... තිරි උඩුල ඇත්තට ම වැඩ කරනවා...."

"ඊ.... යා!" එලිසබෙත් ගේ උරහිස දෙසින් කෙනෙකු හිරිකිතයෙන් කෑ ගසනු ඇසිණි. බලාපොරොත්තු නො වූ ඒ කටහඬින් තැති ගත් එලිසබෙත් වැරදිකාර හැඟීමකින් ආපස්සට පැන්නා ය.



සොෆියා ඇයට කෙළින් ම පිටුපසින් හිටගෙන සිටියි. පුංචි දැරිය ගේ ඇස් විස්මයෙන් ලොකු ගෙඩි තරම් ලොකු වී තිබිණි.

"ඇයි එලිසබෙත් ඔයා මේ මැරිච්ච හංබෙල්ලොත් එක්ක සෙල්ලම් කරන්නෙ? ඒගොල්ලෝ හරි ම කැතයිනෙ!" පිළිකුල නිසා කට ඇද කරමින් සොෆියා කීවා ය.

එලිසබෙත් ඉක්මනින් අතේ වූ කෝටුව විසි කර සැහැල්ලුවෙන් සිනාසුණා ය.

"ඒක තමයි මගේ රහස් විනෝදාංශෙ සොෆියා!" ඇය විහිළු කළා ය. "මං හරි ම කැමතියි මැරිච්ච හංබෙල්ලොත් එක්ක සෙල්ලම් කරන්න."

"ඔයා ඇත්ත ම ද කියන්නෙ?" දැරිය සංවේගයෙන් ඇසුවා ය.

ඇය ටික වෙලාවක් නිස්සේ එලිසබෙත් කරමින් සිටි දෙය දෙස අවධානය යොමු කර තිබිණි.

"මේ බලන්න සොෆියා." එලිසබෙත් කඩිසර ව කියමින් දැරිය ගේ අතින් අල්ලා ගත්තා ය. "ඔයා දන්නවා නේද ඔයාට තනියම මේ පැත්තට එන්න තහනම් කියලා."

"මට ඕනි වුණේ පිපිච්ච මල් තව පාරක් බලන්න විතරයි. ඒවායේ සුවඳ හරි ම ෂෝක්!" දැරිය දුකින් මෙන් කීවා ය.

"හරි දැන් ඔයා මාත් එක්ක ආපහු ඉස්කෝලෙට යනවා. මේ දැන් ම ම."

සොෆියාට මල්වලින් ඉවත් වීමට වුවමනා නො වී ය. ඇගේ සිත සතුටු කිරීමට යමක් කළ යුතු යැයි එලිසබෙත් සිතුවා ය.

"මං ඔයාට හොඳ විහිළු සින්දුවක් කියලා දෙන්නම්." එලිසබෙත් කාරුණික ව කීවා ය.

"මාව බලා ගන්න ටීචර් කෙනෙක් තමයි මට මේක කියලා දුන්නෙ. ඔයා කැමති ඕනම කෙනෙක් ගේ නමක් දාලා මේක කියන්න පුළුවන්!"

ඉක්මනින් දෙදෙනා ම සතුටින් ගීතය ගයමින් පාසල දෙසට ඇවිද යන්නට වූහ.

'පුංචි සොෆියා මොන වගේ ද? පුංචි සොෆියා
මොන වගේ ද?
සීනි බෝල, ටොෆි, චොක්ලට් වගේ
තමයි පුංචි සොෆියා, වගේ තමයි පුංචි සොෆියා!
පුංචි පැට්‍රික් මොන වගේ ද? පුංචි පැට්‍රික්
මොන වගේ ද?
සංබෙල්ලෝ, ගොළුබෙල්ලෝ, බලු තකුටෝ වගේ
තමයි පුංචි පැට්‍රික්, වගේ තමයි පුංචි පැට්‍රික්!

ප්‍රධාන දොරටුවට එන විට ඔවුන් දෙදෙනා ගීතය කිහිප වාරයක් ම ගායනා කර අවසන් කර තිබිණි. ඔවුන් දෙදෙනා එතැන දී මහා හඬින් සිනාසෙමින් වෙන් වූහ. සොෆියා එයට කැමති වූවා ය. ලණු පැනීමේ දී එය ගැයීමට ඇය ඉටා ගත්තා ය.

එලිසබෙත් ගේ සිතට ද සැහැල්ලුවක් දැනෙන්නට විය. මොනිටර් කෙනෙකු නො වුවත් වයිටලීෆ්වල ඉන්නට ලැබීම ගැන ඇය ප්‍රීති වූවා ය. හැම දෙයක් ම හොඳින් සිදු වෙමින් තිබිණි. ජූලියන් හා ඇය උදෙන් ම පෝනියන් පදින්නට ගොස් තිබිණි. සලාද වගාව වෙනදාටත් වඩා හොඳින් වැඩී තිබෙයි.

නමුත් ඇගේ බලාපොරොත්තු සුන් කරමින් පසු දින නැවතත් වර්ෂාව ඇද හැලෙන්නට විය.

7

## එලිසබෙත් නීරසයක් හරියි

"එලිසබෙත්, කරුණාකරලා ඔයාට පුළුවන් ද මං දිහා ඔහොම බලන් ඉන්න එක නවත්තන්න?" මැම්සෙලා ප්‍රංශ පාඩම අතරතුරේ දී එලිසබෙත් ගෙන් ඉල්ලීමක් කළා ය. ප්‍රංශ භාෂාව සඳහා දිනයේ පළමු වන පාඩම ය. "ඔයා ගේ ඇස් පාඩම් පොත දිහාවට හරවලා වැඩ කර ගෙන යන්න තරම් ඔයාට කරුණාවන්ත වෙන්න පුළුවන් ද? තව කෙනෙක් දිහා විශේෂයෙන් ගුරුවරයෙක් දිහා ඔහොම එක දිගට බලා ගෙන ඉන්න එක හැදිච්ච ළමයෙක් කරන දෙයක් නෙමේ කියලා, ඔයා දන්නෙ නැද්ද? ඔයාට අද උදේ මොකද වෙලා තියෙන්නේ? හරියට ජීවිතේට කිසි ම කෙනෙක් බිස්කට් කනවා දැකලා නෑ වගෙයි නෙ!"

පන්තිය පුරා ම කෙකර ගෑමකට සමාන උස් හඬක් පැතිර ගියේ, සිසුන් පාඩම් පොත්වලින් ඇස් ඉහළට ගනිද්දී ම ය.

"සමාවෙන්න මැම්'සෙලා." එලිසබෙත් සමාව අයැද්දා ය. "මං බලන් හිටියේ මැඩම් දිහා නෙමෙයි. මම වෙන දෙයක් ගැනයි හිත හිතා හිටියේ."

www.sinhalaelibrary.com

"කරුණාකරලා එලිසබෙත් ඇලන්, මං උගන්නන කොට පන්තියේ වාඩි වෙලා ඉන්නවා නම් ප්‍රංශ පාඩමට විතරක් අවධානය දෙන්න."

එලිසබෙත් යටහත් පහත් ලෙස හිස බිමට නරවා ගත්තා ය. ඉතා උනන්දුවෙන් පාඩම් කරන්නාක් මෙන් ඇය දිගු වෙලාවක් පොතේ වූ ප්‍රංශ වචන මාලාව දෙස ඔහේ බලා සිටින්නට වූවා ය.

මැම්'සෙලා ඔවුනට පාඩම් කර ගැනීමට විනාඩි දහයක් දී ඒ අතරතුර දෙවන වසර සිසුන් ගේ රචනා වගයක හරි වැරදි බලමින් සිටියා ය. විනාඩි දහය අවසානයේ දී ඔවුනට විභාගයක් දීමට නියමිත ය.

එලිසබෙත්, මැම්'සෙලා බිස්කට් කන වගක් වත් දැන සිටියේ නැත. සිටියත් එය ඉතාමත් සාමාන්‍ය දෙයක් නිසා බලා සිටීමට ඇයට කොහෙත් ම වුවමනාවක් නො වී ය. නිතර අසනීප වන ප්‍රංශ ගුරුතුමිය ඇගේ බිස්කට් ටින් එක ඇය යන හැම තැනක ම ගෙන යයි. එය ඕට් පිටිවලින් කෝකි හෝනා විසින් සාදා දෙන ලද සැහැල්ලු බිස්කට්වලින් පිරී තිබෙයි. ඇයට ඒවා අවශ්‍ය ම ය. මිස් බෙලා සහ මිස් බෙස්ට් හට ඇය එය පැහැදිලි කර තිබිණි. උගැන්වීමේ දී ඇති වන ආමාශගත අජීර්ණ රෝගය වළක්වා ගැනීමට ඇයට ඒවා අවශ්‍ය විය. ඇගේ ආහාර ජීර්ණ පද්ධතිය සන්සුන් කිරීමට ඒ බිස්කට්වලට පුළුවන් ය. එය පාසලේ සියල්ලන් ම දන්නා රහසකි. හැම සඳුදා උදයක ම බිස්කට් ටින් එකක් දැකීම පළමු පන්තියේ ළමයින්ට නම් හරි ම ස්වාභාවික දෙයකි.

"අනේ ඒවාට මැම්'සෙලා ගේ අනෙක් පද්ධතීන් සන්සුන් කරන්න පුළුවන් නම් කොච්චර හොඳ ද?" එලිසබෙත් තමාට ම මුමුණා ගත්තා ය. මුළු පන්තිය ඉදිරියේ ම බැනුම් ඇසීමට වීම ගැන ඇය ලැජ්ජාවට පත් වූවා ය.

කුමා ඇරිය බලා සිටියේ! මැම්'සෙලා දෙස හෝ ඇගේ බිස්කට් ටින [illegible] ඇයට එතැයින් වූ



ජනෙල් තහඩුව දෙස ය, ඒවා මත ශබ්ද නගමින් වැසි වතුර බිංදු පතිත වෙමින් තිබිණි. ට්‍රිප් - ට්‍රොප්, ට්‍රිප් - ට්‍රොප්. ඒවා මොහොතින් මොහොත විශාල වන්නටත් වැඩි ශබ්දයක් ජනෙල් තහඩුවල වදිමින් ඇති කරන්නටත් විය. වැස්ස දෙස නො බලා සිටීමට ඇයට නො හැකි විය. මේ පටන් ගන්න හැටි ද, නැත්නම් ඉවර වෙන්න යන හැටි ද? ඇය සිතන්නට විය.

නමුත් අවාසනාවට වැස්ස නැවතුණේ ම නැති අතර හවස් වන තුරු ම නො නවත්වා ම ඇද හැළුණි.

'වැස්ස අනිවාර්යයෙන් ම හැංමෙල්ලන් ව එළියට ගනියි.' බලාපොරොත්තු සුන් වූ එලිසබෙත් සිතුවා ය.

ජෝන් ගේ වගාව ගැන ඇයට ඇති කනගාටුවක් ඇති විය. ඒ නිසාවෙන් තාමත් හරි හැටි නො පැහැදිලි නමුත් යම් ආකාරයක සැලැස්මක් ඇගේ සිතේ කොතැනක ඇති වෙමින් තිබිණි.

හවස තේ පානයෙන් පසු ව, වැස්ස නැවතුණු විට එලිසබෙත් ඇගේ මිතුරිය වන ජෝවන් සමඟ ගම්මානය දෙසට ඇවිදින්නට වූවා ය. පාසලේ සිසුන්ට නගරට යාමට අවසර ලැබී තිබුණේ දෙදෙනෙක් වශයෙන් පමණකි.

"අද මොනා ද එලිසබෙත් ඔයා ගන්න යන්නෙ?" දෙවනි පන්තියේ සිසුවිය ඇසුවා ය.

"මං අද ජෝන් වෙට්ට රසකැවිලි වගයක් ගන්නයි යන්නේ." ඇය කීවා ය. වෙලින්ඩා ඇයට ගෙනත් දුන් මුද්දරවලට මුදල් දුන්නාටත් පසු ව ඇය ළඟ තව පැන්ස පනහක් ඉතිරි ව තිබිණි. ඇය සිතා සිටියේ ඒ මුදල් ඉතිරි කර ගැනීමට ය. නමුත් මෙය ඉතා වැදගත් අවස්ථාවකි.

"ජෝන් අර කාමරේට හිර වෙලා හරි ම දුකෙන් ඇත්තේ."

"ඔයා හරි කරුණාවන්තයි, එලිසබෙත්." ඇගේ හොඳ ම මිතුරිය සමඟ අත් පටලවා ගනිමින් ඇවිද යන ගමන් ජෝවන් සෙමින් කීවා ය.

www.sinhalaelibrary.com

"සුසනුත් එහෙම හිතනවා."

"සුසන්?" එලිසබෙත් විස්මයෙන් එය ම කීවා ය.

"ඔව්, විලියමුයි සුසයි, එයාට කියලා ඔයා එයාට අවස්ථාව දීලා අස්වුණා කියලා. ඒක ඇහෙද්දී මට ඔයා ගැන හොඩාක් ආඩම්බර හිතුණා. ඔයා හරි ම හොඳ මොනිටර් කෙනෙක් වෙලා හිටියා එලිසබෙත්."

එලිසබෙත්ට දැනුණු ආඩම්බරකම නිසා ඇගේ මුහුණ ක්ෂණයකින් රතු විය.

"ඇයි එලිසබෙත් මොකද මේ හොඳට ම රතු වෙලා!" ජෝවන් හිනාවුණා ය. "මං ඔයා ව අමාරුවේ දාන්න හිතුවේ නෑ!"

"ඒකට නෙමෙයි ජෝ," එලිසබෙත් පාපොච්චාරණයක ස්වරූපයෙන් කීවා ය. "කාරණේ තමයි, මට සතුටුයි මං මේ වෙලාවේ මොනිටර් කෙනෙක් නෙමෙයි එක ගැන, මං හිතන් ඉන්නවා පොඩි වැඩක් කරන්න. හැබැයි ඒක මොනිටර් කෙනෙකුට ගැළපෙන වැඩක් නම් නෙමෙයි. මට ඔයාට ඒක කියන්න පුළුවන් වුණා නම් හොඳයි. ඒත් ඒක කරන්න බෑ. ඒක වෙන කෙනෙක් ගේ රහසකට අදාළ වැඩක් ඔයාට තේරෙනවා ද?"

"කරදරවල වැටෙන්නෙ නැතුව ඕන දෙයක්, මට විශ්වාසයි ඔයාට හොඳ හේතුවක් ඇති මොකක් හරි ඔය කරන්න යන වැඩේට."

මට හොඳ හේතුවක් තියෙනවා, පැයකට පමණ පසු හොරෙන් හොරෙන් පිට්ටනිය මැදින් ජෝන් සිටින ගොඩනැඟිල්ල දෙසට යන ගමන් එලිසබෙත් සිතුවා ය. ජෝන්ට ගත් රසකැවිලි ඇගේ එක් අතක විය. ජෝන් ඉන්න කාමරේ පහළ තට්ටුවේ එකක් වුණොත් හොඳයි, මෙට්‍රන් මාව නො දැක්කොත් හොඳයි, එක එක විකාර සිතිවිලිවලින් ඇගේ හිස පිරී තිබිණ.

අවාසනාවක මහත, එලිසබෙත් මුලින් ම එබුණු කාමරේ සිට මෙට්‍රන් ඇගේ මුහුණ දෙස එක එල්ලේ බලා සිටිනු එලිසබෙත් දුටුවා ය.



මෙට්‍රන් ඇගේ කන්තෝරු කාමරයේ මේසය අසල වාඩි වී යමක් කරමින් සිටින අතර පඳුරු සර - සර ගාන ශබ්දයක් ඇසීමෙන් පුදුම වූ ඇය හිස ඔසවා බැලුවා ය. බලද්දී ඇය දුටුවේ අන් කිසිවක් නො ව හොරෙකු මෙන් ජනේලයෙන් එබී බලන එලිසබෙත් ඇලන් ය. මෙට්‍රන්වරිය ඉක්මනින් ජනේලය අසලට ගොස් එය හොඳින් ඇර එළියට එබුණා ය.

"දෙයියනේ! එලිසබෙත් ඔයා මාව හොඳට ම බය කළා." ඇය හයියෙන් හුස්මක් ඉහළට අදිමින් කීවා ය.

"මොනා ද ඔයා කරන්නෙ, හරියට හොරෙක් වගේ කාමරවලට එබී එබී."

එලිසබෙත්ට මහත් ලැජ්ජාවක් දැනුණි.

"මට ඕන වුණේ ජෝන්ට ජනේලෙන් අත වනන්න, ඒත් මං දන්නෑ එයා ගේ කාමරේ මොකක් ද කියලා. ඒ නිසා මං හිතා ගත්තා හැම කාමරේකට ම එබී එබී බල බල යන්න, එයා ගේ කාමරේ හම්බවෙනකම්." ඇය ඉක්මනින් කීවා ය.

"එයා ව ටිකක් සන්තෝස කරන්න මං මේවා එයාට වනන්න හිටියේ හවස තේ වෙලාවෙන් පස්සෙ මං එළියට ගිහින් මේවා ජෝන්ටමයි ගෙනාවේ."

"ඔයාට කිසි ම ජනේලෙකින් එයාට අත වනන්න වෙන්නෙ නෑ ටික කාලෙකට, මිස්සු කෙල්ල! අනෙක එයා ඉන්නෙ උඩ තට්ටුවේ කාමරේක, දැන් එයා හොඳට ම නිදි. එයා සම්පූර්ණයෙන් ම අනෙක් අය ගෙන් වෙන් කරලා තියෙන්නෙ. ඔයා දන්නවා නෙ එලිසබෙත්, එයා ගේ ලෙඩේ බෝ වෙනවා. ඒ හින්දා දද මික්කොම සනීප වෙලා උණ බහිනකම් එයාට එළියට එන්න බෑ."

ඒ කෙසේ වුවත් මෙට්‍රන් එලිසබෙත් ගේ රසකැවිලි ජෝන්ට ගෙනිහින් දීමට පොරොන්දු වුවා ය. ජනේලය වැසීමට පෙර ඇය වඩාත් මෘදු ව එලිසබෙත්ට කතා කළා ය.

"හැමෝම දන්නවා ජෝන්ට බෝ වෙන ලෙඩක් තියෙන හන්දා අනෙක් අය ගෙන් එයා ව වෙන් කරලා කියලා. ඒ වුණාට ඔයාට හොඳ හදවතක් තියෙනවා එලිසබෙත්. කවුරු

හරි එයාට රසකැවිලි ගෙනත් දුන්නා කියලා දැන ගත්ත ම එයා හරියට සතුටු වෙයි. අද මුළු දවසෙ ම එයා හිටියේ හරි ම කනගාටුවෙන්. මං මේ කියන්නේ එයා ගේ වයාව ගැනයි වැස්ස ගැනයි. හරි ම හිතේ අමාරුවෙන් එයා ඉන්නෙ. පොඩි වැස්සකට එච්චර කලබල වෙන්නෙ ද ඇයි මන්දා? සමහර විට උණ වැඩි වෙලා ඇති මං හිතන්නේ?"

එලිසබෙත් එතැනින් ඉවත් වුයේ හිටියාටත් වඩා කලකිරීමෙනි. ඇගේ උපාය වැරදුණි. පව් ජෝන්! ඇය සිතා ගෙන සිටියේ කෙසේ හෝ ජෝන් සමඟ ජනේලයෙන් කතා කිරීමට ය. තුවාල වීමට ඇයට වුවමනා වූයේ තරඟ තිබී මෝඩ බවත්, තමා ඇයට උදවු කිරීමට ඉඩ දිය යුතු බවත් ය. නමුත් අවාසනාවට ඇය මෙටුන් ගේ අතට ම අසුවිය!

එලිසබෙත් තමා ගේ ම සිතුවිලි සමඟ රණ්ඩු කරමින් යන්නාම වාලේ කකුල් අද්දමින් ඇවිද යන්නට වූවා ය.

තීරණයකට එළඹීම හරි ම අපහසු ය. නමුත් ජෝන් අසනීපයෙන් නො සන්සුන් ව ලෙඩ ඇඳට වී සිටියි යන සිතුවිල්ල අන්තිමේ දී ජය ගත්තේ ය. එලිසබෙත් ඇගේ තීරණය ගත්තා ය.

ජෝන් හරි ම දුක්සයි. මං එයාට උදවු කරන්න ඕනෑයි. මේ තරඟෙ තීති හරි ම මෝඩයි. මං එයා ගේ තැළ විස බලා ගන්න ඕනි. එයාට වත් නො කියා, අඩු ම තරමේ තාට වත් නො කියා, කවුරු වත් කවදා වත් දැන ගන්න එකක් නෑ, මං උදවු කළා කියලා. අඩුම තරමේ ජෝන් වත් ඇය සිතුවා ය. අන්තිමට එයා කප් එක දිනයි මුළු ඉස්කෝලෙ ම වෙනුවෙන්, එයා හැමදාමත් හිතුව විදිහට!

ගාට ගාට ඇවිදිමින් සිටි එලිසබෙත් රොකට්ටුවක් මෙන් හදිසියේ ම දුවන්නට විය. ඇය තීරණයක් ගෙන ඇත. කාන්සි කිරීමට කාලයක් නැත. ඇය ඉක්මනින් පාසලේ මුළුතැන්ගෙය දෙසට දිව ගොස් ගෝකි හෝනා ව මුණ ගැසුණා ය.

"කිරි ජෝගුවක්? ඔයාට මොකටද කිරි ජෝගුවක් ම එලිසබෙත්?"



"අයියෝ විහාසයි!" එලිසබෙත්ට සිතිණි.

ඇය කලබලයෙන් වටපිට බලද්දී සිටි. පාසලේ පූසා කුස්සියෙන් පිටත කෙටි බිත්තිය මත වාඩි වී සිටිනු ඇය දුටුවා ය.

"මං හිතන්නේ කිට්ට හරි තිබහ පාටයි." අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමට සිතා ඇය එසේ කීවත් එය කිසි විටෙක බොරුවක් නො වී ය.

"කිට්ට ඉතින් හැම විස්සෙ ම තිබහා පාටයි නෙ," ගෝකි හෝනා සිනාසුණා ය.

"හරි, ඒ වුණත් මියා එයාට කිරි ජෝගුවක් ම දෙන්නෙ නෑ. මං භාජනයකට කිරි ටිකක් පුරවලා දෙන්නම්."

සින්ක් එක යට තිබී පරණ මැටි භාජනයක් හමු වුණු අතර ඇය එයට ජෝගුවෙන් කිරි පිරෙව්වා ය.

"යන්න හරි, දැන් යන්න, ආ....ත්, එලිසබෙත් පොඩ්ඩක් ඉන්න. ඔයාට පැට්‍රික්ට පණිවිඩයක් දෙන්න පුළුවන් ද? එයාට කියන්න, එයාට ක්‍රිකට් කේක් හදන්න ඕන නම් බ්‍රහස්පතින්දා වෙන කොට තව කුකීන් වෙන්ලට තියේවි කියලා."

පැන්නෙ දොරෙන් එළියට ලිස්සා ගත් එලිසබෙත් කිරි ව පසු කර ගෙන කෙලින් ම ගොවිපල දෙසට යන්නට වූවා ය. ඇය ඉතා පරිස්සමින් කිරි භාජනය ගෙන ගියා ය. ගෝකි හෝනා ඉතා කරුණාවන්ත ය. ඇය භාජනයේ කට ගාවට එන තෙක් ම කිරි පුරවා තිබිණි. ඒ අතරේ, කිටී ඇඟ මැලි කඩා, ඇනුමක් ඇර ඇය පිටුපස ඒමට තීරණය කළ බවත් ඇය නොදන්නා ය.

'මං හිතන්නෑ මේක ඇති වෙයි කියලා. ඒ වුණත් මේක අඩු ම තරමේ පටන් ගැනීමක් කියලා වත් හිතමුකෝ,' එලිසබෙත් ඉතා උනන්දුවෙන් සිතුවා ය. තාට වත් නො පෙනීමට ඇය විමසිලිලෙන් වටපිට බැලුවා ය.

ඇගේ වාසනාවට පළාත ම පාළුවට ගොස් තිබිණි. ඇත්ත නම් දැන් හොඳට ම සවස් වී තිබුණ අතර මේ

වෙලාවේ එලිසබෙත් සිටිය යුතු වන්නේ පාසල තුළ ය. සවස් භාගයේ මේ කාලය වෙන් වී තිබුණේ පළමු වසර ළමයින්ට පාඩම් කිරීමට ය. කියවීමට හෝ නිශ්ශබ්ද ව විවේකාගාරය තුළ සෙල්ලම් කිරීමට ය.

"එලිසබෙත්ට මොකා වුණා ද මන්දා?" බෙලින්ඩා කීවා ය. මං එයා ව දැක්කෙ ම නෑ.

"සමහර විට එයා පියානෝ පාඩමට ගිහින් ඇති." ජූලියන් දෙවුර සොලවමින් සාමාන්‍ය ලෙස කීවේ ය.

"නෑ, අද ඒ පාඩම නෑ!" කැත්ලීන් කීවා ය.

"ඔයාගොල්ලෝ මගේ අදහස දැන ගන්න කැමති නම්," ඇරබෙලා කතාව මැද්දට පැන්නා ය. "එලිසබෙත් මේ දවස්වල එච්චර සමාජශීලී නෑ. මං නම් හිතන්නේ එයා දැන් මොනිටර් කෙනෙක් නෙමෙයි නිසා ඇති වෙච්ච කම්පනේ!"

"ඇත්තට ම කියනවා නම් ඇරබෙලා, අපි ඔයා ගෙන් ඇහුවා නම්, අපි හරි සතුටු වෙයි ඔයා ගේ අදහස් දැන ගන්න." ජූලියන් අවඥාසහගත ව කීවේ ය. "ඇත්තට ම අපි ඔයා ගෙන් ඇහුවෙ නැති නිසා, අපිට එහෙම හිතුනෙ ම නෑ."

ඒ අතර එලිසබෙත් ඇඟිලි තුඩින් ගොවිපළ හරහා ඇවිද ගොස් ජෝන් ගේ වගාවට ළං විය. පොළව පෝර, පෝර ගාන තරමට ම මඩ වී තිබිණි. ඇය කිරි භාජනය ප්‍රවේසම් සහිත ව මඩ නොමැති තැනක තබා පැළ බැලීමට ගියා ය.

මෙලෙස ජෝන් වෙතට උදවු කිරීමට ලැබීම ගැන ඇගේ සිතට මහත් සැහැල්ලුවක් දැනිණි. ජෝන්ට රහසින් උදවු කිරීමට සිතූ මොහොතේ සිට ඇගේ සිතේ වූ ලොකු බරක් නිදහස් වූ බවක් ඇයට දැනුණි. කොහේට හෝ වී, උදවු කිරීමට නො හැකි වීම ගැන දුක් වෙවී ඉන්නවාට වඩා නරක තවත් දෙයක් නැතැයි ඇයට හැඟෙන්නට විය. මෙය ඊට වඩා විනෝද ය.



හංබෙල්ලන් විසින් ඇගේ වගාව මෙන් ජෝන් ගේ සලාද පැළවල තිබූ ලස්සණ කොළ කා විනාශ කර ඇතැයි ඇගේ සිතේ සැකයක් තිබූ නමුත් එය එසේ වී නැති බව දැකීමෙන් ඇය මහත් අස්වැසිල්ලට පත් වූවා ය.

කෝපි තෝනා පැට්‍රික් හා කුසින් චොක්ලට් ගැන නී කතාව මතක් වීමෙන් එලිසබෙත්ට සිනා යන්නට විය. පැට්‍රික් පාසලේ ළමයින් සමඟ කියා සිටියේ රසකැවිලි වගේ දේවල් හදන එක කෙල්ලන් ගේ වැඩ බවත්, සංග්‍රහ භාර නායකයා වුවත් ඔහු ඒවා සෑදීමට සුදුසු නො වන බවත් ය. තමා පිරිමි ළමයකු නිසා ගැහැනු ළමයකු විසින් ඒවා සෑදිය යුතු අතර ඔහුට අනෙක් ළමයින්ට සංග්‍රහ කිරීමේ ගෞරවය ලබා දිය යුතු බවත් ය. අනුන්ට ඇනුම් පද කියන ඇරබෙලාවත් පවා ඒ ගැන කීමට කිසිවක් නො වූ අතර, පැට්‍රික් පුරසාරම් දොඩමින් සිටියේ, ඔහුත් මැම්'සෙලා මෙන් කවුරුන් හෝ ලවා ඒවා කර ගන්නා බව ය. ඒ වුණාට රහසින් පැට්‍රික් මොනවා හරි හදනවා අන්තිමට, ඒ මදිවට හදන්නෙත් කේක්....

නමුත් පැට්‍රික්ට පණිවිඩය දීම එලිසබෙත්ට කළ නො හැක්කකි. ඒ ඔවුන් දෙදෙනා තාමත් එකි'නෙකා සමඟ කතා නො කරන බැවිනි. වෙන කවුරුන් හෝ අත පණිවිඩය පැට්‍රික්ට යැවිය යුතු යැයි එලිසබෙත් සිතුවා ය.

ඒ සිතුවිලිවලින් මිදී එලිසබෙත් ගේ අවධානය නැවතත් හංබෙලි භාජනයට යොමු විය. භාජන හය එකින් එක බැලීමේ දී තවත් බොහෝ හංබෙල්ලන් දැන් ඒවායේ සිර වී ඇති බව එලිසබෙත්ට පෙනිණි. අද ඇති වූ තද වැස්සෙන් පස හොඳට ම තෙත් වී හංබෙල්ලන් නැවතත් පස මතු පිටට පැමිණ සිටියි.

"භාජන දෙකක් පිරෙන්න ඔන්න මෙන්න!" ඇය තමාට ම කියා ගත්තා ය. "අනෙක් හතරේ නම් තාම ප්‍රශ්නයක් නෑ."

www.sinhalaelibrary.com

ඇයට 'ඉල්ලූ' ගමින් ම කෝකි නෝනා ගෙන් කිරි ලැබුණේ ජෝන් ගේ වාසනාවට ම ය. "පිරෙන්න ඔන්න කමින්න කියන භාජන දෙකට යන්නම් පිරිමහගන්න ගම කිරි ටික ඇති වෙයි." ඇය සිතුවා ය. හාසය හකුළුවා ගෙන, ඇය භාජන දෙක කුණු ගොඩ අසලට ගෙන ගොස් එහි වූ හංබෙල්ලන් ගොඩ මතට භාජනයේ කිරි හංබෙල්ලන් ට විසි කළා ය.

තවත් මහත ජරා හංබෙල්ලන් ගොඩකට සුබ ගමන්!

ඇය ආපසුවිත්, බිමට හැමී හිස් භාජන කලින් තිබූ ස්ථානවලින් ම නියම ආකාරයට තැබුවා ය.

දැන් තියෙන්නේ කිරි අරගෙන ඇවිල්ලා එකකට බාගෙ ගානේ භාජන දෙකට දාන්න විතරයි. ඇය සැහැල්ලුවෙන් සුස්මක් පිට කරන ගමන් සිතුවා ය. ඇය කෙලින් වෙද්දී, සිනිඳු මෙව්ලාගත් වැනි යමක් ඇගේ කකුල්වල දැවටෙන බවක් ඇයට දැනිණි. එලිසබෙත් මොහොතකට නොසෙල්වී ඉද්දු ගැහුවාක් මෙන් සිටියා ය. ඒ සමඟ ම ඉතා ආචාරශීලී ලෙස ස්තූති කරන්නාක් මිදු. උස් 'පුරු' - 'පුරු' හඬක් ඇගේ කකුල් දෙකින් ඇසෙන්නට විය.

"කිටී." එලිසබෙත් පුදුමයෙන් කිව්වා ය. ඇය සිතා ගෙන සිටියේ ඌ තාමත් මුළුතැන්ගෙය අසල කොට බිත්තියට වී කම්මැලිකමින් සිටිනවා ඇතැයි කියා ය. ඒත් සමඟ ම ඇය දුටුවේ කිටී ගේ කට වටේ සහ රැවුලේ සුදු පැහැයට කිරි තැවරී ඇති බව ය.

"අයියෝ... නෑ!" ඇය හැඬීමකට සමාන හඬකින් කෑ ගැසුවා ය.

එලිසබෙත් ඇගේ කිරි භාජනය තබා තිබූ තැනට පිම්මේ දිවුවා ය.

එය සම්පූර්ණයෙන් ම හිස් ය.

තඩි පූසා භාජනයේ තිබූ අන්තිම කිරි බිංදුව දක්වා ම ලෙවකා තිබිණි. එහි කිරි තිබූ බවට සලකුණක් වත් ඌ ඉතිරි කර නො තිබිණි.



කිසිවක් සිතා ගැනීමට නො හැකි ව එලිසබෙත් හිස් භාජනය එක අතකින් ගෙන බලාපොරොත්තු අත් වූ හැඟීමෙන් මුළුතැන්ගෙය දෙසට ඇවිද යන්නට වූවා ය. එම අතරේ ඇය කල්පනා කරන්නට වූවා ය. 'ඇයි මං ම මෙහෙම කරදර වෙන්නෙ. මං හැදුවෙ ජෝන්ට උදව් කරන්න. අන්තිමේ දී තත්ත්වෙ තිබුණටත් වඩා නරක අතට හැරුණා. එතැන හංබෙලි උගුල් හයක් අටවල තිබුණා. දැන් ඉතුරු වෙලා තියෙන්නේ හතරක් විතරයි. ඉතුරු භාජන දෙක සම්පූර්ණයෙන් හිස් නිසාද? ඌ ඒවා ගණන් ගන්න එකක් නෑ. අනෙක් භාජන හතර වැඩි දවසක් පිරිමහගන්න බැරි වේවි. තව දිගට වැස්සොත්, ජෝන් ගේ සලාද පැළ ඉක්මනට ම කාලා විනාශ කරලා දායි උන්. අයියෝ... මං දැන් මොනා ද කරන්නේ?

ඇය මුළුතැන්ගෙයට යද්දී කිසිවෙකු එහි පෙනෙන්නට නො වී ය. කෝකි නෝනා සහ ඇගේ අත්උදව්කරුවන් එදිනට නියමිත වැඩ රාජකාරි අවසන් කර යන්නට ගොස් තිබිණි. සියලු භාජන පවා සෝදා පිසදා තිබිණි. පොළොව ද සෝදා හොඳින් තෙත මාත්තු කර තිබිණි. එලිසබෙත් කිරි දමා තිබූ භාජනය හොඳින් සෝදා, පිසදා පහතින් වූ කබඩ් එක තුළට දැමුවා ය. ආපසු යන්නට හැරෙද්දී ගබඩා කාමරයේ දොර බාගෙට ඇරී ඇති බව ඇය දුටුවා ය. එලිසබෙත් දොර අසලට ගොස් එය වැසීමට පෙර නිකමට මෙන් එතුළට එබිකම් කළා ය. එය ඉතා කුඩා සීත කාමරයකි. බිමට ඉතා ලස්සණ ගල් අල්ලා තිබූ අතර කබඩ්වල රාක්ක වීදුරුවලින් කර තිබිණි. විස්මිත ව සිටි එලිසබෙත්, ඇතුළ තවත් හොඳින් බලා ගැනීමට ඇස් කාමරය වටා ම ගෙන යද්දී හදිසියේ ම දිග ජෝගු පේළියක් ඇගේ නෙත ගැටිණි. හැම ජෝගුවක් ම සිහින් රෙදිවලින් ඉහළින් ඔතා තිබිණි.

එය කිරිවලින් පිරී තිබිණි. අනෙක් භාජන සියල්ලක් ම ද එසේ ය. ඒ පාසලේ ළමයින් ගේ උදැසන ආහාරය සඳහා වූ

කිරි ය. අද සවස පරිසරය සීතල බැවින්, පෝකි හෝනා ගේ අත්උදවුකරුවන් ඒවා උණුසුම් ආහාරය සඳහා සුදානම් කොට එසේ තබා ගොස් තිබිණි.

"කිරි ටොත් ගාණෙකි!" එලිසබෙත් සුසුමයෙන් කෑ ගැව්වා ය. ඇය අවසිහියෙන් මෙන් අසල වූ ජෝගුවක් උස්සා ගත්තා ය. එය තරමක් බර ය. "අයියෝ, කවුරුත් එක ජෝගුවක් නැති වුණාට දුක් වෙන එකක් නෑ. එහෙම වෙයි නේ? මං ගන්නෙ එක ම එකයි නේ!"

මෙය නම් හරි ම අවදානම් සහගත වැඩකි. හිතුවක්කාර, දෙවරක් නො සිතා වැඩ කරන එලිසබෙත් ඇලන් හැර, වෙන කිසිවකුත් කිසිසේත් එය නො කරන වැඩකි.

ඇය ඉක්මනින් ජෝගුවක් රැගෙන මුළුතැන්ගෙයින් එළියට ඇත, කොරිඩෝව දිගේ හොරකු මෙන් ඇයට හැකි තරම් වේගයෙන් කවුරුත් කිරි නො හැළීමට වග බලා ගනිමින් දුවන්නට වුවා ය. විශාල ජෝගුව ඇගේ ඇඳ අසල අල්මාරියේ හැංගීමට, කිසි එළවා ගත් විගස ම එලිසබෙත් තීරණය කළා ය!

කොරිඩෝවේ කොණෙන් හැරෙද්දී, ඇය හදිසියේ ම වේගය අඩාළ කර නැවතුණා ය. විවේකාගාරයේ දොර පල්ලේ ව ඇර තිබුණ අතර ඉහළ මාලයට යාමට නම් ඇය විවේකාගාරයේ දොර පසු කළ යුතු ම ය.

ඇයට කළ හැකි එක ම දෙය නම් හැකි වේගයෙන් එතැනින් ඉවත් වීම ය.

"එලිසබෙත්!" ඇය විදුලියක් මෙන් එතැනින් අතුරුදන් වෙද්දී ඇගේ යහළුවෝ කෑ ගැසූහ.

ඔවුන් දොර අසලට ළං වූ මුත්, ඔවුන්ට දැක ගත හැකි වූයේ ඇගේ සිදුපත ගෙය ක්ෂණයකින් පඩිපෙළ දිගේ අතුරුදන් වීම පමණකි.

"ඔයා එන්නෙ නැද්ද....?" ඔවුහු කෑ ගැසූහ.

"න්.... නෑ.... මට නිදිමතයි, මං ඇඳට යනවා!" කෙඳිරීමක් වැනි හඬක් ඈතින් ඇසිණි.



එයින් විනාඩි කිහිපයකට පසු ඇය සිටියේ නිදන ශාලාවේ ඇගේ ඇඳ අසල වූ අල්මාරිය අසල බිම දණගසා ගෙන ය. ඇය එහි වූ බඩු එහා මෙහා කර, කිරි ජෝගුවට ඇති තරම් ඉඩ ඇති කර, ජෝගුව පරිස්සමින් එහි තබා දොර වැසුවා ය. කවුරුත් අනෙක් අය ගේ අල්මාරි ඇතුළේ බලන්නැහැනේ, ඒක පෞද්ගලික දෙයක් නෙ, ඇය සිතුවා ය.

නැවතත් පියවි සිහි කල්පනාවට ඒමට ඇය ඇඳට පැන උඩබැලි අතට දිගාවී සිලිම දිහා බලා ගෙන සිතන්නට වුවා ය.

"මං මොකද මේ කළේ?" ඇය සුසුමයෙන් කීවා ය. "හරි කොහොම වුණත් දැන් ආපසු යන්න බැහැනේ."

කාලය ගත වෙද්දී, සෙමින් ඉතා සෙමින් ඇගේ සිතට සැනසීමක් දැනෙන්නට විය. ඇය තමා කළ දෙය සාධාරණය කරමින් එයින් ඇති වන වාසි කල්පනා කරන්නට වුවා ය. වැස්සට තිනි නම් මීන තරම් වැහැපුහදෙන්, හමෙල්ලන්ටත් ඒක ම තමයි. මීන තරම් ආහුරදෙන් පොළොවෙන් එළියට මාවී කර ගෙන.... මට දැන් තියෙනවා ඇති තරම් යුද්ධ ආයුධ. සතුරා ව විනාශ කරන්න!

නමුත් හැම දා ම එලිසබෙත්ට වෙනවා වගේ ම, ඒ සතිය පුරා ම වැසි ඇති වූයේ ම නැත! පොළොව හොඳින් වියළුණු අතර, කාලගුණික තත්ත්වයන් අනර්ඝ ලෙස විගාවකට ඉඩ ලබා දුනි.

කෙසේ වුවත්, ඇය පැළ ගැන දැඩි විමසිල්ලෙන් පසු වුවා ය. අන් අය ගෙන් සඟවා ගෙන හොරකු මෙන් ජෝන්ට උදවු කිරීමට සිදු නො වීම ගැන ඇය සතුටු වුවා ය.

රොජර් තව දුරටත් ටෙනිස් කණ්ඩායමේ ක්‍රීඩා නො කරන බැවින් තෝමස්ට උදවු කරමින් ගොවිපළේ නිතර ම ගැවසෙන්නට විය.

විශාල කිරි ජෝගුව, එලිසබෙත් ගේ අල්මාරිය තුළ කිසිවකු අත නො ගසා ම කාලයක් සමඟ අමතක වී තිබුණේ ය.

www.sinhalaelibrary.com

නමුත් සතියේ සභාව රැස්වීමේ දී දෙවන පන්තියේ සිසුවෙක් නැගිට කළ පැමිණිල්ල ඇසුණු විගස එලිසබෙත්ට දවල් තරු පෙනිණි.

"කරුණාකරලා, මට පැමිණිල්ලක් තියෙනවා කරන්න, අඟහරුවාදා උදේ කෑම වෙලාවේ දී, අපේ මේසෙ කිරි ජෝගුව ගේන්න නියමම එතැන එකක් වත් තිබුණෙ නෑ. කෝකි ගෝනා කිව්වා, ඒගොල්ලෝ හරි ගාණට ම ජෝගු යවලා තිබුණා කියලා. ඒ නිසා මං හිතන්නෙ, මොකක් හරි මේසෙක අය කෑදර විදිහට ජෝගු දෙකක් ම අරගෙන. අපිට වුණේ ළඟ මේසෙ අය ගේ ජෝගුව ඒගොල්ලොත් එක්ක බෙදා ගන්න. අපිට කොන්ෆ්ලේක්ස් කන්න කිරි පොඩ්ඩ ම පොඩ්ඩයි හම්බ වුණේ. මං හිතන්නෙ කිරි ජෝගු දෙකක් ම පාවිච්චි කරපු මේසෙ අය, වැරැද්ද පිළිගන්න ඕනෑමයි, ඒගොල්ලන් ගේ කෑදරකමට දඬුවම් ලැබෙන්න ඕනෙ!"

විලියම් හා රීටා, විනිසුරුවන් ලෙස, ළමයින් ගෙන් පිරුණු ශාලාව වටේ ම බැලූහ.

"මොකක් හරි මේසෙක අය අඟහරුවාදා උදේ වැඩිපුර කිරි ජෝගුවක් පාවිච්චි කරා ද?" රීටා ඉතා විනීත ව ඇසී ය. "එහෙම කළා නම්, කරුණාකරලා ඒ අය මේ දැන් ම වැරැද්ද පිළිගන්නවා?"

මුළු ශාලාව ම නිශ්ශබ්ද ය.

ප්‍රධාන සිසු නායකයා හා නායිකාව ටික වේලාවක් යහතුරු නිහඬ ව සිටි මුත් දක්නට ලැබුණේ හැඟීම් විරහිත මුහුණු පේළි පමණකි. කිසි ම කෙනෙකු වැරැද්ද පිළිනොගන්නා බව පැහැදිලි ය.

රීටා ගේ හිස සැලීමකින්, විලියම් තීරණයක් ගත් ලෙසින් කුඩා මිටියෙන් මේසයට තට්ටු කළේ ය.

"බොහොම හොඳයි," මනු සිනහවෙමින් කීවේ ය. "මං හිතන්නෙ අපිට දැන් හොඳට ම විශ්වාසයි මුරතැන්ගෙයි කාට හරි පුංචි වැරැද්දක් වෙලා තියෙනවා කියලා. කවුරු



වත් සර්ව සම්පූර්ණ නැහැනේ. අපි මේ සිද්ධිය අමතක කරලා දාමු කෝ. මීට පස්සේ කිරි ජෝගුව ගන්න අන්තිමට යන්න එපා හරි ද?" මුළු ශාලාව ම සිනාසුණේ ය. නමුත් එක් කෙනෙකු හැර.

එලිසබෙත්ට දහඩිය දමන්නට විය. රැස්වීම අවසන් වූ විගස ම ඇය ශාලාවෙන් පිටතට දිව ගියේ පිරිසිදු වාතාශ්‍රය ටිකක් ලබා ගැනීමට ය.

ඇය මීට පෙර කිසි දවසක වැරැද්දක් කර පිළිනොගෙන සිටියේ නැත. වැරදිකාර හැඟීමක් ඇගේ සිත තුළ ඇති වන්නට විය. නමුත් ජෝන් ගේ රහස එළි නො කර ඇයට එය රැස්වීමට කොහෙත් ම පැහැදිලි කළ නො හැකි ය.

ඇය සිත හදා ගැනීමට තනි ව ම පාසල් පිට්ටනියේ ටික වේලාවක් ඇවිදීමට තීරණය කළා ය.

ඇය ඇවිදින අතරතුරේ දී, ඇය නිදන ශාලාවේ සිටින අනෙක් සිසුවියන් අමුතු ආකාරයක සෙල්ලමක් කර ගෙන යමින් සිටියහ.

"අමුතු ගඳක් එනවා මේ පැත්තෙන්. මට ටික දවසක ඉඳලා ඒක දැනුණා." ජෙනී කීවා ය. "දැන් නම් ඒ ගඳ ඉවස ගන්න බැරි තරමට ම නරක් වෙලා. අද නම් මෙතැන ඉඳලා හුස්ම ගන්න එක නම් බොරු."

"දැනෙන හැටියට නම් ඒක එලිසබෙත්ගෙ අල්මාරිය පැත්තෙනුයි එන්නෙ!" වගේ ඉව අල්ලමින් බෙලින්ඩා සැහැවා ය. "මයෙගොල්ලෝ හිතනවා ද අපි ඒක ඇතුළේ බැලුවොත් හොඳයි කියලා? මට විශ්වාසයි එයා මොකුත් හිතන එකක් නෑ කියලා."

එලිසබෙත් පිට්ටනියේ ඇවිද සිත සන්සුන් කර ගෙන, නිදන ශාලාවට ඇතුළු වෙද්දී, ඇය එන තෙක් නො ඉවසිල්ලෙන් බලා සිටින ගැහැනු ළමයින් පිරිසක් මුණ ගැසිණි. බෙලින්ඩා ගේ අතේ විශාල හිස් කිරි ජෝගුවක් විය. බෙලින්ඩා එහි වූ පිරුණු කිරි සියල්ල විසි කර එය සෝදා සිටිණි.

"එහෙනම් ඇත්තට ම කවුරු හරි කිරි ජෝගුවක් අරගෙන." ජෙනි එලිසබෙත් ගේ මූණට ම කිව්වා ය. "ඒ වෙන කවුරුත් නෙමේ ඔයා. එලිසබෙත් මොකට ද ඔයා ඒක ගත්තේ? අපරාදේ කිරි ඔක්කොම පිරුණු වෙලා, ඔයා පොඩ්ඩක් වත් බිලත් නෑ!"

එලිසබෙත් තුෂ්ණිම්භූත ව ජෝගුව දෙස බලා සිටියා මිනා කිසිවක් කීවේ ම නැත.

"ඇයි ඔයා රැස්වීමේ දී ඒක පිළිගත්තෙ නැත්තේ?" කැත්ලීන් කනගාටුවෙන් කිව්වා ය. "කවුරු මොන කතා කිවුවත් අපි හැම තිස්සෙ ම ඔයත් එක්ක තමයි හිටියෙ එලිසබෙත්!" බෙලින්ඩා කනගාටුවෙන් හා වේගයෙන් කීවා ය. ඇයට තමා පාවා දී ඇති බව දැනෙන්නට විය.

"ඒ වුණාට අන්තිමට සම්හරු ඔයා ගැන කියන කතා ඇත්ත? ඔයා වැරදි වැඩ කරලා පිළිගන්නෙ නැතුව ඉන්නවා කියලා. අනෙක දැන් ඔයා මොනිටර් කෙනෙක් නෙමෙයි නිසා හොඳට හැසිරෙන්නෑ කියලා."

"කරුණාකරලා, මේවා පැහැදිලි කරන්න." කැත්ලීන් අයැද්ද ය.

"මට බෑ කැත්ලීන්!" එලිසබෙත් හැඩීමකට සමාන හඬකින් කීවා ය. "මට ඇත්තට ම ඒක කරන්න බෑ!"

මේ සියල්ල සිදු වන අතර රෝස්මරි මීයකු මෙන් දොර අසලට වී සද්ද නො කර සියල්ල අසා ගෙන සිටියා ය.

එකවර ම ඇය වත් බලාපොරොත්තු නො වූ ලෙස රෝස්මරි කාමරයට පැන්නා ය.

"ඇරඹෙලා මෙච්චර කල් ඔයා ගැන කියපු කතා ඔක්කොම ඇත්ත එහෙනම්." කියාදු රෝස්මරි තමා කළ දේ ගැන උදම් වෙමින් උස් හඬින් කීවා ය.

දොර අවසිර වන ලෙස සිටගෙන සිටි රෝස්මරි වත් පැත්තකට විසි වෙන තරම් වේගයෙන් සුළිසුළඟක් මෙන් කාමරයෙන් පිට වූ එලිසබෙත් කොරිඩෝව දිගේ අවසිඹියෙන් දුවන්නට වූවා ය. ඇගේ හිත හොඳට ම අවුල් වී තිබිණි.



ඇය නො කළ යුතු දෙයක් කර ඇත. දැන් ඇය අනාථ ම අසුවී ඇත.

ඇගේ මිතුරියන් වන බෙලින්ඩා, කැත්ලීන් හා ජෙනි පවා දැන් ඇය ව විශ්වාස නො කරයි.

නමුත් ඇය කළේ රහසක් රැකීම පමණක් ම ය.

ඉදිරියට ඇත්තේ සති අන්තය වීම ගැන ඇය සතුටු වූවා ය. සඳුදා වන තෙක් පන්තියේ අනෙක් ළමයින්ට මුහුණ දීමට ඇයට ධෛර්යක් හා ධුවම්නාවක් නො වී ය. ටික වෙලාවක් ජෝවැන් සමග ගත කිරීමට ඇය අවසානයේ තීරණය කළා ය.

පසු දා උදෙන් ම ජුලියන් සමග තනි ව ම කතා කිරීමට ඇය ඉටා ගත්තා ය.

8

# රහසිගත ලියුමක් ලැබෙයි

පසු දා උදයේ ජූලියන් සතු ව එලිසබෙත් සඳහා හොඳ අවවාද රාශියක් විය.

"ඔයා හරි අමාරුවක වැටිලා ඉන්නෙ, එලිසබෙත්. මේ ඔක්කොම ඔයා ගේ මෝඩ රහස නිසා!" ඔහු කීවේ ය. "මොකක් හරි ඒක, මං දන්නෑ, කවුරු හරි ඔයාට කිවුව ද විශ් හදන්න කියලා? ඒ වගේ රහසක් එච්චර කල් හංගගෙන ඉන්න බෑ. මාර ගඳක් එනවා ඒවා පල් වුණා ම!" ඔහු ගේ කොළ පාට ඇස් දඟකාර බවින් නලියන්නට විය. එලිසබෙත්ටමයි ඔක්කොම වෙන්නේ.

"ඇත්තට ම නෑ," ඇය පිළිතුරු දුන්නා ය. "එහෙම වුණත් මට ඔයාට කියන්න පුළුවන් වෙන එකක් නෑ. මේක ඊට වඩා ගොඩාක් වැදගත් රහසක්. මං කුරුසේ ඇඳලා දිවුරුවා කාට වත් කියන්නේ නෑ කියලා."

"මං දන්නවා, ඉතින් ඒ කියන්නේ ඔයාට විලියමුයි රීටයි හම්බ වෙලා වත් වෙලා තියෙන දේ කියන්න බැරි ද? ඒ වුණාට මුළු පන්තිය ම ඔයා ඒක කරනකම් බලා ගෙන ඉන්නේ." ජූලියන් අකමැත්තෙන් සිනාසුණේ ය. "ඔයා දැන්



ගිහින් පාපොච්චාරණේ කරත් ඒකෙන් වැඩක් වෙයි කියලා මං හිතන්නේ නෑ. දැන් ඉතින් ඔක්කොම වෙලා ඉවරයි නෙ!"

"මං දන්නවා." එලිසබෙත් හිස සැලුවා ය. "දැන් හැමෝම හිතන්නේ මං තමයි පැට්‍රික්ට ඒ විහිළුව කළේ කියලා. ඒගොල්ලෝ හිතනවා මං හිතලා ම එයා ගේ රැකට් එක හංගලා දැන් බය නිසා පිළිගන්නෙ නැතුව ඉන්නවා කියලා. ඒකයි මගේ හිතට ලොකු ම අමාරුව!"

"ඔයාට කියන්නේ එලිසබෙත් දඟමල්ල, අහක යන නයි ඇඳුම් අස්සෙ දා ගෙන කතාවෝ! කතාවෝ කියනවා කියලා." ඔහු ඇගේ කැරලි ගැසුණු දුඹුරු පාට කොණ්ඩයට හෙමින් තට්ටු කළේ ය. "අයියෝ! අසරණ නුර වීර දඟමල්ල, කතාවෝ! කතාවෝ!"

"ඒක එච්චර විහිළු නෑ." එලිසබෙත් විරෝධය පෑවා ය. "ළමයි දෙතුන් දෙනෙක් විතර පැට්‍රික් එක්ක එකතු වෙලා පැත්තක් ගන්නා නම් මං එච්චර ම ගණන් ගන්නෑ. ඒ වුණාට දැන් හැමෝම ඒ විදිහටයි හිතන්නේ. අනෙක පැට්‍රික් අද උදේ මං දිහා බලපු විදිහෙන් එයාට මං රැකට් එක ගත්තා කියලා මුල දී තරම් විශ්වාසයක් නැති හැඩටයි පෙනුණේ. ඇරබෙලා තමයි එයා ව උසිගැන්නුවේ. ඒ වුණාට ඊයේ සිද්ධිය දැන ගත්තහම එයාට ඒක සහතික වේවි!"

"අපිට ඒ දවස්වල ම හොයා ගන්නයි තිබුණේ කවුද ඒක කළේ කියලා. දැන් වත් ඔයාට හිතෙන් නැද්ද එහෙම කළොත් හොඳයි කියලා." ජූලියන් කල්පනාකාරී ලෙස සෙමින් කීවේ ය.

"ඔව්!" එලිසබෙත් එකඟ විය. "මට සමාවෙන්න ජූලියන්, මං මුල දී ඒක එච්චර බරපතළ විදිහට හිතුවේ නෑ. මගෙ කුකුල් කේන්තියයි ආඩම්බරකමයි නිසා මං හැසිරුණේ හරි ම මෝඩ විදිහට. මං ඒ වෙලාවේ හොඳට ම තරහා ගිහින් හිටියේ, එච්චරයි. මං මහන්සි වෙලා එයා නිසා ම අර මෝඩ රැකට් එක හෙව්වා. අන්තිමට මං එයා

ගෙන් බැණුම් ඇහුවා. ඒක විතරයි වුණේ. ඇනුයි මට තේරෙන්නේ, මං මේක විසඳගන්න ඕනි. විසඳගෙන මං ඒක කළේ නෑ කියලා පෙන්නන්න ඕනි. සමහර විට ඒක පැට්‍රික්ටත් හොඳ වේවි." ඇය කනස්සල්ලෙන් පිළිගත්තා ය.

"අයියෝ, අසරණ පැට්‍රික්."

ජූලියන් මෙතෙක් දවස් මේ ප්‍රශ්නය ගැන තම සොහොයුරා ගේ පැත්තෙන් සිතුවේ ම නැති තරම් ය. නමුත් එලිසබෙත් ගේ කතාවෙන් ඔහු මොහොතකට කල්පනාකාරී විය.

"ඔව්, මාත් හිතනවා එහෙම. එයා විතක් දුකෙන් හිටියේ, ඔයා එදා ඇවිත් එයා සෙල්ලම් කරපු ටෙනිස් මැච් එක බලපු නැති එකට. ඒ හින්දා එයා හිතන්නේ ඔයා එයාට කැමති නෑ කියලා. එයා ගේ පළමුවැනි මැච් එකට ඔත්ත මෙන්න කියලා ලුණ්ට විහිළුවක් කරන්න තරමට ම කැමති නෑ කියලා. පැට්‍රික් ගේ හිතත් පෑරිලා තියෙන්නේ ඇත්තේ. ඇත්තට ම මං මේවා පැට්‍රික් ගේ පැත්තෙන් හිතුවේ ම නෑ." ඔහු වග විභාගයක් නැති ව කියන්නට විය.

"මාත් නෑ," එලිසබෙත් කීවා ය.

ඇය නැවත කල්පනා කරන්නට වුවා ය. ජූලියන් සොයා ගත් ක්‍රීඩා පැතාවිපුල 'Southern favorits.'

"ඇරබෙලා ගේ අම්මයි තාත්තයි නම් ඉන්නෙ ඇමෙරිකාවේ." ඇය ව එයට ඇදා ගැනීමට අදහසක් නො තිබුණ හෙයින් එලිසබෙත් තරමක් අස්ථිර ව කීවා ය. "ඒ හින්දයි එයා වෙට්ටිලිස්වලට ආවේ. ඔයා හිතන්නේ නැද්ද ජූලියන්, එයා ගේ අම්මලා එයාට රසකැවිලි ජාති. ඒ කියන්නේ ක්‍රීඩා වගේ දේවල් එවන්නැති කියලා?"

"එච්චර ඉතින් එයා අනෙක් ළමයි එක්ක ඒවා බෙදා ගන්නවයැ." ඇරබෙලා ගේ හැටි මතක් වීමෙන් ඔහු රැව්වේ ය. "ඒ වුණාට එයා මොකට ද එහෙම කරන්නෙ. මං හිතන්නෑ හොඳ හේතුවක් නැතුව එයා එහෙම කරයි කියලා."

"සමහර විට මාව කරදරේ දාන්න වෙන්නැති." එලිසබෙත් තම අදහස පළ කළා ය.



"ඒ වුණාට ඔයා ම ඒකට එක ගනී කියලා එයා කොහොම ද ප්ලෑන් කරන්නෙ!"

"සමහර විට ඒක බොහෝ එකක් වෙන්නැති," එලිසබෙත් කීවා ය.

"එච්චර හොඳ සැලැස්මක් ඇරබෙලා ගේ කල්පනා ශක්තියට නම් කොහෙත් ම ගැළපෙන්නෙ නෑ," ජූලියන් කල්පනා කරමින් කතා කළේ ය.

"එයා ගේ අම්මයි තාත්තයි ඉන්නේ ඇමෙරිකාවේ කියන කතාවේ නම් සුදුසක් තියෙනවා. ඒක මං දැනන් හිටියෙ නෑ. ඔයා කැමති ද එයා නිදා ගන්න කාමරේ සෝදිසි කරලා බලන්න."

"හරි අද හැන්දෑවට." එලිසබෙත් හිස සැලුවා ය. "වැඩේ පරිස්සමට කරනැකි මොකද අද හවසට ටෙනිස් මැච් එකනෙ!"

එලිසබෙත් ඒ වන විටත් තීරණය කර තිබුණේ කාන්ත ලොයිස්ස් සමග එදින හවස යෙදී තිබෙන තරගය බැලීමෙන් වැළකීමට ය. ඇයට පන්තියේ ළමයින් ගෙන් ඈත් වී සිටීමට වුවමනා විය. තම ගේ පන්තියේ ළමයින් ගෙන් ලැබෙන නුරුස්නා බැලුම් දැන් දරා ගැනීමට නො හැකි තත්ත්වයට උත්සන්න වී තිබිණි. එනිසා ම සවස් වරුවේ ජොවාන් සමග ගමට යාමට ඇය තීරණය කර තිබිණි. එනමුත් ඇරබෙලා නම් නො වැරදීම තරගය නැරඹීමට යනු ඇත. සැකයක් නොමැති ව ඇය ඉස්සරහ ම පේළියට වී සිටිනු ඇත.

"නියම අවස්ථාව!" ඔවුන් ආපසු පාසල දෙසට ඇවිද යද්දී ජූලියන් එකඟ වෙමින් කීවේ ය.

"මං එයා ගේ ඩෙස්ක් එකෙත් බලන්නම්," එලිසබෙත් උනන්දුවෙන් කීවේ ය. "ඔයා මොනා ද කරන්න හිතා ගෙන ඉන්නෙ?"

"මං ටෙනිස් මැච් එක බලන්න යනවා," ජූලියන් සැහැල්ලුවෙන් කීවේ ය. "ගිහින් ලකුණු ගණන් කරනවා."

එලිසබෙත් ආපසු පාසල තුළට යද්දී, ඇයට වෙන් වූ ලියුම් පෙට්ටියේ ලියුමක් තිබෙනු ඇය දුටුවා ය. එය ඉතා

www.sinhalaelibrary.com

තදින් සිල් කර තිබුණ අතර එම උඩ කොළවරේ 'එලිසබෙත් ඇලන් - පෞද්ගලිකයි.' යනුවෙන් ලියා තිබිණි. ඇය කෙළින් ම දිවුවේ ගැහැනු ළමයින් ගේ සනීපා දමන කුටියට ය. එතුළට වැදුණ එලිසබෙත් ඉක්මනින් ඇයට පිටුපසින් දොර අගුළු දමා ගත්තා ය. ලියුම ඉක්මනින් කැඩූ ඇය ඇතුළේ ඇත්තේ මොනවා දැයි බැලුවා ය.

ජෝන් ටෙරී ගෙන් ලියුමකි. ඔහු එය පාසලේ පිරිසිදු කරන්නියක අතේ හොර රහසේ එවා තිබිණි.

*එලිසබෙත්,*

*එක හැඩිලිවලට ස්තූතියි. දැන් මට හුඟක් සනීපයි. ඒවා හරි ම රසයි. තව ටික දවසකින් මං මේ සිර ගෙදරින් එළියට එනවා. හරියට ම අර වැදගත් වැඩේට ඕන්න මෙන්න කියලා. ඒත් මගේ හිතට බයයි. මොකද, මං අහගෙන හිටියා ටේඩිගොල්ලෝ කියනවා සඳුදා ඉඳලා කදට එම් කියලා. කාර්‍යකාරවරු, ළමින සතියේ හොඳට ඇහැ ගහගෙන ඉන්න. මතක තියා ගන්න ඒවට උදවු වෙන විදිහ කිසි ම වැඩක් කරන්න එපා හරි ද? එහෙම වුණොත් අපි කරගෙන තිබ්බ කැඩුවා වෙනවා. ඒ වගේ ම මට කියාව දෙන්න තව වැඩක් තියෙනවා.*

*උන් වගාව විනාශ කරන්න හැදුවොත්, කාර්‍යකාරලා තියෙන කැළවලින් හොඳ ම නිදර්ශක ටික පොළොවෙන් ගලවා අරගන්න. අරගෙන ඒවා පස්සෙ කොළවල ඔතලා ආම්පන්න ගබඩාවේ හංගන්න. ඒක ඇතුළේ උතුරට තිබුණ දඩු බිත්තියේ ලොකු සීන කාඩ් එකක් තියෙනවා. ඒවා ඒක ඇතුළෙන් තියන්න. කාට වත් කියා වී දෙන්න දෙන්න එපා, මොකද එහෙම වුණොත් ඒගොල්ලෝ කියා ගෙන් ප්‍රශ්න අහන්න පුළුවන්. ස්තූතියි මගේ විශේෂ උදවුකාරී....*

*හිතවත් මිතුරු,*

*ජෝන්,*

*පලි - මතා මේක කියවලා ඉවර වුණ ගමන් ම සම්පූර්ණයෙන් ම විනාශ කරලා දාන්න.*



එලිසබෙත් සැලකිල්ලෙන් ලියුම කියවා මතක තබා ගත්තා ය. ඇය වෙවුලන අත්වලින් ලියුම කුඩා කැබලිවලට ඉරා නාන කාමරයේ වූ කොමෝඩයට දමා සෝදා හැරියා ය.

ජෝන් ගෙන් රහසිගත ලියුමක් ලැබීම උද්දාමයට කාරණාවකි. ජෝන්ට උදවු කිරීමට ඇත් සැම උත්සාහයක් ම අසාර්ථක වීම ගැන ඇයට දැන් කළ හැක්කේ සතුටු වීම පමණකි. අන්තිමේ දී, තරඟ තොන්ඩේසි නැති නො වුණේ ය. ජෝන් එය දැන ගත්තා නම් ඔහු කෝපයට පත් වනු නො අනුමාන ය.

අන්තිමේ දී සලාද වගාව හෙළිමට ඔන්න මෙන්න තිබිය දී ඇයට ඉතා භයංකර රාජකාරියක් පවරා තිබේ. ඇය එය හොඳින් ම කරනු ඇතැයි ඔහු විශ්වාස කරයි. සතිය පුරා විනාස ම ඔහු නැවතත් රාජකාරියට බහිනු ඇත. දෙයියන්ට ස්තූති වේවා...! සලාද පැළ සංදර්ශනයේ දී කුසලානය දිනා ගනු ඇත. මුළු පාසලට ම ගෞරවයක් ගෙනෙනු ඇත! මේ සිතිවිලිවලින් පිරී සිටි එලිසබෙත් දිවා ආහාරයට වාඩි වූයේ ඇගේ හිස ගාම්භීර ලෙස කෙළින් තබා ගෙන ය.

පැට්‍රික් සහ එලීන් නැවත වරක් ඔවුන් ගේ තරඟ ජය ගෙන තිබිණි. හමුත් මේ තරඟය වුඩ්විලී සමඟ තිබූ තරඟයට වඩා තිබුණු එකක් විය. පැට්‍රික් ඉතා ආඩම්බරයෙන් ඔහු ගේ චොක්ලට් ක්‍රිස්පි කේක් කන්න ගෙයින්ස්වලින් පැමිණි අමුත්තන්ට අසින් අත යවද්දී මිස් රේන්ජර් සහ ඇගේ පන්තිය අත්පොළසන් දෙමින් ඔහුට සුබ පැතූහ.

"නියමයි පැට්‍රික්!" ඇරබෙලා කෑ ගැසුවා ය.

ඇය ජූලියන් දෙසට හැරී, "ඔයා ගේ නැසින් මාර දක්ෂයි නෙ."

"ආ... ස්, එයා එහෙම ද?" ජූලියන් අවඥාවෙන් ඇසුවේ ය.

ජයග්‍රාහී නගන පිරිස අතරට ඔහු එක් වූයේ නැත. ඔහු වැඩි වෙලාවක් ගත කළේ තරඟය හරම්මින් [illegible] බැලීමට පැමිණි ළමයින් ගේ හැසිරීම නිරීක්ෂණය කරමින් ය. විශේෂයෙන් එක් මුහුණක් නිරීක්ෂණය කරමින් ය.

www.sinhalaelibrary.com

එලිසබෙත්ට ඒ අතරතුර, වැදගත් වන විදිහේ කිසි ම දෙයක් හෝ හෝඩුවාවක් ඇරබෙලා ගේ අඩුම්කුඩුම් අතර කිසි හම්බ නො විණි.

පෝසත් උඩඟු හැඟැනු ළමයා කොතරම් ඇඳුම්, සපත්තු ජෝඩු ආදිය පාසලට අවසරයක් නොමැති ව ගෙන ඇවිත් ඇති හැටි දුටීමෙන් ඇය කම්පනයට පත් වූවා ය. එසේ කිරීම පාසලේ නීතිවලට පටහැණි නිසා ඇය ඒවා කිසි කෙනෙකුට නො පෙනෙන ලෙස ඇඳ යට සඟවා තිබිණි. ඒවා කෙසේ වෙතත්, ඇමෙරිකන් ක්‍රිස්ටි තියා ඇමෙරිකාවට සම්බන්ධ දෙයක් වත් එහි ඇති බවට සලකුණක් වත් නො වී ය.

මං එයාට මෙච්චර අකමැති නැත්නම් සමහර විට මට එයා ගැන දුක හිතෙනවා, එලිසබෙත් සිතුවා ය. ඇගේ සෝදිසි මෙහෙයුම අගවර වෙද්දී අනුන් ගේ දේවල් හොරෙන් අවුස්සා බැලීම ගැන වැරදිකාර හැඟීමක් ඇයට දැනෙමින් තිබිණි.

පන්තියේ ඉන්න ලොකු ම ළමයා වෙලත් පන්තියෙ අන්තිමයා වෙන එකයි, අම්මයි තාත්තයි දෙන්න ම එච්චර ඈතක ඉන්න එකයි හරි ම අවාසනාවක්. ඇයට ඇරබෙලා ගැන අනුකම්පාවක් ඇති වන්නට විය.

එලිසබෙත් සෝදිසි කිරීමෙන් පසු, ජෝවැන් සමග ගමට යාමට පිටත් වූවා ය. ජෝවැන් වැනි හොඳ යෙහෙළියක් ඇයට ලැබුණේ වාසනාවට ය. ඇරබෙලා ගේ මිතුරිය රෝස්මරි නම් ඉතා දුර්වල කෙනෙකි. ඇය කළේ ඇරබෙලා කියන කියන එකට 'ඔව්' කියමින් ඇයට පන්දම් ඇල්ලීම ය.

පසු ව ඇය ජූලියන්ට කීවේ "කනගාටුයි මට නම් කිසි ම දෙයක් හම්බුනේ නෑ. ඔයාට කොහොම ද?"

"මං නම් වැඩි වෙලාවක් බැලුවේ මැච් එක නෙමේ, රෝජර් ඩුවුන් ගේ මූණ." ඔහු පිළිතුරු දුන්නේ ය. "එයා හරි ම කලකිරීමෙන් ඉන්න පාටයි. පැට්‍රිකුයි එලිනුයි දින්නට



කොච්චර අප්පුඩි ගැහුවත් ඒක එයා ගේ මූණෙන් හොඳට ම පෙනුණා!"

"පැට්‍රික් ආයෙත් හොඳට සෙල්ලම් කරනවා දැකලා වෙන්නැති? ඒක ඉතින් එහෙම වෙන්න ඕන නේ!" එලිසබෙත් ටික වෙලාවක් කල්පනා කර බලා කීවා ය. "එයා තනියම හිතනවා ඇති ආයෙත් ටීම් තිබුණු තැන ගන්න. ලබන සතියේ සික්ලින් ග්‍රීන් එක්ක තියෙන්නේ ලොකු මැච් එකක්, අම්මලා තාත්තලාත් එනවා බලන්න. සමහර විට එයාට ලොකු ඕනකමක් තියෙන්නැති එදාට සෙල්ලම් කරන්න. යන හැටියට නම් පැට්‍රික් තමයි ආයෙත් සෙල්ලම් කරන්නෙ."

"ඔව් ඔයා හරි." ජූලියන් කීවේ ය. "ඒ කිසි දේකින් රෝජර් මේ දේවල් කරා කියලා ඔප්පු වෙන්නෙ නෑ නමුත්!"

දෙන්නා ගෙන් එක් කෙනෙකුට වත් රෝජර් ඩුවුන වැරදිකාරයා කිරීමට වුවමනාවක් නො වී ය.

"ඒ කොහොම වුණත්," ජූලියන් හුස්මක් පිට කළේ ය. "අපි එයා ගැන ඇහැ ගහගෙන ඉන්න එක හොඳයි."

ඉරිදා ඒ වෙද්දී ඇයට මතක් වූයේ තමා ඇහැ ගහගෙන සිටිය යුතු තවත් දෙයක් ඇති බව ය. නමුත් මෙවර ජෝන් ටෙරී ගේ සම්පූර්ණ අවසරය ඇති ව.

නැවතත් වැස්ස පටන් ගැනුණි.

එදින රාත්‍රිය පුරා ම වැස්ස ඇද හැළුණ අතර පසු දා උදෑසන ඔවුන් ප්‍රංශ භාෂා පාඩමට යද්දී ද දිගට ම පැවතිණි.

සලාද පැළ දැන් තියෙමට වැවිලා ඇති, එලිසබෙත් සිතුවා ය. ඒ වුණාට ඒවා විනාශ වෙන්න තාමත් ඉඩ තියෙනවා. මට සමහර විට හෙට වෙන කොට ඒවා ගලවන්න වෙයි. මං අද හවස තේ වෙලාවෙන් පස්සේ ගිහින් බලන්න ඕනි. කුඩයක් අරන් හරි යන්න ඕනි.

නමුත් එලිසබෙත්ට එහි යාමට කිසි දු අවස්ථාවක් නො ලැබිණි.

www.sinhalaelibrary.com

එදින උදේ ප්‍රංශ පාඩමේ දී කිසිවෙකුත් බලාපොරොත්තු නො වූ ඇබැද්දියක් සිදු විණි.

ඔවුන් සියලු දෙනා ම තම තමන් ගේ පුටුවල වාඩි වී, හිස බිමට නමා ගෙන කළුලෑල්ලේ ලියා තිබූ ඡේද පිටපත් කරමින් සිටියහ. මැම්'සෙලා සුපුරුදු පරිදි ඇගේ බිස්කට් ටින් එක ඇර අත දැමුවේ සතියේ පළමු වැනි ඕට පිටි බිස්කට් එක එළියට ගැනීමට ය.

"ඊ.... යා....!" යටිගිරියෙන් කෑ ගැසීමක් පන්තිය පුරා ම පැතිර ගියේ ය.

මැම්'සෙලා බෙරිහන් දී ගෙන ම ටින් එක බිම අතහැරියා ය. තිවැරදි ව තම බිමට විසි කළා ය. ඇය බිස්කට් යැයි සිතා එළියට ගෙන තිබුණේ මැරිච්ච හංබෙල්ලන් රොත්තකි.

9

# රැස්වීම එලිසබෙත්ට දඬුවම් කිරීමට තීරණය කරයි

මැම්'සෙලා පස්සට පැන්නා. ඇය අතේ වූ හංබෙල්ලන් වේගයෙන් ගසා දැම්මා ය. ඉන් එකෙක් ඇරබෙලා ගේ නහයේ වැදුණ අතර ඇයත් යටිගිරියෙන් බෙරිහන් දුන්නා ය. ටින් එක මහ හඬක් නගමින් බිම පතිත වූ අතර මැරුණු හංබෙල්ලන් පන්තිය හතර අත විසි විය. ඒ අතර ගොළුබෙල්ලන් කිහිප දෙනෙක් ද විය.

පන්තියේ දොර වේගයෙන් විවෘත වූ අතර ඒ වේගයෙන් ම මිස් බෙලා පන්ති කාමරයට ඇතුළු වූවා ය.

"මොකක් ද ප්‍රශ්නේ....?" ඇතුළු වූ විගස ඇය ඇසී ය.

"මේක තමයි ප්‍රශ්නෙ, ලොකු ම ලොකු ප්‍රශ්නෙ!" මැම්'සෙලා කෑ ගැසුවා ය. ඇය සායේ ඇලී සිටි හංබෙල්ලකු හිරිකිතයෙන් ගෙන ඇගෙන් හැකි පමණ ඈතට කර මිස් බෙලාට පෙන්වීමට අල්ලා ගෙන සිටියා ය. ඇය ඌ මහපටැඟිල්ලෙන් සහ දබර ඇඟිල්ලෙන් පුළුවන් තරම් අඩුවෙන් අල්ලා ගෙන සිටි අතර ඌ බිම සිටි අනෙක් මිතුරන් සමඟ එකතු වීමට වැඩි වෙලාවක් ගත නො විණි. "බලන්න මොන දහජරාවක් ද මගේ ටින් එකට අලා

කියන්නෙ කියලා. මේ පන්තියේ හරි ම දුෂ්ට ළමයි වගයක් ඉන්නවා. ඒගොල්ලෝ හිතන්නෙ ඒගොල්ලො හැමෝම ව හිනා ගස්සනවා කියලා මේ වගේ අසික්කිත වැඩ කරලා..."

පන්තියේ ළමයි අතින් කට වසා ගනිමින් ඉතා අමාරුවෙන් සිනහව වළකා ගෙන සිටියහ. ඇරබෙලා බෙරිහන් දුන් හැටි...! මැම්'සෙලා හංබෙල්ලා ව අල්ලා ගෙන සිටිය හැටි...! ඇය පෙනුණේ කවටයකු ලෙස ය. මේවා මතක් වන විට සිනා නො වී සිටීම කොහෙත් ම කළ නො හැකි ය.

මිස් බෙලා ගේ එක බැල්මකින් සිනා හඬවල් සියල්ල ම යටපත් විය. ඇය සිටියේ තරහෙන් පිපිරෙමිනි.

"මාටින්, මිනින් හොයා ගෙන එන්න ඉස්කෝලේ පිරිසිදු කරන එක්කෙනෙක්, ඇවිත් මැම්'සෙලා වෙනුවෙන් මේ බිළ පරාව අස්කරලා දාන්න කියන්න, අනෙක් හැමෝම නිශ්ශබ්ද ව වාඩි වෙලා ඉන්න."

මැම්'සෙලා ඇගේ අත ඉතා හොඳින් සබන් ගා සෝදා ගෙන ආපසු මිස් බෙලා ළමයින් දෙස ටික වෙලාවක් බලා සිට පාඩම කිරීමට පටන් ගත්තා ය.

"කවුරු හරි, මේ මෝඩ විහිළුව කරපු කෙනා ඇවිත් දවල් කෑම වෙලාවේ දී වැරැද්ද පිළිගන්න ඕන.... එච්චරයි." සැරෙන් හා උණුසුමින් කී ඇය කතාව අවසන් වෙද්දී ම අධි වේගයෙන් ම පන්ති කාමරයෙන් පිට වූවා ය.

ඉන් පසු මුළු පන්තිය ම දඟකාර වූ බවක් පෙනෙන්නට විය. එලිසබෙත් මූණ ඇද කර ගෙන සිදු වූ ප්‍රහේලිකාව ගැන සිතන්නට වූවා ය. ඇයට සිනා ගැනීමට නො හැකි වූයේ කුණු ගොඩේ වූ ජෝන් ගේ මැරුණු හංබෙල්ලන් කොහොම මැම්'සෙලා ගේ බිස්කට් ටින් එකට ඒමට පාර හොයා ගත්තේ කොහේ ද යන්න ය.

ඇත්තට ම ඉස්කෝලේ විහිළුකාරයෙක් ඉන්නවා ද? ඒ කෙනා ම ද පැට්‍රික් ගේ ටෙනිස් රැකට් එක හැංගුවේ?

"රොජර් මෙක කරා වෙන්න බෑ." ඇය දිවා ආහාරයේ දී ජූලියන්ට කෙඳිරි ය. "ඒකට එයාට කිසි ම හේතුවක් නැනේ!"



"අනෙක ඔයා හිතනවා ද ඇරබෙලා හංබෙල්ලො අල්ලන්න කියා උන් දිහා බලන්න වත් හිතයි කියලා?" ජූලියන් ආපසු කෙඳිරි ය. මෙය එලිසබෙත්ට මෙන් ම ජූලියන්ට ද ප්‍රහේලිකාවකි.

මිස් බෙලා, මිස් බෙස්ට් සහ මිස්ටර් ජෝන්ස්ට ද මෙය ප්‍රහේලිකාවකි. කියන ලද පරිදි පළමු පන්තියේ කිසි ම සිසුවෙක් වැරැද්ද පිළිගැනීමට පැමිණියේ නැත. වැරැද්දකාරයා ඇත්තේ වෙන තැනක විය හැකි ය. ඒ ඔවුන් ගේ නිගමනය විය.

ඒ නිසා පාසලේ සියලු ම ළමයින් සඳහා හදිසි රැස්වීමක් කැඳවන ලෙස මුළු පිලියම හා ට්‍රීටාට දැනුම් දුන්හ.

එදින ම, සවස තේ පානයෙන් පසු හදිසි රැස්වීමකට ළමයින් ව කැඳවන ලදී.

"වැරැද්දකාරයා ඉක්මනට පිළිගත්තොත් හොඳයි." ඔවුන් කාලාවට පිරෙද්දී බෙලින්ඩා කෙඳිරුවා ය. "මට මගේ අලුත් කැසට් එක අහන්න තියෙනවා."

"මං නම් බලා ගෙන ම හිටියේ ටෙනිස් ගේම් එකක් ගහන්න. ඒ වුණාට නාම වහිනවා." කැත්ලීන් කීවා ය. "මට නම් හිතා ගන්න වත් බෑ කවුද කුස්සියට රිංගලා මැම්'සෙලා ගේ ටින් එක අරගෙන ඒකට හංබෙල්ලෝ පිරෙව්වෙ කියලා. අඩු ම තරමේ ඒක අපේ පන්තියේ කෙනෙක් නෙමෙයි වගේ කරලා තියෙන්නෙ."

"ඔව්, ඒක එලිසබෙත් ගේ තවත් විහිළුවක් නෙමෙයි නම්." ජෙනී අසතුටෙන් කීවා ය. "ආයෙ ම පාරක් කරලා පිළිගන්නේ නැතුව ඉන්නවා ද දන්නෑ!" ඇය එකතු කළා ය.

ඇත්තෙන් ම පළමු වැනි පන්තියේ අනෙක් සිසුන්, විශේෂයෙන් ඇරබෙලා සහ රෝස්මරි එකිනෙකාට කොඳුර කොඳුර සිටියේ එය එසේ ම වන්නට ඇති බව ය. ඔවුන් සියල්ලන් ම දැන් ඉතා උනන්දුවෙන් බලා සිටින්නේ රැස්වීමේ දී කුමක් සිදු වේ දැයි සිතමින් ය.

www.sinhalaelibrary.com

එලිසබෙත් ඒ වන විටත් ශාලාවට පැමිණ ජූලියත් අසල වාඩි වී සිටියා ය. ඇගේ මුහුණ ගාම්භීර ලෙස කෙළින් පිහිටියේ ය. ළමයින් මොනවා සිතුවත්, මොනවා කිව්වත් ඇත්ත රැස්වීමේ දී එළිවනු ඇතැයි ඇය තදින් ම විශ්වාස කළා ය. එය ආරම්භ වන තෙක් ඇයට ඉස්පාසුවක් නො වී ය. රැස්වීම අවසන් වූ විගස ම ජෝන් ගේ වත්තට බැලීමට යාමට ඇයට දැඩි වුවමනාවක් විය.

ප්‍රධාන ශිෂ්‍ය නායකයා සහ නායිකාව සමඟ අනෙක් ශිෂ්‍ය නායක නායිකාවෝ පුරුදු පරිදි වේදිකාව මත වාඩි වූහ. ඔවුන් සියල්ලන් ගෙන් ම පළ වූයේ බරපතළ බවකි. මිස් බෙලා, මිස් බෙස්ට් සහ මිස්ටර් ජෝන්ස් වෙන ද මෙන් ශාලාවේ කෙළවරේ වූහ.

මුළු පාසල ම සිටියේ උනන්දුවෙනි. මෙවැනි විශේෂ රැස්වීමක් කැඳවීම වයිටලීෆ්වලට දුලබ අවස්ථාවකි.

විලියම් කුඩා මිටියෙන් මේසයට තට්ටු කළේ ය.

"මං හිතනවා මේ ප්‍රශ්නෙ ඉක්මනට විසඳගන්න පුළුවන් වෙයි කියලා." ඔහු රැස්වීම අමතා කීවේ ය.

ඉන් පසු විලියම්, පළමු වසර ළමයින් ගේ ප්‍රංශ භාෂා පාඩමේ දී සිදු වූ ඇමැද්දිය හරිහැටි නො දන්නා (මේ වන විට ඉතා ම ටික දෙනෙකි) අයට සිදු වූ දෙය පැහැදිලි කළේ ය.

ඔහු ශාලාව පුරා ම සෙමින් නමුත් සැලකිල්ලෙන් ඇස යැව්වේ ය.

"සාරාංශෙ තමයි, මේ ශාලාව ඇතුළේ ඉන්න කවුරු හරි කෙනෙක් මෝඩ විහිළුවක් කරලා තියෙනවා. පළමු වැනි පන්තියේ ළමයි විතරක් මේකට සැක කරන එක සාධාරණ නෑ. ඒ නිසා රීටයි මායි මුළු ඉස්කෝලෙන් ම ඉල්ලන්නේ මේ වැරැද්ද කරපු කෙනාට නැගිටලා ඒක පිළිගන්න කියලා. රැස්වීම එයාට ලැබෙන්න ඕන දඬුවම ඊට පස්සේ තීරණය කරයි."

ඔහු බලා සිටියේ ය.



ශාලාව තුළ කිසි දු වෙනසක් සිදු නො වී ය.

"කරුණාකරලා, මේ වැඩේ අයිතිකාරයා බාර ගන්නවා ද?" විලියම් නැවතත් කීවේ ය.

ඔහු අකමැත්තෙන් දෙවුර හැකිළුවේ ය. ඉන් පසු විලියම් රීටා ගේ සහ අනෙක් ශිෂ්‍ය නායක- නායිකාවන් ගේ අදහස් විමසන්නට වූයේ ය. විනාඩියකින් පමණ නැවත පැමිණි විලියම් ශාලාවේ කසුකුසුව නැති කිරීමට මිටියෙන් මේසයට තට්ටු කළේ ය.

"කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. ඔයගොල්ලෝ දන්න විදිහට වයිටලීෆ් ඉස්කෝලේ අපි සාමාන්දර කියන ඒවා විශ්වාස කරන්නේ නෑ. හැබැයි වැරදිකාරයා පිළිගන්නේ නැතත් අපි වෙන මොනවා හරි විදිහකින් මේකෙ ඇත්ත හැත්ත හොයා ගන්නවාමයි. කවුරු හරි කෙනෙක් ඉන්නවා නම් මේක පැහැදිලි කර ගන්න උදවු වෙන විදිහේ තොරතුරක් හරි දන්න, කරුණාකරලා නැගිටින්න?"

පෙර සිදු වීම මතක් වීමෙන් ඇරබෙලාට තමා ව පාලනය කර ගත නො හැකි විය. ඇය පැට්‍රික් දෙස බැල්මක් හෙළුවා ය. නමුත් ඔහු ඉක්මනින් 'එපා' ලෙස හිස වනා පොළොව දෙස බලා ගත්තේ ය.

එකෙණෙහි ම ශාලාවේ ඉදිරි දෙසින් ශබ්දයක් ඇසුණි. බිම කකුල් නවා ගෙන වාඩි වී සිටි බාලාංශ පන්තියක කුඩා දැරියක් කකුලට බර දී සෙමින් නැගිට්ටා ය. ඒ සොෆියා ය.

"ඔයාට මොනා ද කියන්න ඕන, සොෆියා?" රීටා ඉතා මෘදු ලෙස ඇසුවා ය.

"මං දන්නවා කොහොමද ඒ කෙනා මැට්වල නැත හංගෙල්ලන් ව හොරකම් කරන්න ඇත්තෙ කියලා." පුංචි දැරිය ඇස් විසල් කරමින් බරපතළ විලාසයකින් කීවා ය.

"ඒ කෙනා ඒවා එලිසබෙත් ගෙන් හොරකම් කරන්න ඇත්තෙ."

එලිසබෙත් ගේ බඩ දඟලන්නට විය. ඇගේ පන්තියේ ළමයින් විස්මය නිසා එක්වර ම හුස්ම ඉහළට අදිනු එලිසබෙත්ට ඇසුණි.

"එලිසබෙත් කෝ?" රීටා ඇසුවා ය.

"එයාට ගොවිපලේ විශේෂ තැනක් තියෙනවා, එතැන එයා මැරිච්ච හංබෙල්ලො ගොඩාරියක් කොටගහලා තියා ගෙන ඉන්නවා." සෝෆියා ඉතා හොඳින් කාටත් ඇසෙන ලෙස පැහැදිලි කරන්නට වූවා ය. "සමහර වෙලාවට එයා ආසයි උන් එක්ක සෙල්ලම් කරන්න." එලිසබෙත් දෙස බැලීමට පිටුපස හැරෙමින් කුඩා දැරිය අව්හිංසක ව කීවා ය.

"දැන් ඔයාට වාඩි වෙන්න පුළුවන් සෝෆියා." විලියම් කීවේ ය. "එලිසබෙත් නැගිටින්න. කරුණාකරලා." එලිසබෙත්ට වෙන කළ හැකි කිසි ම දෙයක් නො වූ නිසා ඉතා ඕනෑ ලෙස සෙමින් විලියම්ට කීකරු වූවා ය. ඇගේ සම්පූර්ණ සිත් ගත්තාක් මෙන් ඇයට දැනුණි. ජූලියන් පවා ඇය දෙස බලා සිටියේ පුදුමයෙනි.

"මේ කතාව ඇත්ත ද?" විලියම් ඇසුවේ ය. "ඔයාට අයිති මැරිච්ච හංබෙල්ලො ඉන්නවා ද?"

"මට උන් ව අයිති නෑ." එලිසබෙත් කරුණු කීවා ය.

"ඒ වුණත් උන් ඉන්නේ කොහේ ද කියලා ඔයා දන්නවා? අනෙක ඔයා උන් එක්ක සෙල්ලම් කරන්නත් කැමතියි, එහෙම ද?"

ඉහළ පන්තිවල සිසුන් සිනහව වළක්වා ගැනීමට තැත් කිරීම නිසා නාසයෙන් පිම්බින්නාක් වැනි ශබ්දයක් ශාලාව පුරා ම පැතිර යන්නට විය.

"මං දන්නවා උන් වගයක් ඉන්න තැනක්." එලිසබෙත් පිළිතුරු දුන්නා ය.

"ඒ වුණාට මං උන් එක්ක සෙල්ලම් කරන්නෙ නෑ. මං නිකන් කෝටුවක් අරන් උන් ව එහා මෙහා කරා, ඇත්තට ම මැරිලා ද කියලා බලන්න."

ඇය කතාව නවත්තා ගත්තා ය. මේ විදිහට ප්‍රශ්න කර ගෙන ගියොත් ඇය නො දැනුවත් ව ම ජෝන් ගේ රහස එළියට එන්නට ඉඩ ඇත.

"අපෙන් සමහරක් ඒ වැඩේට සෙල්ලම් කරනවා කියලා කියන්න පුළුවන්." විලියම් තම අදහස ප්‍රකාශ කළේ ය.



ඉන් පසු ව ප්‍රධාන ශිෂ්‍ය නායිකාව නැගිට විලියම් ගේ තැන ගත්තා ය.

"එලිසබෙත්." රීටා ඉතා මෘදු ලෙස කීවා ය. ඇයට එය විශ්වාස කිරීමට නො හැකි ප්‍රහේලිකාවක් විය. "කරුණාකරලා මේ පොඩි ප්‍රශ්නෙට උත්තර දෙන්න. 'ඔව්' හරි 'නෑ' හරි කියලා. ඔයා මැම්'සෙලා ගේ ටින් එකට හංබෙල්ලන් ව දැම්ම ද?"

"නැහැ රීටා මං එහෙම කළේ නෑ." ඇගේ කටහඬ ඉතා උස් හා පැහැදිලි විය. "කවුරු හරි වෙන කෙනෙකුට ඔහේ හංබෙල්ලන් ව හම්බ වෙන්න ඇති. ඒක තමා වෙලා තියෙන්න ඕන."

ඇරබෙලාට මේවා දරා ගැනීමට නො හැකි තරම් ය. හැලියමින් සිටි ඇ එක්වර ම උඩ පනින්නාක් මෙන් නැගිට්ටා ය.

"පව්!" ඇය කෝපයෙන් කෑ ගැසුවා ය. "ඔයා ම තමයි ඒක කරන්න ඇත්තෙ!"

"ඔය ඇති. ඇරබෙලා බක්ලි තරහ පාලනය කර ගෙන විනීත ව හැසිරෙන්න ඉගෙන ගන්න." විලියම් තදින් කීවේ ය. "ඔයාට මොනවා හරි කියන්න තියෙනවා නම් වැදගත් විදිහට ඒක කරන්න."

ඇරබෙලා තදින් හුස්මක් ගත්තා ය. නමුත් ඇය කතාව ගොතා ගැනීමට තියා සිතා ගැනීමටත් පළමු ව පැට්‍රික් ඇගේ අතින් අල්ලා ගත්තේ ය.

"කට පියාගෙන වාඩි වෙන්න ඇරබෙලා!" ඔහු අප්‍රසාදයෙන් කීවේ ය. "ඔයාට කිසි ම සාක්කියක් නෑ."

ඇරබෙලා කෙමෙන් සන්සුන් වූවා ය.

"හොඳයි, එහෙනම්." සාදරයට පත් වූ ලෙසින් විලියම් කීවේ ය. "මටයි රීටටයි අනෙක් මොනිටර්ස්ලාත් එක්ක කතා කරලා තීරණයක් ගන්න වෙනවා මේක ගැන."

වේදිකාව මත සිටි සියල්ලෝ ම එක තැනකට එකතු වී ළමයින්ට නො ඇසෙන ලෙස සාකච්ඡා කරන්නට පටන්

ගත්හ. ඒ අතරතුර ශාලාව තුළ ළමයින් එකිනෙකාට කොඳුර ගන්නට වූහ. ජුලියන් එලිසබෙත් ගේ අත මිරිකුවේ ය.

"දැංගන අය හැංබෙල්ලෝ කන්නෙ නැද්ද?" ඔහු එලිසබෙත් සමඟ කවටකමට සිනාසුණේ ය.

"මං හිතන්නේ ඒක දන්නැති කවුරු හරි තමයි මැම්'සෙලාට ඒ විහිළුව කරන්න ඇත්තේ?"

"ඉතින් මොකද?" එලිසබෙත් අප්‍රසාදය පළ කිරීමට මූණ ඇද කළා ය. ඇයට ජුලියන් ගේ විහිළුවලට හවුල් වීමට වුවමනාවක් නො වී ය. ඇය නො ඉවසිල්ලෙන් බලා සිටියේ රැස්වීමේ තීරණය දැන ගැනීමට ය. ඇයට ජෝවැන් වේදිකාව මත සිට කලබලයෙන් කතා කරනු පෙනුණි. කවුරු කෙසේ වුවත් තම හොඳ ම මිතුරිය තමන් ගේ පැත්තට කතා කරනු ඇතැයි ඇයට තද විශ්වාසයක් විය.

බොහෝ වේලාවකට පසු විලියම් මේසය අසලට විත් මිටියෙන් එයට තට්ටු කළේ ය.

"අපි තීරණයක් අරන් ඉවරයි. දෙවන පන්තියේ මොනිටර්ස්ලා දෙන්නෙකුට හොඳට ම විශ්වාසයි, පළමු වැනි පන්තියේ ළමයි අතර මොන විදිහක දබරයක් ඇති වෙලා තිබුණත්, එලිසබෙත් ඇලන් ඉතාමත් අවංකයි කියලත් එයා හිතා ම දවසක වැරැද්දක් කරලා පිළිගන්නැතුව ඉන්න කෙනෙක් නොවෙයි කියලත්. ඒගොල්ලෝ එයා ව හොඳට අඳුරනවා. කොහොම වුණත් රීටයි මායි ඉන්නේ එක ම අදහසක. අපිට කිසි ම සාක්ෂියක් නෑ මේක එලිසබෙත් කළා කියන්න. අනෙක එයා මුළු රැස්වීම ඉස්සරහම පිළිගත්තා එයා ඒක කළේ නෑ කියලා. අපි කොහොම හරි මේකට වැරදිකාරයා හොයා ගන්නවාමයි. එතකම් ඒ අයට දඬුවම තමයි ඒගොල්ලන් ගේ ම හෘද සාක්ෂිය."

එලිසබෙත් ඉහළට ඇද ගත් හුස්ම පහතට හෙළුවා ය. වයිටලීෆ් වගේ ඉස්කෝලෙක ඉගෙන ගන්න ලැබුණ එක වාසනාවක්. ඇය සිතන්නට වූවා ය. නමුත් ඇගේ සතුට



සහගාට්ටවකට පෙරළීමට ගත වූයේ සුළු මොහොතක් පමණි.

"කොහොම වුණත් මැට්ටව හැංබෙල්ලෝ එක්ක විහිළු වෙන එක ඉස්කෝලේ කලින් හිටපු මොනිටර්ස් කෙනෙක් විදිහට අපි එලිසබෙත් ගෙන් බලාපොරොත්තු නොවිච්ච දෙයක්. ඒ වැඩේ නිසා කාට හරි මැම්'සෙලාට විහිළුව කරන්න අදහසක් ලැබෙන්න ඇති. කරුණාකරලා ආයෙත් නැගිටින්න එලිසබෙත්. අපි ඔයා ගේ දඬුවම තීරණය කරලා ඉවරයි."

එලිසබෙත් නැගිට දඬුවම නියම කරන තෙක් වේදිකාව දෙස බලා සිටියා ය.

"ජෝන් ටෙරීට සනීප වෙලා ආයෙත් ගොවිපළේ වැඩ බලනකම් ඔයාට ගොවිපළට යන්න තහනම්. ඒක හොඳින් ම හිතට ගන්න ඕන හරි ද?"

එලිසබෙත් හිස සලා එකඟ වෙමින් වාඩි වූවා ය. ඇගේ මුහුණ කඩදාසියක් තරමට ම සුදුමැලි වී පෙනෙන්නට විය.

රැස්වීම ඒ අයුරින් අවසන් විය. සොෆියා සිටියේ හොඳට ම කලකිරීමෙන් ය. ඇයට එලිසබෙත් ව අමාරුවේ දැමීමට කොහෙත් ම වුවමනාවක් නො වී ය.

"ඔයා මගෙන් ඇහුවා නම් මං කියන්නේ, එලිසබෙත් ඇලන් ඔයා ලේසියෙන් බේරුණා! කියලා." ඇරබෙලා රවමින් කරනෙන් කෑ ගැසුවා ය.

"කාට ද මිනී මේ මහ වැස්සෙ වත්තෙ වැඩ කරන්න!"

"ඔව්, මාර විහිළුවක් නෙ ඒ දඬුවම." ඇරබෙලා ගේ දෝංකාරය කතා කළා ය.

පැට්‍රික් ගේ මුහුණේ කල්පනාකාරී පෙනුමක් විය. ඔහු ඉක්මනින් ඇරබෙලා හා ඇගේ යහළුවන් එලිසබෙත් වෙතින් ඉවත් කර ගත්තේ ය.

'ලේසියෙන් බේරුණා?' ඔවුන් ආපසු යන දෙස බලා ගෙන එලිසබෙත් කෝපයෙන් සිතුවා ය.

www.sinhalaelibrary.com

සිදු වූ අකරතැබ්බය නිසා ඇයට හැඬීමට වුවමනා විය. පාසල් ගොවිපළට යාම ඇයට තහනම් ය. සියලු ම ළමයින් ඉදිරියේ දුන් තීන්දුවට එරෙහි ව යාම ඇයට කළ නො හැකි ය. තීන්දුව කොතරම් අසාධාරණ වුවත් ඇයට කිරීමට කිසි ම දෙයක් නො වී ය.

ඇයට දැන් ජෝන් ටෙරි ගේ රහසිගත උපදෙස් පිළිපැදීමට නො හැකි ය. ඇයට ජෝන් ගේ වටිනා වගාව බේරා ගැනීමට නො හැකි ය. හැම තිස්සෙ ම දුකමයි, හැම තිස්සෙ ම උදවු කරන්නයි හදන්නෙ. ඒ වුණාට අනෙක් අයත් කරදරේ අලා මාත් ඒ කරදරේ ම වැටෙනවා.... අයියෝ.... මං දන්නෑ.... ඇය සිතුවා ය.

රැස්වීම, ඇයට දිය හැකි බරපතළ ම දඬුවම මෙය නො වේ ද?

10

## ඇරබෙලා ආයෙත් කරදර ඇති කරයි

"එන්න රෝස්මරි අපි ගිහින් කෝකි නෝනා එක්ක කතා කරලා බලමු." පසු දින සවස ඇරබෙලා රෝස්මරීට කීවා ය. "කවුද දන්නෙ, එයා සමහර විට මොනා හරි දකින්න ඇති."

"ඔයා ඇත්තට ම හිතනවා ද අපි එහෙම කළොත් හොඳයි කියලා." රෝස්මරි පුරුදු බයාදු බවින් ඇසුවා ය.

"එහෙම කළොත් හොඳයි තමයි, අපි එහෙම කරන්න ම ඕනා. ඔයා හිතනවා ද මැම්'සෙලාට ඒ වගේ දුෂ්ට විහිළුවක් කරපු එලිසබෙත්ට ඇඟ බේරා ගෙන සුදනා වගේ ඉන්න දෙන්න ඕනි කියලා! පැට්‍රික් කියන්නෙ අපිට සාක්ෂි නෑ කියලා නෙ. හරි අපි ගිහින් බලමු මොනා හරි හොයා ගන්න පුළුවන් ද කියලා!"

පැට්‍රික් සමඟ පැය විසිහතරකට පෙර ඇති වූ කතාබහෙන් පසුවත් ඇරබෙලා ගේ අදහස් වෙනස් වී නො තිබිණි.

නමුත් පැට්‍රික්ට නම් මෙය මහ පටලැවිල්ලකි. එලිසබෙත් පෙර දින කැඳවූ රැස්වීමේ දී හැසිරුණු ආකාරය

ඔහු ගේ සිත් ගත්තේ ය. ඇගේ කටකතාවේ වූයේ පැහැදිලි අවංක බවකි. නමුත් එලිසබෙත් තමා ගේ ටෙනිස් පිත්ත සැඟවූ බවට ඔහු තුළ වූ විශ්වාසය නො වෙනස් ව පැවතිණි. සමහර විට එලිසබෙත්ට මාව පේන්න බැරුව ඇති, ඒ නිසා එහෙම කරන්න ඇති. ඔහුට සිතිණි. ඇය තමාට මෙතරම් ම අකමැති වීම ඔහුට වේදනාවක් විය.

සහතිකෙන්ට ම එයා මැම්'සෙලාට අකමැති නැ නෙ. එයා මොකට ද ඒ වගේ දුෂ්ට විහිළුවක් මැම්'සෙලාට කරන්නෙ? ඒක කිසි තේරුමක් නැති කතාවක්. රැස්වීමේ දී එයා කතා කරපු විදිහට එයා බොරුවක් කරනවා කියලා හිතන්න කොහෙත් ම බැ. එයා කතා කරපු සේරම දේවල් ඇත්ත වෙන්නැති. ඉස්කෝලේ අනුනොවී විහිළු කරන කවටයෙක් ඉන්නවා වත් ද? කවුරු හරි මොළේ විකාර කාරයෙක්, හිතෙන හිතෙන වෙලාවට එයා කරන විහිළුවලට එහෙන් මෙහෙන් එක එක අය ව අල්ල ගන්න කෙනෙක්. ඒ වුණාට එහෙම කෙනෙක් මගේ රැකට් එක මිස්ට ගේ වාහනේ ඩිකියේ හැංගුවා කියන එක නම් වෙන්න බැ. ඒක සිතන්නත් අමාරුයි. හරියට හංගන්න වෙන තැනක් නැ වගෙයි නෙ. පැට්‍රික් තනි ව ම තර්ක කරන්නට වූයේ ය.

'ඇත්තට ම වෙන්න පුළුවන් ද?' පැට්‍රික් සිතුවේ ය. 'එලිසබෙත් ඇත්තට ම මං වෙනුවෙන් එච්චර මහන්සි වෙලා ඒ ටික වෙලාවෙන් ඒක හොයා ගත්තා ද?' ඒත් එක්ක ම පැට්‍රික්ට මතක් වූයේ තමා ඇයට කරන ලද අපහාස ය. ඔහුට එලිසබෙත් ගැන අනුකම්පාවක් ඇති විය. අනෙක් අතින් එය ඔහුට සතුටට කාරණයක් ද විය. 'එකෙන් පේනවනේ, එලිසබෙත් මට අකමැති නැ.' අන්තිමට! ඔහු සිතුවේ ය.

"ඔයා හිතන දේවල් මහ විකාර පැට්‍රික්?" ඇරබෙලා අවඥාවෙන් කීවා ය.

"ඔයාට අමතක වුණා ද අර නැතිවෙච්ච කිරි ජෝගුව? එයා ඒක පිළිගත්තෙ නැ නෙ. අන්තිමට ඒක එයා ගාව ම තිබිලා හම්බ වුණානෙ!"



පැට්‍රික්ට දීමට පිළිතුරක් නො වූ නමුත් ඇරබෙලා කී දේවල් පිළිගෙන එලිසබෙත් ව වැරදිකාරියා කිරීමට ඔහුට වුවමනාවක් නො වී ය.

"අපි බලමු අපිට මොනා ද හොයා ගන්න පුළුවන් කියලා!" ඇරබෙලා දැන් රෝස්මරීට කීවා ය. ඇරබෙලා සතු වූයේ කුතුහලයෙන් හා උනන්දුවෙනි. ඔවුන් දෙදෙනා පාසලේ මුරතැන්ගෙය දෙසට ඇවිද යද්දී ඇරබෙලා කල්පනාවකට බර වූවා ය.

මැම්'සෙලා සිකුරාදට එයා ගේ බිස්කට් ටින් එක ඊළඟ සතියට පුරවන්න කියලා කුස්සියට බාර දෙනවා. ඒක හැමෝම දන්න කාරණයක්. ඒ කියන්නේ එලිසබෙතුත් ඒක දන්නවා. කල්පනා කර අවසානයේ ඇරබෙලා ඇගේ තීන්දුව දෙන්නට වූවා ය. "එලිසබෙත් සති අන්තයේ දී ටින් එකට දාලා හංබෙල්ලෝ හොඳට වහන්න ඇති. ඊට පස්සෙ මැම්'සෙලා එන්න ඇති එයා ගේ මිට් බිස්කට් ටින් එක අරගන්න. ටින් එක උස්සා ගත්තහම ඒකෙ බර නිසා මැම්'සෙලා හිතන්නැති බිස්කට් ඇතුළෙ තියෙනවා කියලා! එයා ඇරලා බලන්නේ නැතුව අරගෙන යන්නැති! මට ඇනුයි මේවා ඔක්කොම තේරෙන්නෙ!" ඇරබෙලා රැව්වා ය.

"ඒකෙ තිබුණ බිස්කට්වලට මොනා වුණා ද දන්නෑ."

"ඒක අපිට අහලා දැන ගන්න පුළුවන් දෙයක්!" ඇරබෙලා ගේ හැල්ල හරිහැටි තේරුම් ගැනීමට නො හැකි වූ බියාදු රෝස්මරී කීවා ය.

ඔවුන් මුරතැන්ගෙයට ළං වන විට පෝසී නෝනා හවස ගේ විවේකයට ගොස් සිටි නමුත් ඇගේ අත්උදව්කාරියක වන මොලී එහි සිටියා ය.

"මුළු සති අන්තෙ ම මං නම් සැක හිතෙන කිසි ම කෙනෙක් දැක්කෙ නැ." කිසිවක් තේරුම් ගැනීමට නො හැකි ව මොලී කීවා ය.

ඉන් පසු රෝස්මරී ඇගේ එක ම ප්‍රශ්නය ඇසුවා ය. "මැම්'සෙලා ගේ මිට් පිටි බිස්කට් කොහේ හරි වැටිලා තියෙනවා දැක්ක ද මොලී?"

www.sinhalaelibrary.com

"ඇත්තට ම ඒ වගේ ප්‍රශ්නයක් අහන එක නම් හරි ම විහිළුවක්," මොලී අසතුටෙන් පිළිතුරු දුන්නා ය. "මං දන්නා ඒවා ඔක්කොම මැම්'සෙලා සෙනසුරාදා හවස කුණු බක්කියට විසි කරලා තියෙනවා. මං හිතන්නේ මේ සතියේ බිස්කට්වල පෙනුමට මැම්'සෙලා එච්චර කැමති නෑ වගේ. ඒ වුණාට ඒක නම් හරි ම නාස්තියක්."

"කුණු බක්කියට!" ඇරබෙලා විස්මයට පත් ව උස් හඬින් ද, රෝස්මරී බියට පත් වී බියාදු ලෙස ද කෑ ගැසූහ.

"මොලී ඔයාට හොඳට ම විශ්වාස ද අපේ පන්තියේ කවුරු වත් සෙනසුරාදා හවස මේ පැත්තේ දක්කෙ නෑ කියලා?" ඇරබෙලා සුළු හෝ හෝඩුවාවක් දැන ගන්න අදහසින් බැගෑපත් ව ඇසුවා ය. "ඊට ටිකකට කලින්, ඒ කියන්නේ මැම්'සෙලා ඇවිත් ටින් එක ගන්න ටිකකට කලින්? හොඳට හිතන්න මොලී, හොඳට හිතලා බලන්න!"

"ඇත්තට ම පැට්‍රික් විතරයි ආවේ." මොලී ටික වෙලාවකට පසු ව කීවා ය. "එයා ආවේ ටෙනිස් ටින් එක අරගෙන යන්න. එයා ටෙනිස් මැච් එකට හරි ම රස චොක්ලට් ක්‍රීම් කේක් වගයක් හැදුවා. ඒ ටින් එකත් තියලා තිබුණේ මේසෙ උඩ. මැම්'සෙලා ගේ ටින් එක ගාව ම. මං තව පොඩ්ඩෙන් එයාට දෙන්නෙ වැරදි ටින් එක. ඒකත් නිල් පාටයි. මැම්'සෙලා ගේ ටින් එක වගේමයි."

ඇරබෙලා විස්මයෙන් හුස්ම ඉහළට ඇද්දා ය. නිල් පාට එක වගේ ටින් දෙකක්. හරියට හරි!

"බොහොම ස්තුතියි, මොලී." ඇරබෙලා කීවා ය. "ඔයා හරි ම හොඳයි. ඔයා මේ කරපු උදව්වට කොහොම ස්තුති කරන්න ද මන්දා? මේ ඉස්කෝලේ අය අපේ සල්ලි ඔක්කොම ගිලා ගන්නෙ නැත්නම්, මං ඔයාට පොඩි හරි තෑග්ගක් අරන් දෙනවා, දෙනවාමයි."

ඉන් පසු ඇරබෙලා රෝස්මරී වත් ඇද ගෙන ඉක්මනින් මුළුතැන්ගෙයින් පිටතට පැමිණියා ය.



"ඔයා කොහෙ ද යන්නෙ ඇරබෙලා?" කිසිවක් තේරුම් ගැනීමට නො හැකි ව අන්දුන් කුන්දුන් වී සිටි රෝස්මරී ඇසුවා ය.

"පැට්‍රික් ව හොයා ගන්න. වෙන මොකට ද!" ඇය ජයග්‍රාහී ලෙස කෑ ගැව්වා ය.

පැට්‍රික් ව සොයමින් පාසල පුරා ම ඇවිද්ද ඔවුන්ට වැස්ස මදකට නතර වී තිබුණ හෙයින්, පාසලේ දකුණු පැත්තේ වූ පිත්තිය අසල ටෙනිස් පුහුණු වෙමින් සිටි පැට්‍රික් ව මුණ ගැසුණි.

ඇරබෙලා මදකට නතර වී ඇගේ නියම හැඟීම් යටපත් කර ගත්තා ය. ඉන් පසු ව පැට්‍රික් අසලට ගිය ඇය ඉතා දුක්මුසු ව කතා කරන්නට වූවා ය.

"පැට්‍රික්, මට ඔයාට කියන්න හරි ම අප්‍රසන්න ආරංචියක් තියෙනවා." ඇය හැඟීම්බර ව කීවා ය. පාසලේ මුළුතැන්ගෙයින් අසා දැන ගත් සියල්ල ඇය පැට්‍රික්ට කීවා ය.

"ඉතින් පැට්‍රික්, මං හිතන්නේ ඒ හැංබෙල්ලෝ මැම්'සෙලාට නෙමෙයි." ඇගේ ඇස් බොරු ලැජ්ජාශීලී බවක් පළ කරමින් බිමට නැමුරු වී තිබිණි. "කවුරු හරි බිස්කට් ටික විසි කරලා ඒ වෙනුවට හැංබෙල්ලෝ දාලා. අර කෙනා හිතලා තියෙන්නේ ඒ ටෙනිස් ටින් එක කියලා. ඒ කෙනා ආයෙත් ජරා විහිළුව කරලා තියෙන්නෙ ඔයාට, පැට්‍රික්. කවුරු වත් මැම්'සෙලාට ඒ වගේ විහිළු කරන්න හිතන්නේ වත් නෑ. ඒක ඔයාට වුණත් තේරෙනවා නෙ."

පැට්‍රික් ගේ මුහුණ සුදුමැලි විය. තමා වටා වූ සියල්ල කැරකෙන්නාක් මෙන් ඔහුට දැනෙන්නට විය.

සියල්ල සිදු වීමට තිබූ ආකාරය ඔහු ඉදිරියේ [illegible] මෙන් දිස්වන්නට විය. ඔහු සංග්‍රහ බාර නායකයා. ඉතා ආඩම්බරයෙන් නිල් පාට ටින් එක ඇර, එය [illegible] ගෙයින්ස්වලින් පැමිණි කණ්ඩායමට පිළිගන්වයි... [illegible] කැත මහත හැංබෙල්ලෝ රොත්තක්! එළියෙන් ඇදෙයි

www.sinhalaelibrary.com

සණ්ඩියක වාඩි වී ඉතා උනන්දුවෙන් ඒ මොහොත එන තෙක් බලා සිටියි. ඔහු නින්දට පත් වූ බව දැන ගත් පසු ඇය ඉල කැඩෙන තරම් මහ හඬින් සිනාසෙයි....

'එහෙනම් එලිසබෙත් ඇලන්, ඔයාට මාව ඇත්තට ම පේන්නේ නෑ. මං මාව මෝඩයෙක් කර ගත්තා.' ඔහු කලකිරීමෙන් සිතුවේ ය.

නමුත් ඔහු ගේ සිතේ ඇති වූ කලකිරීම ඇසිල්ලකින් දරුණු ඉතා දරුණු කෝපයකට හැරිණි.

"කාට වත් බෑ මට ඒ වගේ විහිළු කරන්න. කවුරු වත් මට ඔය වගේ විහිළු කරන එකක් නෑ ආයේ." ඔහු පිස්සුවෙන් මෙන් දොඩවන්නට විය. "විශේෂයෙන් එලිසබෙත් ඇලන්. මං අල්ල ගන්නකම් ඉන්නවකෝ."

ඔහු ගැහැනු ළමයි දෙදෙනා ව ඉතා කපුරු ලෙස දෙසට තල්ලු කර වේගයෙන් පාසල ඉදිරිපස දෙසට දුවන්නට වූයේ ය. සිදු වුණු කිසි දෙයක් හරිහැටි නො තේරුණත් සිදුවන්නට යන්නේ කුමක් දැයි ඉවෙන් මෙන් තේරුම් ගත් රෝස්මරි සිත් තැවුලට පත් වූවා ය.

"දැන් මොකා වෙයි ද?" ඇය බියසුදු ලෙස කීවා ය.

"අපි බලමුකෝ..." ඇරබෙලා ජයග්‍රාහී ලෙස කීවා ය.

මෙය නම් හරි ම අවාසනාවකි.

එලිසබෙත් ප්‍රධාන දොරටුව අසල පඩිපෙළියක අහලට වී, හරි සතුලෙක් සොසකු මෙන් සිට ගෙන එළිය දිහා ඔහේ බලා ගෙන, ජෝන් වෙරී ගේ සලාද වගාව ගැන සිතමින් සිටියා ය. මේ වෙන කොට ඒවා ඔක්කොම කාලා අල ඇති එකෙක් එක, හරි ම ආසාවෙන්, ඒ වුණාට මට කරන්න කිසි ම දෙයක් නෑ... අයියෝ...!

පැට්‍රික් ප්‍රධාන දොරටුව අසලට දුව ගෙන එද්දී එලිසබෙත් පඩිපෙළ උඩ හිටිනු දැක, එයින් කෝපයට පත් වී, කුලප්පු වූ මී හරකෙකු මෙන් හිස පහතට හරවා ගෙන ඇය වෙතට වේගයෙන් දිව එන්නට වූයේ ය. එතැනින් යමින් සිටි මිස්ටර් ජෝන්ස් ගේ ඇඟේ නො වැදී ඔහු



බේරුණේ අනුහාවයෙනි. ඔහු එලිසබෙත් දෙසට අතපය විහි කරමින් පිස්සුවෙන් කෑ ගසමින් වේගයෙන් පැන ගෙන ආවේ ය.

"අර හැංබෙල්ලෝයි, ගොළුබෙල්ලෝයි මට දුන්නේ? එහෙම නේද එලිසබෙත් ඇලන්! ඔයාට ඕන වුණේ මාව අනෙක් අය ඉස්සරහ මෝඩයෙක් කරන්න නේද? ඔයාට ඕන වුණේ මං කරදරේ වැටිලා ඉන්නවා බලන්න නෙ. බලලා හොඳට විනෝද වෙන්න නෙ...

ඔහු ගේ විසි වන අතක් එලිසබෙත් ගේ දකුණු අතේ වැලමිටේ වැදුණි. සමබරතාව නැති වී ගොස් ඇය ගෙපැත්තට පැද්දුණ අතර පුදුමයෙන් බේරිගත් දිගසුදු සමඟ ඇය පඩිපෙළ දිගේ පහළට බෝලයක් මෙන් පෙරළී වී ගෙන පෙරළී වී ගෙන ගොස් පහළ වූ මඩ වළේ ඕනෑ එබෙන ලෙස ඒ මත වැටුණා ය. එලිසබෙත් නැගිටීමට වාරු නැති ව අමාරුවෙන් හුස්ම ගනිමින් බිම දිගා වී මඩ ගොඩේ ම සිටියා ය. 'මොකද මේ පැට්‍රික්ට වෙලා තියෙන්නේ?' මඩේ සිටින ගමන් ම ඇය කල්පනා කළා ය. නො සිතූ ලෙස හිටි හැටියේ සිදු වූ සියල්ල ඇයට මහත් කම්පනයක් විය.

මිස් රේන්ජර් වහා එතැනට දුව ගෙන ආවා ය. ඇය සහ මිස්ටර් ජෝන්ස්, ගැහැනු ළමයාට නැගිටීමට උදව් කළහ. එලිසබෙත් ගේ සිරුර හිසේ සිට පාදාන්තය දක්වා ම මඩෙන් වැසී ඇය දුඹුරු පාට වී තිබිණි. ඇය බියට පත් වී සිටි අතර ඇගේ කම්මුල් දිගේ මඩ සොදින් සෝදා හරිමින් කඳුළු බේරෙන්නට විය.

මිස් රේන්ජර් මෘදු ව ඇගේ වෙවුලන අතින් අල්ලා ගත්තා ය. පැට්‍රික් පඩිපෙළ උඩට වී තුෂ්ණිම්භූත ව සිදු වන දෙය දෙස බලා සිටින්නට වූයේ ය.

"මං එලිසබෙත් ව එක්කන් ගිහින් එයාට උණුසුම් නෑමකුයි, අලුත් ඇඳුමුයි දෙන්න කියලා මේට්‍රන්ට කියන්නම්." මිස් රේන්ජර් කීවා ය. "අයියෝ, අසරණ එලිසබෙත්."

www.sinhalaelibrary.com

"මං මේ හාදයත් එක්ක ගනුදෙනුවේ ඉතුරු කටිය බේරගන්නම්," මිස්ටර් ජෝන්ස් තියුණු බැල්මක් පැට්‍රික් වෙත හෙළමින් කීවේ ය. "පැට්‍රික් හොලන්ඩ්, ඔය ඉන්න තැන ම ඉන්නවා. මට ඔයත් එක්ක බේර ගන්න ගනුදෙනුවක් තියෙනවා."

කම්පනයටත් කලකිරීමටත් පත් ව සිටින එලිසබෙත් ව ඇගේ පන්තිභාර ගුරුතුමිය විසින් පාසල තුළට එක් කර ගෙන ගියා ය. මිස්ටර් ජෝන්ස් පැට්‍රික්ට ඉතා තදින් කතා කරන්නට වූයේ ය.

"වයිට්ලීෆ් ඉස්කෝලේ මේ වගේ හැසිරීම් අනුමත කරන්නෙ නෑ."

"මං එයා ව තල්ලු කළේ නෑ සර්. ඒක අහම්බෙන් වුණේ."

"ඔව්, මොකද ඔයා ගේ තරහ ඔයාට ම පාලනය කර ගන්න බැරුව නෙ තිබුණේ." මිස්ටර් ජෝන්ස් තදින් කතා කළේ ය. "ඔයා හැසිරුණේ හරියට කුලප්පු වෙච්ච මී හරකෙක් වගේනේ."

"මට හොඳ සාධාරණ හේතු තිබුණා සර්, ඉවසීම නැති වෙන්න," පැට්‍රික් විරුද්ධ ව කීවේ ය. "මට දැන ගන්න හම්බ වුණා එලිසබෙත් මට ගොඩක් දුෂ්ට විහිළුවක් කරන්න හදලා තිබුණා කියලා. එයාට ඕන මාව හැමෝම ඉස්සරහා ලැජ්ජා කරන්න."

මිස්ටර් ජෝන්ස් පැට්‍රික් ගේ කතාව නැවැත්තුවේ ය.

"ඔයාට තව පැයකින් ඉස්කෝලේ ප්‍රධාන ශිෂ්‍ය නායකයාටයි, නායිකාවටයි කතා කරන්න පුළුවන්," ඔහු කීවේ ය. "එතකොට ඔයා ඔයා ගේ පැත්තෙන් කතාව කියන්න. ඒගොල්ලෝ සාධාරණ වෙයි. ඒ වුණත් ඔයාට දඬුවමක් හම්බ වුණේ නැත්නම් මං පුදුම වෙනවා, පැට්‍රික්. තරහ ගිය කාරණේ කොයි තරම් බරපතල වුණත් ඔයාට ඒ විදිහට හැසිරෙන්න අයිතියක් නෑ. ඔයාට කතා කරනකම් ගිහින් ඔයා ගේ කොමන් රූම් එකේ වාඩි වෙලා ඉන්න.



ඉන්න ගමන් හොඳට හිතන්න ඔයා කරපු දේ ගැන" කියමින් මිස්ටර් ජෝන්ස් යන්නට ගියේ ය.

ඊළඟ පැය තුළ ම, පැට්‍රික් විවේකාගාරය තුළ උඩට පහළට ඇවිද්දේ ය. ක්‍රමයෙන් ඔහු ගේ කෝපය අඩු වී ගොස් ඔහු සන්සුන් වන්නට වූයේ ය. පඩිපෙළේ වූ සිද්ධිය පළමු පන්තියේ ළමයින් අතර ලැව්ගින්නක් මෙන් පැතිර යන්නට වූ අතර සියල්ලන් ම ඒ ගැන කතා කරන්නට විය. මෙට්‍රන්වරිය ගේ බල කිරීමට, උණුසුම් නෑමකින් පසු එලිසබෙත් ව ඇඳට යවා තිබිණි. වාසනාවට ඇයට තිබී ම තුවාලයක්, අඩු ම තරමින් තැළීමක් හෝ සිදු වී නො තිබිණි. නමුත් ඇය විවේක ගත යුතු බව මෙට්‍රන්වරිය ගේ අවසාන තීරණය විය. එක වගේ නිල් පාට බිස්කට් ටින් දෙක ගැනත්, එලිසබෙත් බැම්'සෙලා ගේ ටින් එක යැයි වරද්දා සිතූ හැටිත්, දැන ගත් පසු පැට්‍රික්ට ඒ තරම් තරහ යන්නට ඇත්තේ ඇයි දැයි තේරුම් ගැනීමට පන්තියේ ළමයින්ට එතරම් අපහසු නො වී ය.

මට විශ්වාසයි විලියම්යි රීටයි තේරුම් ගනීවි, පැට්‍රික් සිතුවේ ය. 'මං කැමති නෑ කතා මවලා කියන්න. ඒ වුණාට මට ඔක්කොම පැහැදිලි කරන්න වෙනවා. ඒගොල්ලන්ට තේරෙයි එලිසබෙත් මට කරන කරදර. එයාට මාව මෙච්චරට ම පේන්න බැරි එයා ගේ තියෙන දුෂ්ටකමට.

විවේකාගාරයෙන් පිට වී පාඩම් කාමරය දෙසට ඇවිද යද්දී, ඔහුට පිටුපසින් වේගයෙන් දුව ගෙන එන අඩි ශබ්දයක් ඇසිණි.

"පැට්‍රික්!" හැන්ලීන් ඔහුට ඉස්සර වෙමින් හති දමමින් කීවා ය. "ඉන්න! මං දැනුයි දැන ගත්තේ ඔක්කොම කතාවටි. ඔයා විලියම්යි, රීටටයි කියන්න හිතන් ඉන්න එවයි, ඒ වුණාට ඔයාට බෑ එහෙම කරන්න, ඒවා විකාර කතා. [illegible] බිස්කට් ටෙනිස් මැච් එකට හදපුවා කියලා එලිසබෙත් හිතන්න කොහොමවත් වත් විදිහක් නෑ. එයාට එහෙම වැරදීමක් වෙන්න බෑ. මොකද එයා දැන ගෙන හිටියා ඔයා චොක්ලට් ක්‍රිස්පි කේක් හැදුවා කියලා."

www.sinhalaelibrary.com

"කොහොම ද එයා දැන ගත්තේ?" පැට්‍රික් රවමින් කැත්ලීන් ගෙන් ඇසුවේ ය. "ඒක මං රහසක් විදිහට තෙ තියන් ඉන්නේ. අනෙක එයයි මායි දැන් කතා කරන්නේ වත් නැහේ."

"මං දන්නවා ඒක! ඒක තමයි කෝකි තෝනං ඔයාට දෙන්න කියලා කුකින් වෙස්ලට් ගැන පණිවිඩේ එලිසබෙත්ට දුන්නා ම, එයා මට කිවුවේ ඒක ගිහින් ඔයාට කියන්න කියලා. ඒ නිසා එලිසබෙත් කොහොමට වත් වැරදි විත් එකත් හංබෙල්ලෝ දන්න විදිහක් නෑ. සමහර විට ඔක වෙන පන්තියක ළමයෙක් කරන්න ඇති. නැත්නම් ඒක ඇත්තට ම නැම්'පෙලාට කරපු විහිළුවක් වෙන්නැති."

පැට්‍රික් ගේ මුව විවර වූ නමුත් මොහොතක් යන තුරු ඔහු නිහඬ ව සිටියේ ය.

"ස්තුතියි, කැත්ලීන්." පැට්‍රික් කෙඳිරී ය. "මෙක කිවුවට ස්තුතියි."

ඔහු භ්‍රාන්ත ව අවුල් වූ සිහින් ඇවිද ගොස් තිත්දෙත් මෙන් ප්‍රධාන ශිෂ්‍ය නායකයා හා නායිකාව සිටින කාමරයට ඇතුළු වූයේ ය. ඔහු ගේ නො මනා හැසිරීමට හේතු දැක්වීමට කී විට, ඔහු කළේ ලැජ්ජාවෙන් කෙඳිරීම පමණකි.

"ඒක වැරදි වැටහීමක් විතරයි. මං හිතුවේ එලිසබෙත් මට දුෂ්ට විහිළුවක් කරලා කියලා... ඒ වුණාට එයා ඒක කරලා නෑ කියලා මට මේ දැන් දැන ගන්න ලැබුණා. මං තරහ ගන්න එක වැරදියි."

"ඉස්සරහට ඔයා ඔය තරහ පාලනය කර ගන්න ඉගෙන ගන්න ඕන, පැට්‍රික්. හැම වෙලේ ම තමන්ට ඕන විදිහට හැසිරෙන්න තරහ ගන්න ඔයාට අයිතියක් නෑ. ප්‍රශ්න විසඳන්න තියෙන අමාරු විදිහ ඔයා ඉගෙන ගන්න ඕන. ඒක තමයි ඉවසීම. ඔයා ඒක ඉක්මනින් ම ඉගෙන ගනීවි කියලා අපි හිතනවා, පැට්‍රික්."

පසු දා උදේ ආහාරයේ දී, එලිසබෙත් ගේ මේසයේ වූ කිසි ම කෙනෙක් වැඩිපුර කතා කළේ නැත. ඔවුන්



සියල්ලන්ට ම කනගාටුදායක ආරංචිය ලැබී තිබුණි. පැට්‍රික් ව පාසලේ ටෙනිස් කණ්ඩායමෙන් ඉවත් කර තිබුණි. හිස්ලින් ග්‍රීන් සමග යෙදී තිබෙන තරගයේ දී කණ්ඩායම වෙනුවෙන් ක්‍රීඩා කිරීම ඔහුට තහනම් ය. මුළු ග්‍රීෂ්ම කාලය තුළ ම ඇති වැදගත් ම තරගය එයයි. ඔහු ඉවත් කිරීම නිසා ඇති වූ අඩු ව පිරවීමට නැවතත් රොජර් බ්‍රවුන් ව කණ්ඩායමට කැඳවා තිබුණි.

පැට්‍රික් මේසයේ ඈත ම කෙළවරට වී කිසිවෙකුත් සමග කතා නො කර මුනිමා ගෙන කෑම ගන්නට විය. කෑම ගන්නා අතරතුර ඔහු ඇරබෙලා දෙස නැගීම විරහිත ව බලා සිටියේ ය.

ඇරබෙලා වරක් වත් පැට්‍රික් දෙස බැලුවේ නැත. ඇය ආහාර බඳුන දෙසට ඇස් රඳවා ගෙන සිටි අතර, පරාජිත හැඟීමකින් ඇගේ කම්මුල් රෝස පැහැ ගැන්වී තිබිණි.

එලිසබෙත් පවා කිසි ම සද්දයක් බද්දයක් නැති ව සිටියා ය. පැට්‍රික් අද උදෑසන ඇය ගෙන් ඉතා විනීත ලෙස සමාව ගත්තේ ය. නමුත් පාසල් කණ්ඩායමේ ඔහු ගේ තැන දැන් නැති වී හමාර ය. ඇය කියන කිසි දෙයකින් ඔහුට එය නැවත ලබා ගත නො හැකි ය. පුංචි දැරිය පැට්‍රික් ගේ හැකිළුණු මුහුණ දෙස බලා සිටින්නට වූවා ය. නමුත් ඇයට ඔහු වෙනුවෙන් කළ හැකි කිසි ම දෙයක් නො වී ය. අසරණ පැට්‍රික්....!

ඊළඟ සවස ජෝන් ටෙරීට එළියට යාමට අවසර ලැබිණි. ඒ සිකුරාදාවත් වඩා දවසකට කලින් ය. දොස්තර මහතා ඔහු ව සෝදිසි කර බලා ඔහු හොඳ සනීපෙන් සිටින බව දැන්වූ පසු ඔහුට එළියට යාමට අවසර ලැබුණි. වාසනාවට වයිට්ලීෆ් පාසලේ අන් කවරකුට වත් රෝගය බෝ වූයේ නැත.

ඒ සවස තේ පානයට මඳකට කලින් ය. ජෝන් සිටියේ ප්‍රීතියෙනි. දින ගණනාවක් හිරකාරයකු මෙන් කාමරයේ හිර වී සිටි ජෝන් පිටතට ආ විගස ගොවිපළ දෙසට දුවන්නට

වූයේ ය. කලින් සූදානම් කරන ලද යමක් බලන්නාට මෙන් ඔහු ආම්පන්න දමන මඩුව දෙසට ඉගිල්ලුණේ ය. ගිත අල්මාරිය ළඟ දණ ගසා ගත් ඔහු ඉතා ප්‍රීතියෙන් එතුළට එබී බැලුවේ ය.

ජෝන් බලාපොරොත්තු වූයේ ඒ තුළ ඉතා පරිස්සමින් පත්තර කොළවල ඔතන ලද අගනා සලාද පැළ නිදර්ශක තිබිපයකි,

නමුත් එය සම්පූර්ණයෙන් ම හිස්!

කිසිවක් හිතා ගැනීමට නො හැකි වූ ඔහු ඉක්මනින් නැගිට වගාව දෙසට දිවුවේ ය. වගාව හොඳින් පේන මානයට ආ ජෝන් තුෂ්ණිම්භූත ව එදෙස බලා සිටියේ ය. ඔහු ගේ මුහුණේ යන්තමින් හෝ ඉතිරි වී තිබූ ප්‍රාණවත් බව එවෙලේ අතුරුදන් විය. ගස් සියල්ල ම වතුර ජලාශයක ගිලී යන්නමින් උඩට ඔසවා වී තිබිණි. ඒ අතරින් බොහෝ ගස් හංබෙල්ලන් විසින් කා දමා තිබිණි.

'එලිසබෙත්ට මං ලියලා යවලත් එයා ඇවිත් පැළ උදුරලා නෑ.' ජෝන් වෙව්ලා නද සුසුමක් දමන්නාට විය. 'එයාට සමහර විට අමතක වෙන්නැති හරි පුදුමයි...! එලිසබෙත් මට උදවු කරන්න හරි ආසාවෙන් නෙ හිටියේ.'

ඔහු කනස්සල්ලෙන්, නැවතත් ඉක්මන් කර මඩුව තුළට ගොස් මෙසන් හැන්දක් සහ පත්තර කොළ තිබිපයක් සොයා ගත්තේ ය.

අන් පසු ඔහු බිම් තීරු අතරින් එහාට මෙහාට ඇවිදිමින් සලාද පැළ මාරුවෙන් මාරුවට පරීක්ෂා කළේ ය. මඩ තුළ එබෙන බූට් සපත්තු චිරි, චිරි හඬ නැඟුවේ ඔහු ගැන සතුටු වන බව පැවසීමට මෙන් ය. ඔහු ගේ අනර්ඝ වගාවෙන්, හංබෙල්ලන් ගෙන් බේරී තිබුණේ පැළ දෙකක් පමණි. එකක් වටකුරු වර්ගයේ වූ අතර අනෙක අණ්ඩාකාර වර්ගයේ විය. කවිසර ව නමුත් ඒවාට කිසි ම හානියක් නො වන පරිදි ඉතා පරිස්සමින් ඇඟිලි තුඩුවලින් ඔහු ඒවා සෙමෙන් ගලවා ගත්තේ, හොඳින් වැටුණු පත්‍රවලට කිසි ම



හානියක් නො වන ලෙස ය. ඔහු ඒවා පරිස්සමින් පත්තර කඩදාසිවල ඔතා මඩුව තුළ වූ ගිත අල්මාරිය [illegible] ආරක්ෂාකාරී ව තැබුවේ ය.

'ඒවා නෙමෙයි හොඳ ම ඒවා.' ඔහු සිතුවේ ය. [illegible] තෝරලා තරඟෙට යවන්න හිටියේ ඒ වගේ දෙකක් නම් නෙමෙයි. තරඟෙට ඒවා හොඳ වෙයි කියලා මං හිතන්නෑ. අපට මං පැළ දෙක පල්ලියේ ශාලාවට ගෙනියන්න ඕනී. අපට තෙ ඒවා ගෙනත් බාර දෙන්න කියලා තිබුණේ.

ජෝන් නවස ගේ පාගයට පැමිණියේ ප්‍රමාද ව ය. ඔහු ශාලාවට ඇතුළුවත් ම උස් අත්පොළසන් නාදයක් පැතිර යන්නට විය. ජෝන් නිරෝගී ව, සවිමත් ව සිටිනු දැකීම ළමයින් සියල්ලන්ට ම සතුටට කාරණයක් විය. ජෝන් සමඟ දෙස ප්‍රශ්නකාරී බැල්මක් හෙළනු එලිසබෙත් දුටුවා ය. ඇයට නම වැරැද්දක් කළා වැනි හැඟීමක් ඇති වන්නට විය.

"ඒවා ඔක්කොම විනාශ වෙලා ද?" ගේ වෙලාවෙන් පසු ව ඇය ජෝන් ගෙන් ඇසුවා ය.

"මට ගොඩක් දුරට." කෙටි හිස සොලවමක් සමඟ ඔහු කී අතර සිත පෑරී ඇති බවක් ඔහු කෙරෙන් හඬින් ම දිස්විය.

නමුත් එලිසබෙත් ඔහුට විශේෂ රැස්වීමක්. මැරිච්ච හංබෙල්ලන් ගැනත්, ඇයට ගොවිපළට යාමට නොහැකි වීම ගැනත් සියල්ල පැහැදිලි කරද්දී ඔහු ගේ මුහුණ පුදුමැලි විය.

"අසරණ එලිසබෙත්! එහෙනම්.... විලියම්ස් [illegible] කියනවා ඇහෙන්න මට කරන්න වෙන කිසි ම දෙයක් නෑ."

"ඔයා එහෙම කරන්න එපා, ජෝන්!" ඇය [illegible] ය. "ඔයා දන්නවා ඒක රහසක්! ඔයාට ඔන වුණේ ඒක [illegible] පුදුම කරන්න කියා ගන්නනෙ. ටිකක් ඉඳලා බලන්න [illegible] කප් එක දිනයි ද කියලා."

"මං හිතන්නෑ." ඔහු හිල්ලුවේ ය. නමුත් ඔහු ඇය දෙස සානුකම්පාපූර්වක බැල්මක් හෙළුවේ ය. "ස්තූතියි. එලිසබෙත් මං ඔයාට වෙච්ච කරදරවලට විසඳුමක් හොයලා දෙන්න උපරිමෙන් ම උත්සාහ කරන්නම්."

www.sinhalaelibrary.com

එලිසබෙත් හිස සැලුවා ය. ඇයට ජෝන් ටෙරී මත සම්පූර්ණ විශ්වාසය තැබිය හැකි ය.

* * * *

එලිසබෙත්ට සිදු වූ කරදර සියල්ල අවසන් වූ අතර එය සිදු වූයේ ද විය හැකි හොඳ ම ආකාරයට ය.

ජෝන් ගේ සලාද පැළ දෙක රිදී කුසලානය දිනා ගැනීමට සමත් විය.

වාරය මැද නිවාඩුවට පෙර තිබුණ අවසාන රැස්වීමේ දී ඔහු ව විලියම් හා රීටා විසින් වේදිකාව මතට කැඳවන ලදී. ජෝන් රිදී කුසලානය මුළු පාසලට ම පෙනෙන ලෙස ඉහළට ඔසවා ගෙන සිටියේ ය. ශාලාවේ රැස් ව සිටි ළමයින් ප්‍රීතියෙන් හා ආඩම්බරයෙන් අත්පුඩි ගසමින් ප්‍රීති ඝෝෂා කරමින් කකුල් බිම හැප්පූහ. මේ ජයග්‍රහණය වයිට්ලීෆ් පාසලට ලොකු ගෞරවයකි. ප්‍රාදේශීය පුවත්පත්වල මේ සම්බන්ධව පින්තූර හා ලිපි පළ වනු ඇත. වයිට්ලීෆ් පාසලේ කෙතරම් හොඳ දේවල් ගැන හැමෝටම දැන ගන්නට ලැබේවි.

"අපට තවත් වැදගත් දෙයක් තියෙනවා කියන්න." ළමයින් ගේ ඝෝෂාව නැති වී ගිය පසු විලියම් ඉතා සන්තුෂ්ට ව කීවේ ය. "මේ රැස්වීම වෙනුවෙන් මට කියන්න වැදගත් දෙයක් තියෙනවා. ඒක තමයි, අපි එලිසබෙත් ඇලන් ව වැරදි විදිහට තේරුම් අරන් තියෙනවා කියන එක. කලින් රැස්වීමේ දී සොෆියා කියපු විදිහට, එයා දැකලා තියෙනවා එලිසබෙත් මැරිච්ච හංබෙල්ලෙක් එක්ක ඉන්නවා. උන් ඇත්තට ම ජෝන් ටෙරී ගේ වගාවේ උගුල්වලට අහුවෙලා ජීවයින් විසි කරපු සත්තු. මුළු ඉස්කෝලෙන් ම ජෝන් ගේ රහස දැන ගෙන හිටපු එක ම කෙනා එලිසබෙත්. ජෝන්ට වගාව බලා ගන්න එන්න බැරි නිසා එයා හරි ම සතුටුවෙන් ඉඳලා තියෙන්නේ. රහස දැන ගෙන හිටියත්



තරග නීතිවලට අනුව ජෝන්ට එලිසබෙත් ගෙන් උදවු ගන්න බැරි බව එයා දැන ගෙන හිටියා. ඒ නිසා එලිසබෙත් උන් ව රිකිල්ලකින් එහා මෙහා කරලා තියෙන්නේ උන් ඇත්තට ම මැරිලා ද කියලා දැන ගන්න! කරුණාකරලා, නැගිටින්න එලිසබෙත්!"

එලිසබෙත් නැගිට්ටා ය. රීටා පාසල ආරම්භයේ සිට ම රැස්වීම්වල තොරතුරු සටහන් කර ඇති විශාල වාර්තා පොත ඇරියා ය. ඇගේ අතේ පෑනක් විය.

"එලිසබෙත් කළා කියන වැරදිත්, ඊටත් දුන්න දඬුවමුත් මකලා දාන්න රැස්වීම තීරණය කරලා තියෙනවා. අපි හදිසියේ ගත්ත තීරණය ගැන අපිට සමාවෙන්න, එලිසබෙත්."

රීටා ලොකු පොතේ ලියද්දී, එලිසබෙත්ට ශාලාවේ හැම පැත්තෙන් ම අත්පොළසන් නාද ලැබෙන්නට විය.

"ආහ්! එහෙනම් මේක තමයි රහස!" ඇය වාඩි වෙද්දී ජූලියන් කෙඳිරී ය. ඔහු ගේ ඇස් විස්මයෙන් දිලිසෙමින් තිබිණි.

"ජෝන් එයා ගේ හංබෙලි උගුල්වලට කිරි ගන්නවා ද? ඒකට ද ජෝඩුව මිත වුණේ?"

එලිසබෙත් වැරදිකාරියක මෙන් සිනාසුණා ය. "ඒ වුණාට මං ඒක පාවිච්චි කළේ නෑ!" ඇය ඉක්මනින් පැහැදිලි කළා ය. "එහෙම නො කරපු එක ගැන මට දැන් හරි සතුටුයි. එහෙම නම් මං තරග නීති කැඩුවා වෙනවා නෙ."

"අපේ වීර නරක ගෑනු ළමයා නීති කඩනවා ද?" ඔහු සමච්චලයට කීවේ ය.

"අපෝ නෑ, කවදා වත් ම නෑ!" ජූලියන් හා එලිසබෙත් අත්වලින් කටවල් තද කර ගනිමින් සිනාසෙන්නට වූහ.

මොහොතකට පසු දෙදෙනාට ම නැවත බරපතළ පෙනුමක් ආරූඪ විය.

විලියම් හා රීටාට දැනුම් දීමට අවසාන නිවේදනයක් විය.

www.sinhalaelibrary.com

"එක කාරණාවක් නිසා අපිට දැන් ම ම මේ පොත වහන්න බැ. අපි තාමත් දන්නෑ මැම්'සෙලාට මේ විහිළුව කළේ කවුද කියලා. වැරදිකාරයා පිළිගන්නකම්, නැත්නම් මේකෙ ඇත්ත නැත්ත අපි ම හොයා ගන්නකම්, මේ පොත ඇරිලා ම තියේවි. එතකන් මේ වේදිකාව උඩ ඉන්න අපි කාට වත් විවේකයක් නැති වෙයි."

එලිසබෙත්ට හා ජූලියන්ටත් එහෙමමයි.

# 11

## නිවැරදි අවසානය

ජූලියන් හා එලිසබෙත් මහත් වූ වමතාවෙන් පසු වූයේ පැට්‍රික් ගේ ටෙනිස් පිත්ත මිස් බෙස්ට් ගේ වාහනයේ පිටියේ හැංගුවේ කවුද යන්න දැන ගැනීමට ය. එලිසබෙත්ට සිදු වූ කරදරවලින් මුල් ම කරදරය වූ එය, අනෙක් සියලු ම ඒවා විසඳී තිබුණත් තවමත් නො විසඳී ඉතිරි ව ඇත. පැට්‍රික්ට තව දුරටත් කිසිවක් සිතා ගැනීමට නො හැකි ය. තමා ගේ ම මෝඩ හැසිරීම නිසා පාසල් ටෙනිස් කණ්ඩායමේ තැන නැති වීම ගැන ඔහු පසු වූයේ දැඩි කනස්සල්ලෙනි. ඔහු තදින් ම උත්සාහ ගත්තේ ඒ ගැන නො සිතා සිටීමට ය. පන්තියේ ළමයින් නම් තාමත් ඒ ගැන කතාබහ කරයි.

ජූලියන් දැන් රොජර් මුවුන් ට ඉතා තදින් ම සැක කරයි.

එලිසබෙත් පවා දැන් ඒ අදහසට නැවී ඇත.

"මට පිළිගන්න වෙනවා ඇරබෙලා ගොඩාක් දක්ෂ විදිහට මැම්'සෙලා ගේ ටින් එකයි, ටෙනිස් ටින් එකයි එක වගේ නිසා ඒ දෙක එකකට එකක් මාරු වෙන්න ඇති කියලා හිතුවා කියලා! මම නම් හිතුවේ නෑ එයාට එච්චර කල්පනා ශක්තියක් තියෙනවා කියලා. එයා පෙන්නුවා, එයා අපට වඩා දක්ෂ රහස් පරීක්ෂකයෙක් කියලා."

www.sinhalaelibrary.com

"ඔව්." ජූලියන් එකඟ විය. තමුන් දෙදෙනා ගෙන් එක් අයෙක් වත් දැන නො සිටි කාරණය නම් ඇයට ඒ අදහස ලබා දුන්නේ මුළුතැන්ගෙයි වැඩ කරන මොලී බව ය. "වැරදි එක්කෙනෙක් ව අල්ල ගන්නත් අදහස නම් නියමයි. ඔයා හරි එලිසබෙත්, මට දැන ඒ අදහස මට ආපු නැති එකයි. ඒ අදහස නැති වෙච්ච රකට් එකයි මේ සිද්ධියයි අතර ලොකු සම්බන්ධයක් ඇති කරනවා."

"විහිළු දෙක ම කරලා තියෙන්නෙ පැට්‍රික් ව ටීම් එකෙන් එළියට විසි කරන්න හිතා ගෙන." එලිසබෙත් කිය පැවසුවා ය. "පළමු වැනි එක එයා රකට් එක නැතුව හොඳට සෙල්ලම් නො කරන්න, දෙවන එක සෙන්ට් පොයින්ට්ස්වලට කරන විහිළු කළා කියලා එයා ව ලැජ්ජා කරන්න."

"ඒ කියන්නේ මේවා කරන්න හේතු තියෙන එක ම කෙනා රොජර්." ජූලියන් එකතු කළේ ය.

"කොහොම හරි අන්තිමට එයාට ටීම් එකේ කලින් තිබ්බච්ච තැන හම්බ වුණානේ." එලිසබෙත් කීවා ය.

"අයියෝ ජූලියන්." ඇය ආවේගයෙන් කීවා ය. "මට හිතෙන්නෙ මේක පැට්‍රික්ට මහ ලැජ්ජාව. මගේ හිතේ එයා ගැන දුක් කරගන් නෑ. එයා හරි ම මෝඩයෙක්. ඒක නෙ එයා ඇරමෙලා වගේ කෙනෙක් කියන ඒවා අහලා ඇවිස්සුණේ. ඇරමෙලා වැඩිකට නැතුව කරදර ඇති කරනවා. ඒ වුණාට පැට්‍රික්ට කොහොම හරි ආයෙත් ටීම් එකේ තැන හම්බ වෙනවා නම් මං කැමතියි. එයා හමයි දක්ෂයා. කොහොම වුණත් මං හිතන්නෙ දැන් අපි හිස්ලින් ග්‍රීන් එක්ක තියෙන මැච් එක පරදියි!"

"ඔයා හරි ම හොඳයි එලිසබෙත්." ඔහු කෙඳිරී ය. ඉන් පසු ඔහු දෙවුර සොලවවිය. "ඒ වුණාට අපි කොහොම ද ඔප්පු කරන්නෙ රොජර් එහෙම දෙයක් කළා කියලා! අනෙක අපි කොහොම ද විස්වාසෙන් ම එහෙම කියන්නෙ? එයා කළා නම් මෙලානට වැරැද්ද පිළිගන්න කියන්න ඕනෙනේ, එයා හරි ම වැදගත් පිරිමි ළමයෙක් නෙ."



ඔවුන් දෙදෙනා ම මූණ ඇද කර ගනිමින් කල්පනා කරන්නට වූහ. දෙදෙනා ම විටින් විට ඒ ගැනට [illegible] තිබුණි.

එලිසබෙත් හා ජූලියන් තරප්පු පෙළ කෙළවරේ ම තිබෙන ජනේලය තුළින් පිටත බලා සිටින්නට වූහ. දිවා ආහාරයට නියමිත කාලය අවසන් වී තිබුණ අතර හිස්ලින් ග්‍රීන්වලට එරෙහි ටෙනිස් තරගය හරියට ම තව පැයකින් ආරම්භ වීමට නියමිත ව ඇත. හියවර් ග්‍රීන් සහ [illegible] තරග පැවැත්වූයේ පාසලින් පිටත ය. එහි දී ඔවුන් ඉතා හොඳින් විනෝද වූ බව කවුළුවෙන් පිටත බලා සිටිද්දී ඇයට මතක් විය. තමුන් මෙවර අනෙක් පාසල් වයිටලීෆ්වලට පැමිණිය යුතු ය. හිස්ලින් ග්‍රීන් පාසල් කණ්ඩායම සහ ඔවුන් ගේ උදවුකරුවන් තව පැය කාලකින් වයිටලීෆ්වලට එන්ට නියමිත ය.

වයිටලීෆ් පාසලේ දෙමාපියන් කිහිප දෙනෙක් මේ වන විටත් පැමිණ සිටියහ. පාසලේ සමහර ළමයි වාරය මැද කෙටි නිවාඩුව සඳහා සිය නිවෙස්වලට යති. ඒ නිසා මුළු දවස පුරා ම වූයේ කලබලකාරී ගතියකි. ළමයින් එහාට මෙහාට දුවමින් ගමන් මලු සූදානම් කරමින් සිටියි. [illegible] දෙමාපියන් බලාපොරොත්තුවෙන් සිටින්නේ තරගය තරඟ අවසානයේ ළමයින් ව රැගෙන යාමට ය. මෙවර කෙටි නිවාඩුවට එලිසබෙත් වයිටලීෆ්වල ය. කැමැත්තෙන් එසේ [illegible] ඇය වයිටලීෆ්වල ය. ඇගේ හොඳ ම මිතුරිය ජොවාන් ද ඇය සමඟ නතර වෙයි. එය විනෝදජනක වනු [illegible] අනුමාන ය!

කල් ඇති ව පැමිණෙන වාහනවල ඇති විවිධ වර්ගයන් නිෂ්පාදිත නම් දෙස ජූලියන් අවධානය යොමු කර ගෙන සිටියි. මෙයින් හොඳට ම හෙම්බත් වූ එලිසබෙත් [illegible] නො සන්සුන් ව සිටියේ පැට්‍රික් සහ අභිරහස ගැනත්, රොජර් මුවුන් වැරදිකාරයා ද නැද්ද යන්නත් ගැන සිතමින් ය. ඇය දැනට දන්නා එක ම කාරණය නම් ජූලියන්, රොජර් ගැන ඉතා සෙවිල්ලෙන් සිටින බව පමණි.

"නෑ, හැක හිතෙන කිසි ම දෙයක් නෑ." ඔහු එලිසබෙත්ට කීවේ ය. "රොජර් ඉන්නේ හැම දෙයක් ම අනෙක් පැත්තට හැරිලා වගේ. හැම කිස්සෙක ම බලද්දී එයා ඉන්නේ කලින් හැමෝ හිටියාටත් වඩා සංතොසෙන්. ඒකෙන් අපි හිතපු දේවල් වෙනස් වෙනවා, එලිසබෙත්!"

ඇය හිස සැලී ය. ඔවුන් දෙදෙනා ම එය දැක සිටිහ. පාසැල් දෙවන පෙළ ටෙනිස් කණ්ඩායමේ නමට නැති වූ ස්ථානය නැවත ලැබුණු කෙනෙකු විදිහට රොජර් සතුටු වන බවක් නම් පෙනෙන්නට නො වී ය. එය සිදු වූ දිනයේ, ඔහු කනස්සල්ලෙන් මුණ හකුලා ගෙන පාසල පුරා ඇවිදිනු දක්නට ලැබිණි. ඒ හැසිරීම එන්න එන්න ම වැඩි විය.

"දවල් කෑම වෙලාවේ දී ඔයා දැක්ක ද එයා ව." ජූලියන් කියන්නට විය. "මං හිතුවේ පැට්‍රික් ඉන්නෙ හරි ම දුකෙන් කියලා. හැබැයි ඒ මං රොජර් ගේ මූණ දකිනකම් විතරයි. මට නම් මොකුත් තේරෙන්නෙ නෑ."

"දැන් වුණෙත් බලන්න එයා ව!" ඔහු ව පෙන්වමින් එලිසබෙත් විස්මයෙන් කීවා ය. "බලන්න, ජූලියන් අර ඉන්නේ එයා මට මෙතෙන්ට පේනවා. අර ටෙනිස් පිට්ටනියට විතක් එනවයින්."

ජෝන්ස් පිළුවා පිට්ටනියට පැමිණියා පමණි, ඔහු සුදු පැහැති ටෙනිස් ඇඳුම් හැඳ සිටියේ ය. ටෙනිස් පිත්ත අතේ විය. ඔහු වහාම කිරීම ආරම්භ කරමින් හිස් ටෙනිස් පිට්ටනිය හරහා ඉහළට පහළට ඇවිදින්නට වූයේ ය. ඔහු තරගය පටන් ගන්නා තෙක් බලා සිටියි. ඔහු තරගයට සූදානම් වී හමාර ය.

"තව පැයක් ම තියෙනවා මැච් එක පටන් ගන්න!" ජූලියන් පුදුමයෙන් කීවේ ය. "හරි ම අමුතුයි එයා ගේ හැසිරීම."

"ජූලියන් ඔයා හිතින් එයාට විතක් කතා කරොත් හරිද ද?" එලිසබෙත් හදිසියේ ම කීවා ය. "මං මෙතෙන්ට වෙලා ඉන්නම්."



"මොකක්, හිතින් ඔයා තමයි මේවා කළේ කියලා කියන්න ද?" ජූලියන් ඇසී ය.

සිනිවකට නො හැඟෙන ගතිය මොහොතකට ඔහු කෙරෙන් ඉවත් විය. කොහොම ද ඒක කරන්නේ? අනුමාන ආදු පළමු වැනි පන්තියේ ළමයෙක්, ඉස්කෝලේ ඉන්න වැඩිමල් ම ළමයෙක්ට හිතින් කියන්න ද "ඔයා තමයි මේ ඔක්කොම කළේ කියලා." අනෙක කිසි ම සාක්කියක් එක් නැතුව.

"මෝඩ වෙන්න එපා, එලිසබෙත්. එයා සමහර විට විකක් කලබල වෙලා වෙන්නැති." ජූලියන් කීවේ ය.

"මම වෙන්නැති. ඒ කියන්නේ එයා නැමති වෙයි තවුරුන් හරි එක්ක විතක් කතා කරන්න!" එලිසබෙත් කීවේ උනන්දුවෙනි. "ඇත්තට ම මං එයා වැරදිකාරයා කියලා කිවුවෙ නෑ! ඒ වුණාට කවුද දන්නේ, එයා මොනවා හරි කියයි නෙ. අපිට මොනවා හරි දැන ගන්න ලැබෙයි නෙ. මං කෝකටත් පේන්නැති වෙන්න ඉන්නම්. නැත්නම් එයා පරිස්සම් වෙයි. එයා දන්නවා මං හංබෙල්ලෙයි ඒවයි මෙවයි හිත්දා කරදරේ වැටුණා කියලා. ඒ වුණාට ඔයාට පුළුවන් ජූලියන්. අනෙක ඔයා දන්නවා නෙ ලොකු එක්කෙනෙක් වගේ කතා කරන්න!"

ජූලියන් සිනාසුණේ ය. ඔහුට අලුත් උනන්දුවක් ඇති වෙමින් තිබිණි.

"උත්සාහ කරන්න වටිනවා." ජූලියන් කීවේ ය.

ඔහු නො සැලකිලිමත් ලෙස පිට්ටනිය දෙසට ඇවිද්දේ ය. එලිසබෙත් ජනේලය තුළින් බලා සිටියා ය.

"හලෝ රොජර්, පලතුරු ගම් එකක් ඕන ද?"

ලොකු පිරිමි ළමයා වේගය අඩු කර ලී බංකුව අසල නතර වී පියවි සිහියට ඒමට මෙන් වෙගයෙන් ඇහිපිය ගැසුවේ ය. ඔහු ගේ සිත වෙන කොහේ වත් ය. කෙනෙක් රසකැවිලි වගයක් දෙන්නට වුවමනාවෙන්, එය ගෙන යන්නේ වනයි.

www.sinhalaelibrary.com

"ඔහ්, හෙලෝ, ජූලියන්." පියවි සිහියට පැමිණි විගස ඔහු කීවේ ය.

"මෙන්න, ගන්න පලතුරු ගම් එකක්. අද තියෙන ලොකු මැච් එකට හෝකිය ටිකක් ගන්නත් එක්ක."

"ස්තූතියි." රොජර් පලතුරු ගම් එකක් ගෙන මුව තුළ ඔබා ගත්තේ ය.

"අයියෝ, රොජර් ඔයා කලබල වෙලා වගේ පේන්නෙ!"

"ඇත්ත ද?" ඔහු පලතුරු ගම් එක හයියෙන් හැපුවේ ය. "ඇත්තට ම කියනවා නම් ජූලියන් මං ටිකක් කලබල වෙලා තමයි ඉන්නේ."

ජූලියන් අසල වූ ලී බංකුවේ දිග ඇදුණේ ය. ඉබේ ම මෙන් රොජර් ද ඔහු අසලින් වාඩි විය. එසේ නො කිරීම මිත්‍රශීලී නො වන බව ඔහුට හැඟුණි. ජූලියන් හොඳ ළමයෙකි. එමෙන් ම බුද්ධිමත් ය.

"ඔයාට පුළුවන් ඔයා ගේ උපරිමෙම ම කරන්න ඕනෑයි." ඔහු සනසන අයුරින් ජූලියන් කීවේ ය. "එහෙම තමයි මගේ අම්මා මට නිතර ම කියන්නෙ."

"මගේ තාත්තත් එහෙම කියනවා නම් කොච්චර හොඳ ද! තාත්තා කියන්නේ හැම තිස්සෙ ම දිනන්න සෙල්ලම් කරන්න කියලා. ජීවිතේ තියෙන්නේ දිනන්නලු, පරදින්න නෙමෙයිලු!" ඔහු කියා ගෙන යන්නට විය. "තාත්තා දැන ගන්න ඕන! තාත්තා ඉස්සර දිනපු කප් ගොඩක් අපේ ගෙදර තියෙනවා. ඒවායින් පිදී කප් සුද්ද කරන්න සතියක් විතර යනවා."

ජූලියන්, රොජර් ගේ විශාල සෞම්‍ය මුහුණ දෙස හදිසි උනන්දුවකින් බැලුවේ ය.

ඔහු රොජර්ට තවත් පලතුරු ගම් එකක් දුන්නේ ය. මෙවර කළු පාට එකකි. ජූලියන් ගේ ප්‍රියතම ජාතිය. නමුත් එය හොඳ ආයෝජනයක් බව ඔහුට සිතිණි.

"අද තාත්තා එනවා ද ඔයා සෙල්ලම් කරනවා බලන්න?" ජූලියන් සාමාන්‍ය ලෙස ඇසුවේ ය.



"තාත්තා එනවා ද?" රොජර් විස්මයෙන් එය ම කීවේ ය. "තාත්තා මෙහාට ම බිස්නස් ට්‍රිප් එක මග නවත්තලා එනවා. මම වයිටලින්ස්වලට ආපසු දවසෙ අදලා ම තාත්තා මට හැම දා ම කියනවා කොහොම හරි කරලා ඉන්නකෝ ටීම් එකට සෙල්ලම් කරන්න කියලා. මං හරියට උත්සාහ කෙරුවා. ඒත් බැරි වුණා. මට ටීම් එකේ සෙල්ලම් කරන්න හම්බ වුණා කියලා දැන ගත්ත ගමන් ම තාත්තා කිව්වා තාත්තට ඒක හීනයක් සැබෑ වුණා වගේ කියලා. මොනවා තිබුණත් තාත්තා වරද්දන්නේ නැතුව ම මං තිස්ලින් ටීම් එක්ක ගහන මැච් එක බලන්න එනවා කිව්වා. තාත්තා හිතන්නේ මං ටිකක් පසුවෙලා සෙල්ලමට දක්ෂ වෙන විදිහේ කෙනෙක් කියලා. ඒ නිසා මෙතන මගේ ක්‍රීඩා ජීවිතේ පටන් ගැනීම විතරයිලු..." ඔහු තදින් කලකිරී සිටියේ ය. "ඇත්තට ම ජූලියන් මට තාත්තා ගේ හිත රිද්දන්න බයයි."

ජූලියන් ඔහු ගේ කොළ පාට දිදුලමින් ඇස් ඔහු පසින් වාඩි වී සිටින ළමයා ගේ සියුමැලි, විශාල රතු පාට අත් දෙසට යොමු කර ගෙන සිටියේ ය.

"තාත්තා සතුටු වෙන එකක් නැද්ද ඔයා ඉගෙන ගන්න ශිෂ්‍යත්වයක් දින්නා කියලා ඇහැව්වා ම?" ඔහු සැක සහිත ලෙස ඇසුවේ ය. රොජර් හිස සැලුවේ ය. ඔහු සිටියේ බර කල්පනාවක ය.

"තාත්තා හිතන්නේ ස්පෝර්ට්ස් තමා වැඩිය වැදගත් කියලා. තාත්තාට දැන් සෙල්ලම් කරන්න වයස වැඩියි. එයාට ඒක මං ලව්වා කර ගන්නයි ඕන. ශිෂ්‍යත්වේ ගැන තාත්තා දැනටමත් දන්නවා. මේ පාර තාත්තා රට යන්න ටිකකට කලින්යි ආරංචිය හම්බ වුණේ."

"ඔයාට දුක හිතෙන්නැති." ජූලියන් ඉතා අවංකභාවයෙන් වචන ගැළපුවේ ය. "ටීම් එකේ නැත නැති වුණා ම."

"දුක! ඒක හරියට නපුරු හීනයක් වගේ!" රොජර් කිසි බියක් නොමැති ව විස්මයෙන් කීවේ ය. "මට තාත්තාට කියන්න විදිහක් තිබුණේ නෑ. එහෙනම් තාත්තා

ඇමෙරිකාවට ගිහින්. ඔයාට තේරෙනවනේ. මට කොහෙත් ම විදිහක් තිබුණේ නෑ, තාත්තා අද එන එක නවත්තන්න...."

රොජර් හදිසියේ යමක් මතක් වූවා සේ කතාව නතර කර ගත්තේ ය. තමා ඕනෑවටත් වඩා කතා කර ඇතැයි ඔහුට සිතිණි.

ජූලියන් කිසි ම වෙනසක් නො පෙන්වා නොසෙල්වී සිටියේ ය. නමුත් 'ඇමෙරිකාව' යන වචනය ඔහු තුළ හදිසි ගැස්මක් ඇති කළේ ය. එහෙනම් රොජර් ගේ තාත්තා බිස්නස් වැඩවලට ඇමෙරිකාවටයි ගියේ?

රොජර් අමාරුවෙන් බංකුවෙන් නැගිට්ටේ ය.

"එහෙනම් කතා කළා ඇති. මට මෙතැන දවසෙ ම වාඩි වෙලා ඔයා ගේ පලතුරු ගම් කතා ඉන්න බැහැ. පුළුවන් ද මට ජූලියන්" ඔහු ඉතා උනන්දුවෙන් කීවේ ය. ඔහු සාක්කුවට අත දමා එය සෝදිසි කළේ ය.

"මෙන්න කන්න ක්‍රිස්පි එකක්. මේවා හොඳ ම ජාතියෙ. තාත්තා මෙහාට එනකම් තියෙන අන්තිම එක මේක."

ඔහු කඩන ලද ක්‍රිස්පි පැකට්ටුවක් ජූලියන්ට දිගු කළේ ය. ජූලියන් එදෙස බලා සිටියේ ය. එහි ඉදිරිපස 'Southern favorits' යනුවෙන් ලියා තිබිණි.

"මට සමාවෙන්න රොජර්!" ඔහු වේගයෙන් කීවේ ය. ඔහුට ඇත්තට ම රොජර් ගැන දුක සිතිණි. "මට සමාවෙන්න. ඒ වුණාට මං හිතුවා හරි. ඔයා මට ක්‍රිස්පි දෙන්න කලින් ඉඳලා මට ඒක හිතුණා!"

ජූලියන් ඊට ම සමාන වූ නමුත් පොඩි වූ, ඉරුණු ක්‍රිස්පි පැකට්ටුවක් සාක්කුවෙන් පිටතට ගත්තේ ය. මෙතරම් දවසක් ඔහු එය ඉතා පරිස්සමෙන් තමා ළඟ තබා ගෙන තිබිණි. "ඔයා අතින් මේක මිස් බෙන්ට් ගේ කාර් එක ළඟ වැටුණා නෙ. ඒ කියන්නේ ඔයා පැට්‍රික් ගේ වෙනිස් රූකාව එක ඩිකියේ හංගපු වෙලාවෙ. ඊට පස්සේ ඒක හරි ගියේ නැති වුණා ම, හංගබල්ලොත් එක්ක ඔයා එයාට විහිළුවක් කරන්න ලෑස්ති වුණා. පැට්‍රික් හිතුවේ මේ ඔක්කොම කළේ එලිසබෙත්



කියලා. ඒක තමයි එයාට අවවර කරන ගියේ. ඒ නිසා ම තමයි ඔයාට ටීම් එකේ ආපසු තැන හම්බ වුණේ. අද සෙල්ලම් කරන්න ඕන පැට්‍රික්. ඔයා නෙමෙයි. එහෙම නේද රොජර්?"

රොජර් බලාපොරොත්තු විරහිත ලෙස සුසුමක් හෙළමින් ලී බංකුව මත නැවත වාඩි වූයේ ය. ඔහු බලවත් වේදනාවකින් පසු වූයේ ය.

ඔහු අත් තුළ මුහුණ ඔබා ගත්තේ ය.

"මගේ තාත්තා එනවා!" ඔහු කෙඳිරි ගෑවේ ය. "තාත්තා ඉක්මනට ම මෙහාට එයි! තාත්තා ඇමෙරිකාවේ ඉඳලා මෙහාටමයි එන්නේ. අනේ මාව අල්ලලා දෙන්න එපා." ඔහු අයැද්දේ ය. "මං අවංක ව ම හිතා ගෙන හිටියේ වාරේ මැද නිවාඩුවෙන් පස්සේ ඔක්කොම විස්තරේ රැස්වීමට කියන්න. අනේ ජූලියන් ඊළඟ රැස්වීමේ දී මං මේක පිළිගන්නම්. මං පොරොන්දු වෙනවා. ඒ වුණාට අද මැච් එකට මට සෙල්ලම් කරන්න දෙන්න."

"මං ගිහින් එලිසබෙත් එක්ක කතා කරන්න ඕනි ඊට කලින්." ජූලියන් කීවේ ය. ඔහුට කිසිවක් සිතා ගැනීමට නො හැකි වී තිබිණි. "අපි දෙන්න ම තීරණය කරන්න ඕනි."

"අනේ කරුණාකරලා මට අද සෙල්ලම් කරන්න දෙන්න!" ජූලියන් ආපසු හැරී ඇවිද යද්දී රොජර් බැගෑපත් වුණේ ය.

එලිසබෙත් කීවේ නාස්ති කිරීමට කාලයක් වත් නොමැති බවත් ඔවුන් ඉක්මනින් ප්‍රධාන ශිෂ්‍ය නායකයා සහ නායිකාව සොයා ගොස් මේ ගැන ඔවුන්ට දන්වා ඔවුන් ගේ අදහස දැන ගත යුතු බවත් ය. මෙය ඔවුන්ට ගත නො හැකි බරපතළ තීරණයකි.

විලියම් හා රීටා කිසි දු පැකිලීමකින් තොර ව අවසන් තීරණය ගත්හ.

"මේ වෙච්ච හැම දෙයක් ම හරි ම කනගාටුදායකයි." රීටා කීවේ ය. "කොහොමටවත් රොජර්ට අද සෙල්ලම්

කරන්න දෙන්න බෑ. එයා වැරදි ගොඩක් කරලා තියෙනවා. අපි මේ තීරණේ මේ වෙලාවේ ගත්තෙ නැත්නම් ප්‍රශ්නෙ කවදා වත් විසඳෙන්නේ නෑ. ඒක තවත් දිග් ගැස්සෙන එක විතරයි වෙන්නේ. ඉස්සරහට මීටත් වඩා ලොකු ප්‍රශ්න ඇති වෙන්න පුළුවන්?"

"එයා ගේ තාත්තා බලාපොරොත්තු වෙයි ඊළඟට යන ඉස්කෝලෙත් ටීම් එකට සෙල්ලම් කරයි කියලා." විලියම් එකඟ වෙමින් කීවේ ය. "දැන් විසඳුවේ නැත්නම් මේ ප්‍රශ්නේ දිගට දිගට ඇදිලා යයි. මිස්ටර් මුවුන් ඇත්තට මුණ දෙන්න ඕන. එයා ක්‍රීඩාවට දක්ෂ වීරයෙක් වුණාට ඒක රොජර් ව දක්ෂයෙක් කරන්නේ නෑ. එයා ගේ දක්ෂකම් තියෙන්නේ වෙන පැත්තක. එයා නිර්භීත වෙලා තාත්තට ඇත්ත කියන්න ම ඕන."

ඔවුන් ඒ ගැන සාකච්ඡා කරද්දී, ටෙනිස් පිට්ටනියේ සිටි රොජර් ද ඒ තීරණය ම ගෙන තිබුණි.

අවසිහියෙන් ඔහු පාසලේ ගේට්ටුව දෙසට ඇවිද යන්නට පටන් ගත්තේ ය. ඔහු ගේට්ටුව අසලට වී තාත්තා එන තෙක් බලා හිඳ, ආ විගස සියල්ල ඔහුට පවසා තමා ව එවෙලේ ම ගෙදර ගෙනෙන ලෙස කියනු ඇත.

විලියම් රොජර් ව සොයා යෑමට කාමරයෙන් පිට වන්නට හැදුවා පමණි. ඉතා භයානක හඬක් ජනේලය තුළින් පැමිණියේ ය.

රළු තළා හඬක් - වේගයෙන් තිරිංග තද වන හඬක් වේදනාත්මක කෑ ගැසීමත්.

ඔවුන් සියල්ලෝ ම එළියට දිවූහ.

හැඩිදැඩි සිරුරකින් යුත් පුද්ගලයෙක් පාසලේ ගේට්ටුව අසල පිරිමි ළමයෙකු ගේ අප්‍රාණික සිරුරක් ළඟ දණ ගසා ගෙන සිටියි. ඔහු වේගයෙන් රිය පදවා ගෙන පැමිණ තිබුණි. තරඟයේ සිටි ම කොටසක් අත්නොහැර බැලීමට තිබූ කලබලය නිසා ගුවන් තොටුපළේ සිට ම වේගයෙන් රිය පදවා ගෙන පැමිණ තිබුණි.



"ඒ රොජර්!" ඔහු මවුන්ට ඉතා භීතියෙන් කෑ ගැසුවේ ය.

"මගේ ම දරුවා. මං මගේ ම දරුවා ව [illegible] හැප්පුවා."

ඔවුන් සියල්ලන් ම ළමයා ගේ සිරුර වටා දණ ගසා ගත් අතර ටීටා, මෙට්‍රන් හමු වීමට දිවුවා ය.

"අයියෝ, එයාට මොකුත් වෙන්න දෙන්න එපා. එයාට මොකුත් වෙන්න දෙන්න එපා!" රොජර් ගේ පියා එය ම දොඩවන්නට වූයේ ය. "එයාට මොනවා වෙලා ද මන්දා? සිහිවිකල්ලෙන් වගේ වාහනේ ඉස්සරහට ම ඇවිද ගෙන ආවා. මට හදිස්සියට නවත්තගන්න බැරි වුණා..."

"එයා හරි ම දුකෙන් හිටියෙ සර්." එලිසබෙත් ඉතා සෙමින් කීවා ය. "දන්නවා ද එයා දැන ගෙන හිටියා අද බැරි එකට සෙල්ලම් කරන්නේ එයා නෙමෙයි වෙන ළමයෙක් කියලා. එයාට වඩා දක්ෂ ළමයෙක්. ඒ නිසා එයා ටීම් එකේ තැන ගන්න හොරා කළා. ඒත් ඒ ඔක්කොම එයා කළේ එයා වෙනුවෙන් නෙමෙයි, එයා ගේ තාත්තා වෙනුවෙන්."

"මං වෙනුවෙන්?" මිස්ටර් මුවුන් ඇසුවේ ය. ඔහු සිටියේ තම පුතු ගේ හිස අතගාමින් ය.

"රොජර් දන්නවා ඔයාට එයා ව ස්පෝර්ට්ස්වලට දක්ෂයෙක් කරන්න ඕන කියලා." ජූලියන් කීවේ ය. "එයාට ටීම් එකේ තැන නැති වුණ එක දරා ගන්න බැරි වුණා. ඊටත් වැඩියෙන් තාත්තා ගේ බලාපොරොත්තු සුන් වෙන එක එයාට දරා ගන්න බැරි වුණා!"

"මං මහ මෝඩයෙක්!" රොජර් ගේ පියා අවසානයේ කීවේ ය "දෙයියනේ, එයාට මොකුත් වෙන්න දෙන්න එපා!"

එවිට ම මෙට්‍රන් එතැනට පැමිණියා ය.

"ඇම්බියුලන්ස් එකකට කතා කරන්න ද?" රොජර් ගේ පියා භීතියෙන් ඇසී ය.

මෙට්‍රන් සියල්ලන් ම පිටුපසට කර රොජර් ගේ හෘද ස්පන්දනය බැලී ය. ඉන් පසු සැනසුම් සුසුමක් හෙළා ඔවුන් අය දෙස බැලුවා ය.

"හාඩ් ස්පන්දනය හොඳයි." ඇය කීවා ය. "ඇගේ ඇට බිඳීමක සලකුණක් වත් නෑ. මං හිතන්නෙ ඔළුව තදට බිම වැදුණා ඇති. කම්පනේට සිහිය නැති වෙලා. දැන් එයාට සිහිය එයි."

ඇය කතා කර අවසන් වෙද්දී ම, රොජර් ගේ සිරුර සෙලවිණි. ඔහු වරක් දෙවරක් වේදනාවෙන් කෙඳිරි ගෑ අතර සෙමින් ඇස් ඇරියේ ය. එවිට ම ඔහු දුටුවේ පියා තමා දෙසට නැමී මුහුණ දෙස බලා සිටින අයුරු ය.

"තාත්තේ, මං මෝඩ විදිහට හැසිරුණා. මං ඔයා ගේ බලාපොරොත්තු නැති කළා. මට සමා..."

"ෂ්... ෂ්." රොජර් ගේ පියා සතුටින් කීවේ ය. ඔහු ගේ නළල අතගාමින් ඔහු ව සැනසී ය. "ඒ ගැන ඔක්කොම මං දන්නවා. මමයි මෝඩ විදිහට හැසිරුණේ. ඒ වුණාට මං පොරොන්දු වෙනවා, රොජර් ඉස්සරහට මේ හැම දෙයක් ම ඊට වඩා වෙනස් වෙනවා කියලා."

ටෙනිස් ඇඳුම්වලට මාරු වී, විශේෂ පිත්ත ද සොයා ගෙන, කණ්ඩායමේ හිඩැස පිරවීමට පැට්‍රික්ට යන්නම් වෙලාව ඉතිරි ව තිබිණි. පැට්‍රික්ට කණ්ඩායමට ක්‍රීඩා කිරීමට අවස්ථාව ලබා ගැනීමට එලිසබෙත් මිස්ටර් ජෝන්ස්ට බැගෑපත් වූවා ය.

නැවතත් කණ්ඩායමට ක්‍රීඩා කිරීමට ලැබීම ගැන පැට්‍රික් සතුටු වූයේ ය. නමුත් රොජර් මුවුන් හදිසි අනතුරකට මුහුණ දීම නිසා පරීක්ෂාවක් කර ගැනීමට රෝහලට ගිය බව දැන ගත් ඔහු කම්පාවට පත් වූයේ ය. මේ දුෂ්ටකම් සියල්ල පිටුපස සිටියේ රොජර් මුවුන් බව දැන ගත් ඔහු විස්මයට පත් වූයේ ය. නමුත් ඒ කිසිවක් හා එලිසබෙත් සම්බන්ධ නො වීම ගැන ඔහුට සතුටු සිතිණි.

"එහෙනම් එයා මට ඇත්තට ම අකමැති නෑ!" පැට්‍රික් තමාට ම කියා ගත්තේ ය.

වයිට්ලීෆ් පාසල හික්ලින් පාසල පරදවා ජය ගත් අතර පැට්‍රික් ඉතා හොඳින් ක්‍රීඩා කර තිබිණි. ඔහු පිටියෙන් පිටතට එද්දී උස් ඔල්වරසන් නාදයක් පැතිර යන්නට විය. ඔහු නිසා



කණ්ඩායමට ජය හිමි වූ බව සියල්ලෝ ම පිළිගත්හ. පැට්‍රික් එලිසබෙත් අසලට ඇවිද ගොස් සියල්ලන්ට ම පෙනෙන පරිදි ඇය වැළඳ ගත්තේ ය.

"මං දුෂ්ට විදිහට හැසිරුණාට ඔයා මට සමාව දෙනවා නේද එලිසබෙත්?" ඔහු ලැජ්ජාශීලී ව ඇසී ය. "[illegible] වෙලා මගේ රැකට් එක හොයලා දුන්නා. පුදුමයි මිස් [illegible] ගේ වාහනේ ටිකිය ඇරිලා තියෙනවා ඔයා දැක්ක එක. ඔයා එක දැක්කෙ නැත්නම් මට ටීම් එකේ සෙල්ලම් කරන්න හම්බ වෙන්නේ නැහැනේ. එහෙනම් මේ හැම දෙයක් ම වෙනස් වෙනවා." [illegible] කෝපයෙන් බලා සිටියා ය. 'ඇයි හැම තිස්සෙ ම [illegible] හැමෝම එලිසබෙත්ට ම කැමති වෙන්නෙ?'

එලිසබෙත් හිරු එළිය යට හිටගෙන සැනසුම් සුසුමක් හෙළුවා ය. වාරය මැද වන තෙක් වයිට්ලීෆ්වල සිටීමට ලැබීම ගැන ඇය සතුටු වූවා ය. මුළු ලෝකෙත් ම තිබෙන හොඳ ම ඉස්කෝලේ වයිට්ලීෆ් තමයි.

ජෝන් ටෙරීට උදවු කිරීමට තමා ගත් උත්සාහය ඇයට මතක් විය. අවසානයේ දී ඔහු විදි කුසලානය දිනා මුළු පාසල ම පුදුමයට පත් කළේ ය. ඒ ඇය ගේ කිසි ම උදව්වක් නොමැති ව ය. නමුත් පොරොන්දු වූ ආකාරයට ම [illegible] රැකීමට නැති වීම ගැන ඇයට ආඩම්බර සිතුණි.

ඇය ඇත්තට ම උදවු කළේ පැට්‍රික්ට ය. එයත් වුණේ අහම්බෙනි!

නමුත් ඇය තමන් නො දන්නා කාරණය නම් රොජර් ටෙනිස් පිත්ත වාහනයේ ටිකියේ සැඟවීමට [illegible] යන්න ය. එය යමින් සැඟවීමට අසාමාන්‍ය [illegible] ඇයට දැන ගන්නට ලැබුණේ රොජර් එය [illegible] සැඟවීමට අදහස් කර තිබුණත් මිස්ටර් [illegible] එතැනට පැමිණීම නිසා. ඔහු කලබලයට [illegible] වාහනයක ටිකිය තුළට එය විසි කර [illegible] බව ය!

නමුත් එලිසබෙත්ට කිසි දිනක දැන ගන්නට නො ලැබුණු කාරණයක් ද විය. එනම් ඇය සොෆියාට කියා දුන් ප්‍රංචි සින්දුවේ වූ 'හංබෙල්ලෝ, ගොළුබෙල්ලෝ, බලු නකුටෝ වගේ තමයි ප්‍රංචි පැට්‍රික් වගේ තමයි ප්‍රංචි පැට්‍රික්' යන කොටස රොජර් ගේ අසාර්ථක වූ 'ටෙනිස් ටින්' උපක්‍රමයට අදහස් ලබා දුන් බව. සොෆියා හා ඇගේ යෙහෙළියන් ලණු පැනීමේ දී එය ගයනු රොජර්ට දිනක් ඇසී ඇති අතර එයින් ඔහුට ඒ අදහස පහළ වී තිබුණි.

දඟමල්ල සමග කොයි තැනක සිටියත්, මේ වාගේ අපූරු සිදුවීම් වීම නම් අරුමයක් නො වේ!!!

www.sinhalaelibrary.com